# සාමාජවාදය මනෝරාජ්‍යයෙන් විද්‍යාවට

**ෆෙඩ්රික් එංගල්ස්**

මාක්ස්වාදීන්ගේ අන්තර්ජාල ලේඛනාගාරය

## "සමාජවාදය-මනෝරාජ්‍යයෙන් විද්‍යාවට" යන පොතෙහි ඉංග්‍රීසි සංකරණයට විශේෂ හැදින්වීම[1]

මෙම කුඩා පොත මුලින් මීට වඩා විශාල පොතක එක කොටසක් විය. බර්ලින් විශ්ව විද්‍යාලයේ ආගන්තුක කථිකාචාර්ය වරයෙකුව සිටි ආචාර්ය ඊ. ඩූරිං තමා සමාජවාදය වැළඳගත් බව හදිසියේම සහ තරමක ගාල ගෝට්ටියක් සහිතව ප්‍රකාශයට පත් කර එයින් නොනැවතී ජර්මන් ජනතාව වෙත විස්තරාත්මක සමාජවාදී න්‍යායයක් පමණක් නොව සමාජය ප්‍රතිසංවිධානය කිරීම සදහා අංග සම්පූර්ණ ප්‍රායෝගික සැලැස්මක්ද ඉදිරිපත් කළේය. අපේක්ෂා කළ හැකි පරිද්දෙන්ම ඔහු ඔහුගේ පූර්වගාමීන්ට පටහනි වුයේය. අන් සියල්ලටම වඩා ඔහුගේ කෝපාග්නියේ මළු තාපයම මාක්ස් වෙත එල්ල කිරීමෙන් හේ මාක්ස් වෙත එල්ල කිරීමෙන් හේ මාක්ස්ට ගෞරව කළේය.

මෙය සිදුවුයේ ජර්මන් සමාජවාදී පක්ෂයේ කොටස් දෙකක් වු ඊසනාක්වාදීන් සහ ලසාල්වාදීන් ඒකාබද්ධ වීමත්[2] එමගින් ඔවුන්ගේ ශක්තිය විශාල වශයෙන් වර්ධනය කරගැනීමත් ඊටත් වඩා පොදු සතුරාට විරුද්ධව ඔවුන්ගේ මුළු ශක්තිය යෙදීමේ හැකියාව ඇති කරගැනීමත් සිදුවු වකවනුවේම මෙනි ජර්මනියේ සමාවාදී පක්ෂය සීඝ්‍ර ලෙස මහත් බලවේගයක් බවට පත්වෙමින් තිබුණේය නමුත් එහි බලයතහවුරු කිරීම පිණිස ඉටු විය යුතු ප්‍රථම කොන්දේසිය වුයේ අළුතෙන් දිනාගත් සමගිය විනාශවිය. නොදී රැක ගැනීමය. ඒ අතර ආචාර්ය ඩූරිං තමන් වටා නිකායක් ගොඩ නැගීමට විවෘත ලෙසම කටයුතු කරගෙන ගියේය. ඒ අනුව අප කැමති වුවත් නැතත්, අප වෙත දමා ගසන ලද සටන් අභියෝගය පිළිගැනීම අවශ්‍ය විය.

එසේ වුවද, මෙය අති දුෂ්කර නොවුවත්, පැහැදිලිවම පෙනෙන පරිදි දිග්ගැස්සෙන කාර්යයකි. කවුරුත් දන්නා පරිදි ජර්මන්වරුන් වන අපි ඉතාමත් බරපතළ Gründlichkeit නැතහොත් උන්නතිකාමී මහාර්ථයක් හෝ මහාර්ථතා උන්නතිකාමීත්වයක් ඇත්තෝ වෙමු. මේ දෙකෙන් ඔබ සුදුසු යයි හැගෙන දෙයක් ගැන විස්තර විභාග දක්වන කල, ප්‍රථමයෙන්ම එය සියල්ල අන්තර්ගත ක්‍රමයක් වන ආකාරයට එය පැහැදිලි කර දැක්වීමට සිදුවේ තර්ක විද්‍යාවේ මුල් ප්‍රතිපත්ති හා විශ්වයේ මුලික න්‍යායයන් යන දෙකම සදා කල්හිම පැවති බව ඔප්පු කිරීමට ඔහුට සිදුවේ. ඔහුට එය කරන්නට සිදු වුයේ අන් කාර්යයක් නොවේ. ආන්තික වශයෙන්, අළුතෙන් සොයාගත් මුදුන් මල් කඩක් බදු න්‍යාය වෙත ලගා වීම සදහාය. මේ අතින් බලන කල්හි ආචාර්ය ඩූරිං ජාතික මට්ටමට ඉතා මැනවින් ගැලපෙන සේ කටයුතු කර ඇත. ඔහු ඉදිරිපත් කර ඇත්තේ මානසික, සාද්‍රාචාරය පකෘතිමය සහ ඓතිහාසිය දර්ශන ඇතුලත් සම්පූර්ණ "දර්ශනවාද ක්‍රමයක්" ද, අවසාන වහයෙන් "දේශපාලන අර්ථ ශාස්ත්‍ර සහ සමාජවාදී ක්‍රමයක්" ද, අවසාන වශයෙන් "දේශපාලන අර්ථ ශාස්ත්‍රය පිළිබද විවේචනාත්මක ඉතිහාසයක් " ද ඇතුලත්, අනුන න්‍යායයකි. එය අටෙන් එක ප්‍රමාණයේ වෙළුම් තුනකින් යුක්ත වන අතර බාහිර හා නෛසර්ගික බරෙන් යුක්තය. පූර්වගාමී දර්ශනවාදීන් සහ අර්ථ ශ්‍රාස්ත්‍රඥයන් සියලු දෙනාටම විරුද්ධව පොදු වශයෙන්ද, මාක්ස්ට, විරුද්ධව විශේෂයෙන්ද, මෙහෙයවන ලද තර්ක නැමති යුද්ධ හමුදා තුනකි. ඇත්තෙන්ම මෙය නම්, අංග සම්පූර්ණ "දේශපාලන අර්ථ ශාස්ත්‍ර සහ සමාජවාදී ක්‍රමයක්" ද, අවසාන වශයෙන් "දේශපාලන අර්ථ ශාස්ත්‍රය පිළිබද විවේචනාත්මක ඉතිහාසයක්" ද, අතුලත්, අනූ න්‍යායයකි. එය අටෙන් එක ප්‍රමාණයේ වෙළුම් තුනකින් යුක්ත වන අතර බාහිර හා නෛසර්ගික බරෙන් යුක්තය. පූර්වගාමී දර්ශනවාදීන් සහ අර්ථ ශාස්ත්‍රඥයන් සියලු දෙනාටම විරුද්ධව පොදු වශයෙන්ද, මාක්ස්ට විරුද්ධව පොදු වශයෙන්ද, මාක්ස්ට

විරුද්ධව විශේෂයෙන්ද, මෙහෙයවන ලද තර්ක නැමති යුද්ධ හමුදා තුනකි. ඇත්තෙන්ම මෙය නම්, අංග සම්පූර්ණ "විද්‍යා විප්ලවයක්" කිරීමට දරන ලද ප්‍රයත්නයකි. මා පිළිතුරු සැපයිව යුතුව තිබෙන්නේ මේ සියල්ලටමය. කාලය සහ අවකාශය පිළිබද සංකල්පයන්ගේ පටන් ද්විලෝහ මුදල් ම්ම්ම[3] දක්වා වූද, ද්‍රව්‍යයේ සහ චලනයෙහි සදාකාලිත්වයේ පටන් සදාචාර අදහස් වල නශ්‍ය ස්භාවය දක්වාද ඩාවින්ගේ ස්භාවික වර්ණියතා න්‍යායෙහි පටන් අනාගත සමාජයේ යෞවනයන් ශික්ෂණය කිරීම දක්වාද වූ, තිබිය හැකි සෑම සියලු මාතෘකාවක්ම ගැන කරුණු දැක්වීමට මට සිදුවිය. කෙසේ හෝ වේවා මගේ ප්‍රතිපාක්ෂිකයා ක්‍රමාණුකූල අංග සම්පූර්ණත්වයකින් කරුණු ඉදිරිපත්කර ඇති හෙයින්, පෙරට වඩා, වඩාත් ඒකාබද්ධ ආකාරයකින් විස්තර කර දැක්වීමේ අවස්ථාවක් ඔහු මට සලසා දුන්නේය. වෙනත් ලෙසකින් ගතහොත් අකෘතඥයයි කිව හැකි මෙම කර්තව්‍යය භාරගැනීමට මා පෙළඹවූ ප්‍රධාන හේතුව එයයි.

මගේ පිලිතුර ප්‍රතමයෙන්, සමාජවාදී පක්ෂයේ ප්‍රධාන පත්‍රය වන ලයිප්සිග් Vorwärts පත්‍රයෙහි ලිපි පෙළක් වශයෙන්ද, පසුව "Herrn Eugen Dühring Umwälzung der Wissenschaft (ඊ. ඩූරිං මහතාගේ විද්‍යා විප්ලවය)" යන පොත වශයෙන්ද පළ කරන ලදී. එම පොතෙහි දෙවන සංස්කරණය 1886 දී සුරික් හිදී පළ කරන ලදී.

ප්‍රංශ මන්ත්‍රී මණ්ඩලයේ ලීල් කොට්ඨාශය දැනට නියෝජනය කරන, මා මිත්‍ර පෝල් ලාෆාර්ග්ගේ ඉල්ලීම අනුව මා මෙම පොතෙන් පරිච්ඡේද තුනක් පොත් පිංචක් වශයෙන් සකස් කළෙන්, ඔහු එය පරිවර්තනය කර 1880 දී "මනෝරාජික සමාජවාදය සහ විද්‍යාත්මක සමාජවාදය" යන නම ඇතිව පළ කළේය. එම ප්‍රංශ පිටපත අනුව පෝලන්ත සහ ස්පාඤ්ඤ සංස්කරණයන් සකස් කරන ලදී. 1883 දී අපගේ ජර්මන් මිත්‍රයෝ මුල් භාෂාවෙන් එම පොත් පිංච පළ කළහ. ඉන් පසුව ජර්මන් පිටපත පදනම් කරගෙන ඉතාලි, රුසියන්, ඩැනිෂ්, ලන්දේසි සහ රුමේනියානු පරිවර්තන පළ කර ඇත. ඒ අනුව මෙම ඉංග්‍රිසි සංස්කරණයත් සමග දැන් මෙම කුඩාපොත භාෂා දහයකින් ප්‍රචාරය වන්නේය. මෙතරම් නිරන්තර ලෙස පරිවර්තනය කරනු ලබන වෙනත් සමාජවාදී කෘතියක් ගැන මම නොදන්නෙමි. 1848 "කොමියුනිස්ට් ප්‍රකාශනය" හෝ, මාක්ස්ගේ "ප්‍රාග්ධනය" හෝ වුවද මෙතරම් නිරන්තර ලෙස පරිවර්තනය කරනු නොදක්නා ලදී. ජර්මනියෙහි, මෙම පොතෙන් මුළු පිටපත් ගණන 20,000 ක් පමණ වූ සංස්කරණ හතරක් පළ වී ඇත.

"දී මාර්ක්"[4] නැමති උප ග්‍රන්ථය ලියන ලද්දේ ජර්මනියේ වතුකාර දේපළවල ඉතිහාසය සහ සංවර්ධනය ගැන මුලික දැනුමක් ජර්මන් සමාජවාදී පක්ෂය තුළ පතුරුවා හැරීමේ අදහස ඇතිවය. නාගරික කම්කරු ජනතාව එම පක්ෂය වෙත ඇද ගැනීම බොහෝ දුරට සම්පූර්ණ වෙමින් තිබුණු, එමෙන්ම කෘෂිකාර්මික කම්කරුවන් හා ගොවිජනයා හා සම්බන්ධයෙන් කටයුතු කිරීම අවශ්‍යව තිබුණු වකවාණුවක මෙය ඉතාමත් අවශ්‍ය දෙයක් ලෙස පෙනී ගියේය. ජර්මන් ගෝත්‍රවලට පොදුවූ මුල් ඉඩම් බුක්ති ආකෘති සහ ඒවායේ අභාවය පිළිබද ඉතිහාසය ගැන එංගලන්තයෙහි ඇති ප්‍රසිද්ධිය ජර්මනියටත් වඩා අඩු නිසා මෙම උපග්‍රන්ථය පරිවර්තනයට ඇතුළත් කර තිබේ. මාර්ක් සමාජයෙහි සාමාජිකයන් අතර කෘෂි ඉඩම් හා තණ බිම් බෙදාවෙන්කර ගැනීමට පෙර, ( දැනුදු පවතින ස්ලවෝනියානු සද්රුගා සමාජයෙන් නිදසුන් දෙන පරිදි) ඒවා පරම්පරා ගණනාවක් ඔස්සේ විහිද ගිය විශාල පිතෘ මුලික පවුලක් විසින් ඒකාබද්ධ ගිණුම් පිළිවෙළේ කළමණාරණය මගින් එය මෙහෙයවා ගත නොහැකි තත්වයට පත් වූ පසු බෙදා වෙන් කර ගැනීම සිදු වූ බවත් කියමින් මක්සිම් කවලේස්කි මෑතදී ආරම්භ කළ කල්පිතය ගැන සදහන් නොකරම, මුල් පොතෙහි ඇති ලෙසටම පරිවර්තනයෙහිද පෙළ තිබෙන්නට හැරියෙමි. සමහර විට කවලේස්කිගේ මතය සම්පූර්ණයෙන්ම නිවැරදි විය හැකි නමුත්, මෙය තවමත් Sub judice(තවමත් නිශ්චය නොවූ - සංකාරක.) ලෙසට පවතී.

මෙම පොතෙහි අළුත් ආර්ථික යෙදුම් ඇතොත් ඒවා යොදා තිබෙන්නේ මාක්ස්ගේ "ප්‍රාග්ධනය" කෘතියෙහි ඉංග්‍රිසි සංකරණයෙහි එන යෙදුම්වලට සමානවය. නිෂ්පාදකයන්ගේ ප්‍රයෝජනය සඳහා පමණක් නොව හුවමාරුවද අරමුණු කරගෙන, නැතහොත්, භාවිත වටිනාකම් වශයෙන් නොව, වෙළඳ භාණ්ඩ වශයෙන් නිෂ්පාදනය කරන කල, එය විසුතර කිරීමට අපි "වෙළඳ භාණ්ඩ නිෂ්පාදනය" යන වාක්‍ය ඛණ්ඩය යොදන්නෙමු. හුවමාරුව සඳහා වූ නිෂ්පාදනයේ මුල් ආරම්භයේ පටන් වර්තමාන කාලය දක්වාම මෙම අදියර විහිද යන්නේය. එය පුර්ණ වර්ධනයට පත් වන්නේ, ධනපති නිෂ්පාදනය යටතේ පමණකි. එනම්, ස්වකීය ශ්‍රම ශක්තිය හැර වෙනත් නිෂ්පාදන මාර්ග අහිමි ශ්‍රමිකයන්, නිෂ්පාදන මාර්ගවල හිමිකරුවා වන ධනපතියා විසින් වේතන සඳහා වැඩෙහි යොදවනු ලබන්නා වූද, ඔහුගේ ආයෝජනය ඉක්මවන නිෂ්පාදිතයේ අළෙවි මිළ අතිරික්තය ඔහු විසින් සාක්කුවේ ලාගනු ලබන්නා වූද කොන්දේසි යටතේ පමණකි. අපි මාධ්‍ය කාලීන සමයෙන් ඉක්බිති කාර්මික නිෂ්පාදනයේ ඉතිහාසය කාල පරිජේද තුනකට බෙදන්නෙමු. 1) හස්ත කර්මාන්තය, මෙම ක්‍රමය යටතේ සෑම ශ්‍රමිකයෙක්ම සම්පුර්ණ භාණ්ඩයක් නිපදවයි. 2) භාණ්ඩ තැනීමේ කර්මාන්තය, එක විශාල ආයතනයක් තුළ කණ්ඩායම් ගතවුනු කම්කරුවන් විශාල සංඛ්‍යාවක් සම්පර්ණ භාණ්ඩය නිපදවති, මෙහිදී ශ්‍රම විභජනයේ ප්‍රතිපත්තිය පදනම් කරගෙන එක් එක් කම්කරුවෙක් නිෂ්පාදිතය අනුගාමී ලෙසින් සියලුම කම්කරුවන්ගේ අත් මගින් ගිය පසු පමණක් එහි නිමැවුම සම්පුර්ණ වන්නේය,3) නවීන කර්මාන්තය, මෙහිදී භාණ්ඩ නිෂ්පාදනය කෙරෙන්නේ බල ශක්තියෙන් ක්‍රියාත්මක කෙරෙන යන්ත්‍ර මගිනි, කම්කරුවාගේ කාර්යය, යාන්ත්‍රික මාර්ගයේ කටයුතු පරිපාලනය කිරීමට සහ නිවැරදි කිරීමට සීමා වන්නේය.

මෙම කෘතියේ සන්ධාරය බ්‍රිතන්‍ය පාඨක මහජනයාගෙන් සැලකිය යුතු කොටසක විරුද්ධත්වයට ලක් වනු ඇතැයි යන්න මම හොඳින් දනිමි. මහා දේශ වාසීන් වන අපි බ්‍රිතාන්‍ය "නම්බුකාරකම" පිළිබඳ දුර්මතයන් කෙරෙහි අල්ප මාත්‍ර හෝ සැලකිල්ලක් දැක්විමු නම්, අප දැනට සිටිනවාටත් වඩා නරක තත්වයකට පත්වන්නට තිබුණි. මෙම පොත අප "ඓතිහාසීය ද්‍රව්‍යවාදය" යනුවෙන් හඳුන්වන දෙය රකියි. එහෙත් "ද්‍රව්‍යවාදය" යන්න බ්‍රිතාන්‍ය පාඨකයන් අති විශාල සංඛ්‍යාවක කනට කෝටු අනින්නා වැනි වචනයකි. "අඥෙයවාදය"[5] ඉවසීමට ඉඩ ඇතත් ද්‍රව්‍යවාදය නම් පිලිගත නොහේ.

නමුත්, එසේ වුවත් දහහත්වැනි ශතවර්ෂයෙන් මෙපිට නවීන ද්‍රව්‍යවාද සියල්ලෙහිම මුල් නිවස වුයේ එංගලන්තයයි.

"ද්‍රව්‍යවාදය" මහා බ්‍රිතාන්‍යයේ ස්වභාව-ජාත පුත්‍රයාය. ද්‍රව්‍යයට සිතීමේ හැකියාව තිබේ දැයි බ්‍රිතාන්‍ය ස්කුල්මන්[6] ඩුන්ස් ස්කෝටුස් දැනටමත් අසා ඇත.

මෙම ප්‍රාතිහාර්ය්‍යය සාර්ථක කිරීම සඳහා ඔහු දෙවියන්ගේ සර්වබලධාරීත්වය පිහිට කොට ගත්තේය. නැතහොත්, ඔහු දේවධර්මය [7] ලවා ද්‍රව්‍යවාදය දේශනා කෙරෙව්වේය. එපමණක් නොව ඔහු නාමමාත්‍රවාදියෙක් [8] ද විය. ද්‍රව්‍යවාදයේ ප්‍රථම ආකෘතිය වන නාමමාත්‍රවාදය ප්‍රධාන වශයෙන් පැතිර පවත්නේ ඉංගිසි විශ්වවිද්‍යාලාචාරීන් අතරය.

ඉංග්‍රිසි ද්‍රව්‍යවාදයේ සැබෑ ආදී කතෘවරයා වුයේ බේකන්ය. ඔහුට ස්භාවික දර්ශනය එකම සත්‍ය දර්ශනවාදය වු අතර, ඉන්ද්‍රියන්ගේ අත්දැකීම පදනම් කරගත් භෞතික විද්‍යාව ස්භාවික දර්ශනයේ ප්‍රධානතම කොටස විය. ආප්තෝක්ති වශයෙන් ඔහු බොහෝ විට සඳහන් කරන්නේ ඇනක්සගෝරස් සහ ඔහුගේ හෝම්යෝමෙරියායි[9]. ගැනත් ඩිමොක්‍රිටස් සහ ඔහුගේ පරමාණු ගැනත්ය. ඉන්ද්‍රියන් නොවරදින සුලු බවත්, සියලු ඥානයෙහි පදනම එය වන බවත්ය. සියලුම විද්‍යාවන් අත්දැකීම මත පදනම් වී ඇති අතර ඉන්ද්‍රිය විසින් සපයන

ලද දන්තයන් තාර්කික විධියේ පරීක්ෂණයට භාජනය කිරීමෙන් සංයුක්ත වේ. එවැනි තාර්කකි විධියක ප්‍රධාන ආකෘති වන්නේ උද්ගමනය, විශ්ලේෂණය සංස්න්දනය, නිරීක්ෂණය සහ පර්යේෂණයයි. ද්‍රව්‍යයෙහි නෛසර්ගික ගුණයන් අතුරෙන් චලිතය ප්‍රථම ස ප්‍රධානය. එහෙත් එය යාන්ත්‍රිකමය හා ගණිතමය ආකාරයේ චලිතය පමණක් නොවේ. ප්‍රධාන වහයෙන්ම ද්‍රව්‍යයේ ආවේගයක, අති ප්‍රධාන ජීවගුණයක, ආතතියක, නැතහොත් යාකොබ් බ්මෙගේ වචනයක් යොදතොත් "ද්‍රව්‍යයේ සංවේදනා" ("Qual"- මෙය වචන වල දර්ශණිකමය බෙදීමකි "Qual" වචනයේ පරිසමාපත්තියෙන්ම ගත් කළ යම් කිසි ක්‍රියාවක් කෙරෙහි පොළඹවන සංවේදනය වේදනාව යන අර්ථය ලැබේ. ඒ අතරම ගුඪ දර්ශනවාදියෙක් වු බේමෙ එම ජර්මන් වචනයට ලතින් වචනයක් වන qualias -ගුණය- නැමති වචනයෙන්ද යමක් එකතු කරයි. ඔහුගේ ("Qual") වචනයෙන් අදහස් වන්නේ බාහිරව ගෙන දෙන වේදනාවක් නොව වස්තුන්ගෙත් සම්බන්ධතාවය නතමහාත් පෞද්ගලකත්වයේත් ස්වයං සංවර්ධනයෙන් පැන නගින ක්‍රියාකාරී ආරම්භය ය.) ආකාරයේ චලිතයද එයට ඇතුලත්ය.

ද්‍රව්‍යවාදයේ ප්‍රථම නිර්මාණකයා වු බේකන්ගේ දර්ශනයෙහි වුවද ද්‍රව්‍යවාදයේ ප්‍රථම නිර්මාණකයා වු බේකන්ගේ දර්ශනයෙහි වුවද ද්‍රව්‍යවාදයේ විවිධ පාර්ශවීය සංවර්ධනයක බීජ අන්තර්ගතවීය. එක් අතකින් ඉන්ද්‍රිය බද්ධ, කාව්‍යමය ස්වභාවයේ අලංකාරයෙන් වටවී තිබෙන ද්‍රව්‍ය, මෝහනීය සිනා රැලිවලින් මිනිසාගේ සමස්ත සර්වාංගයම එය වෙත ඇද ගනී. අනිත් අතට, වියත් භාෂිතයෙන් ගොතා ඉදිරිපත් කර ඇති ධර්මය, දේව ධර්මයෙන් ආනයනය කරගත් අසංසන්දනීයතාවයන්ගෙන් ගහනය.

ද්‍රව්‍යවාදය තවදුරටත් පරිනාම වීමේදී එය ඒක-පාර්ශවීය ස්වභාවයක් ගත්තේය. බේකන්ගේ ද්‍රව්‍යවාදය අනුසන්ධාන කරන තැනැත්තේ හොබ්ස් ය. ඉන්ද්‍රිය සංවේදනා පදනම් කොටගත් ඥානය, එහි කාව්‍ය ස්වභාවී විකසිතය හැර දමා ගණිතඥයාගේ වියුක්ත අත්දැකීම බවට පරිවර්තනය වෙයි. එහිදී ජ්‍යාමිතිය විද්‍යාවන්ගේ රැජිණ වශයෙන් ප්‍රකාශිත වේ. ද්‍රව්‍යවාදය මානව දුවේශයට එළඹෙයි. ද්‍රව්‍යවාදයේ පසමිතුරු, මානව ද්වේශී, ආවේශ රහිත අධ්‍යාත්මවාදයේ ජය භූමියේදීම එය පරාජය කර ජය ලැබීමට නම්, තමන්ගේම ාංශයට වධ දෙමින් දුෂ්කර ක්‍රියාවෙහි යෙදීමට ද්‍රව්‍යවාදයට සිදුවේ. ඒ අනුව එය ඉන්ද්‍රිය බද්ධ ස්වභාවයේ සිට බුද්ධිමය භූතාර්ථයක් බවට පත් වේ. එහෙත්, ඒ අනුවම, එය, බුද්ධියේ ස්වභාව ලක්ෂණ ගත් ප්‍රතිඵල ගැන නොතකාම සම්පූර්ණ සංසන්දනීයතාවයක් විකාශ කරගනී.

බේකන්ගේ අනුප්‍රාප්තිකා හැටියට, හොබ්ස් මෙසේ තර්ක කරයි. මුළු මිනිස් ඥනයම සැපයෙන්නේ ඉන්ද්‍රියන් විසින් නම් විට අපගේ සංකල්පයන් හා අදහස් යනු, ඒවායේ ඉන්ද්‍රිය බද්ධ ආකෘති සහ යථාර්ථ ලෝකයෙන් බාහිර අවතාර පමණක්ම වෙති. එයින් එකකට වැඩි ගණනකට එකම නාමයක් යෙදීමට හැකි වනු ඇත. නාමයන්ගේ නාම පවා තිබෙන්නට පුළුවන. එක් අතකින් අපගේ අදහස් සියල්ලම සංවේදනා ලෝකයෙන් සම්භව වන බව කියන අතරම වචනයක් යනු වචනයක් ඉක්මවා යන දෙයැකයයි නිතරම කීමද අපගේ ඉංද්‍රියයන් මගින් අප දැනගත්, ඒකතාවයක් වන සත්තාවන්ට අමතරව, පොදු ස්වභාවයේ සත්තාවන් පවතින බව කීමද ප්‍රතිවිරෝධයක් ලෙස හැගෙන්නට පුළුවන. දේහමය නොවන වස්තුවක් යනු දේහමය නොවන දෙයක් වැනිම විකාරයකි. දේහය, සත්තාව, වස්තුව යන සියල්ලම එකම යථාර්ථය හැදින්වීමට යොදන විවිධ වදන්ය. සිතන්නා වූ ද්‍රව්‍යයෙන් සිතුවිල්ල වෙන් කිරීම කිසිසේත් කළ නොහැක්කකි. ලෝකයේ සිදු වෙමින් පවතින සියලු වෙනස්කම්වල උපස්ථරය ද්‍රව්‍යයයි. කෙළවරක් නොමැති එකතු කිරීමේ කියාදමයක යෙදීමෙහි අපගේ සිත සමත්යයි කියන්නේ නම් මිස අනන්ත යන වචනයෙහි අර්ථයක් නැත. අපගේ අපගේ සංජානයට හසුවන්නේ ද්‍රව්‍යමය වස්තූන් පමණක් වන හෙයින් දෙවියන්ගේ

පැවැත්ම ගැන අපට කිසිවක් දනගත නොහැකිය. මගේ පැවැත්ම පමණක් ඒකාන්තය. සෑම මිනිස් අභිලාසයක්ම ආරම්භයක් සහ අවසානයක් ඇති යාන්ත්‍රික චලනයකි. ආවේගයට විෂය වන්නේ අප හොදයයි කියන වස්තූන්ය. මිනිසාත් ස්වභාව ධර්මයත් එක සමාන නීතිවලට යටත් වෙති. බලය හා නිදහස සර්ව සම වන්නේය.

"හොබ්ස් බේකන්ගේ දර්ශනය අනුසන්ධානය කළේය. එසේ වුවත් ඔහු එසේ කිරීමේදී බේකන්ගේ මූලික ප්‍රතිපත්තිය වන සියලු මිනිස් ඥානය සම්භව වන්නේ සංවේදනා ලෝකයෙන්ය. යන්න ඔප්පු කිරීමට කරුණු ඉදිරිපත් නොකළේය. මෙය ඔප්පු කරන කරුණු සම්පාදනය කළේ මිනිස් අවබෝධයේ ප්‍රභවය ගැන රචනය ලියූ ලොක් ය.

බේකන්ගේ ද්‍රව්‍යවාදයෙහි වූ ඊශ්වරවාදී[10] බාධකයන් කොලින්ස්, ඩොඩ්වෙල්, කවර්ඩ් හාට්ලි සහ ප්‍රීස්ට්ලි විසින් බිද දමන ලදී. කුමන හෝ තත්වයක් යටතේ වුවද, දේවවාදය [11] නම් ආගම ඉවත ලීම පිණිස ප්‍රායෝගික ද්‍රව්‍යවාදීන්ට උපයෝගි කර ගත හැකි පහසු මාර්ගයකි."(මාක්ස් සහ එංගල්ස් “ශුද්ධ පවුල “ මයින්-නදී-බඩ- ෆ්රැන්ක්ෆර්ට්, 1845. පිටු 201-204 [12])

නුතන ද්‍රව්‍යවාදයේ බ්‍රිතාන්‍ය සම්භවය ගැන කාල් මාක්ස් ලියුවේ එබැවිනි. ඔහු ඉංග්‍රිසින්ගේ මුතුන්මිත්තන්ට දැක්වූ එම ගෞරවය දැන් ඉංග්‍රීන්ට සුම්හිරි නොවේ නම් එය වඩාත් කණගාටුවට හේතුවකි.

දහ අටවැනි ශතවර්ෂයේදී ජර්මානුන් සහ ඉංග්‍රිසින් විසින් ප්‍රංශුවන් ගොඩ සහ මුහුදු සටන්වලින් පරාජය කර තිබියදීම, ඒ ශ්‍රෙෂ්ඨ ප්‍රංශ විප්ලවයටත් පෙර -- එංගලන්තය මෙන් ජර්මනියද තවමත් එහි ප්‍රතිඵලවලට හුරු පුරුදු වීමට වෙර දරයි - එය අති සම්භාවනීය ශතවර්ෂය බවට පත් කළ ඒ දීප්තිමත් ප්‍රංශ ද්‍රව්‍යවාදී ගුරුකුලයෙහි පීතෘවරයන් වුයේ බේකන්, හොබ්ස් සහ ලෝක් බව කිසිසේත් ප්‍රතික්ෂේප කළ නොහැකි සත්‍යයකි.

මෙය ප්‍රතිෂේප කළ නොහැකිය.

එංගලන්තයේ නේවාසික වු වියත් විදේශිකයාට මෙම ශතවර්ෂයේ විමතිකාරී දෙයක් සේ පෙනී ගියේ වැදගත් ඉංග්‍රිසි මධ්‍යම පන්තිය ආගමික පටු කල්පනා කෙරෙහි තදින් එල්බ සිටින ආකාරය සහ එහි ආඥානකමය. එසේ නැතහොත් යටත් පිරිසෙයින් ඉතා දියුණු නිදහස් චින්තකයන්ගේ තත්වයට වත් පැමිණ සිටියෙමු. එනිසා එංගලන්තයේ උගත් මිනිසුන් සියලුදෙනාම පාහේ නේකාකාර නොසිදුවිය හැකි ප්‍රතිහාර්යන් ගැන විශ්වාස කිරීමත් බක්ලන්ඩ් සහ මැන්ටල් වැනි භූගර්භ විද්‍යාඥයින් පවා ඔවුන්ගේ විද්‍යාත්මක කරැනු උත්පත්ති කථා පොත සමග නොගැටෙන ආකාරයට සමාවෘත කිරීමත් ඇදහිය නොහැකි දෙයක් සේ අපට පෙනීගිය අතර ආගමික කරුණු සම්බන්ධයෙන් ස්වකීය කල්පනා ශක්තිය උපයෝගි කර ගැනීමට තරම් නිර්භීත මිනිසුන් සොයා ගැනීමට නම් අයෙකුට නූගත් ජනයා, නැතහොත් එකල ඔවුන් හදුන්වන ලද පරිදි "මහා අපිරිසිදු සමූහයා" ඕවන්වාදීන් අතරට යාමට සිදුවිය.

එහෙත් එවක් පටන් එංගලන්තය "ශිෂ්ඨාචාරව" පැවතුනි 1851 වර්ෂයේ ප්‍රදර්ශනය[13] ඉංග්‍රීසින්ගේ පරිවරණක ස්වභාවය අවසන් කරන සීනුනාදය හැඩවීය. එංගලන්තය ආහාර ආචාර විධි සහ අදහස් විසින් ජාත්‍යන්තර බවට පත් විය. ය කොතරම් දුරට සිදුවීද යත් වෙනත් මහා දේශීය සිරිත් මෙහි පැතිර තිබෙන තරමට යම් යම් ඉංග්‍රීසීන් ආචාර විධි මෙහි පැතිර ගියේනම් මැනවයි මට හැගෙන්නට විය. කෙසේ හෝ වේවා සලාද තෙල් (1851 ට පෙර එය රදළ වංශිකයන් පමණක් දැනසිටි දෙයක් විය.) භාවිතය ආරම්භවීම සහ පැතිර යාමත් හා සමගම සමගාමීව ආගමික කාරණා විෂයෙහි මහා ද්වීපික සන්දේහවාදය

දුස්සාධ්‍ය ලෙස පැතිර යාමක්ද සිදු විය. දැන් එය කොතෙක් දුර ගොස් තිබේද යත්, අඥෙයවාදය තවමත් එංගලන්ත සභා ආගම තරම් "හරිදෙය" බවට පත්ව නොතිබුණත් ය වැදගත්ක අනුව බලන ක බැප්ටිස්ට්[14] ආගම සමග සම මට්ටමට පැමිණ ඇති අතර නිශ්චිත වශයෙන්ම "ගැලවීමේ හමුදාවට"[15] වඩා ඉහළින් සිටියි. මෙම තත්වයන් යටතේ මෙම මිථ්‍යා දෘෂ්ටියේ ඉදිරි ගමන ගැන අවංක කණගාටු වන සහ එය හෙළා දකින බොහෝ දෙනෙකුට මෙම "නව පන්නයේ මති මතාන්තර" විදේශයේ උපන් ඒවා නොව, දෛනික භාවිතයට ගන්නා වෙනත් බොහෝ භාණ්ඩ මෙන් Made in Germany(ජර්මනියේ සාදන ලද - සංස්කාරක) ඒවා නොවන බවත්, නිසැක වශයෙන්ම පැරණි ඉංග්‍රීසි ඒවා බවත් එමෙන්ම අවුරුදු දෙසීයකට ප්‍රථම එම එම අදහස්වල නිර්මාතෘවරයන් වූ බ්‍රිතානීන් ඔවුන්ගේ පරම්පරාවෙන් දැන් පැවත එන්නන් යාමට තරම් එඩිතරවන දුරට වඩා බොහෝ දුර ගිය බවත් දැනගන්නට ලැබීම, අස්වැසිල්ලක් වනු ඇතැයි යන අදහස මා තුළ පැන නැගීම මට වැළැක්විය නොහැකිය.

ඇත්ත වශයෙන්ම, අඥෙයවාදය යනු - හොඳින් අදහස ප්‍රකාශ වන සුලු ලැන්කෂයර් යෙදුමක් ගනිතොත් - "ලජ්ජාශීලි " ද්‍රව්‍යවාදය මිස වෙන කුමක්ද? ස්වභාව ධර්මය පිළිබඳව අඥෙයවාදියා දරන සංකල්පය මුල පටන් අග දක්වාම ද්‍රව්‍යවාදීය. සමස්ත ස්වභාවික ලෝකයම නීතියකින් පාලනය වේ. එනිසා බැහැරින් කෙරෙන ක්‍රියා මගින් එයට මැදිහත් වීමට කිසිම ඉඩක් නැත. නමුත් අප දන්නා විශ්වයෙන් බිබෙහි උත්තර සත්තාවක් පවතීද යන්න නිර්ණය කිරීමට හෝ, ය අසත්‍ය බව ඔප්පු කිරීමට හෝ මගක් අපට නැතැයි ඔහු තවදුරටත් පවසයි. ශ්‍රේෂ්ඨ තාරකා විද්‍යාඥ ලාප්ලාස්ගේ "භූගෝලයේ යාන්ත්‍රිකමය ක්‍රියාකාරිත්වය පිළිබද සංග්‍රහයෙහි" මැවුම් කරැ ගැන සදහනක් වත් කර නොමැත්තේ මන්දැයි නැපෝලියන් ඔහුගෙන් විමසු කල ඔහු "Je n’avais pas besoin de cette hypothèse"(මට ඒ කල්පිතය අවශ්‍ය නොවීය - සංස්කාරක) යනුවෙන් සාඩම්බර ලෙස පිළිතුරු දුන් කාලයට අඥෙයවාදියාගේ කියමන ප්‍රමාණවත් වූ බව සිතිය හැක. නමුත් මේ කාලයේ විශ්වය පිළිබද වූ අපගේ විප්ලවාදී සංකල්පයෙහි මැවුම් කරුවෙකුටවත් පාලකයෙකුටවත් කිසිම ඉඩක් නොමැත. පවත්නා සමස්ත ලෝක යෙන්ම පිටමං කර වසා තබන ලද උත්තර සත්තාවක් ගැන කථා කිරීම වචන අතර පරස් පරයක් වන හෙයින් එය ආගමික ජනයාගේ හැගීම්වලට කරන ත්‍යාගිවන්න නිග්‍රහයක්ද වේ.

තවද අපගේ සියලු ඥානය අපගේ ඉන්ද්‍රියන් විසින් අපට දෙනු ලබන තොරතුරු මත පදනම් වී තිබෙන බව අඥෙයවාදියා පිළිගනියි. නමුත් අප අපගේ ඉන්ද්‍රියන් මගින් සංජානික වස්තු පිළිබදව ඒවා අපට දන්වන තොරතුරු නිවරදිද යන්න අප දැනගන්නේ කෙසේද? යන ප්‍රශ්නයද ඔහු එකතු කරයි. නිසා හු වස්තු හා ඒවායේ ගුණාංග ගැන අදහස් නොකරන බවත් ඔහු අදහස් කරන්නේ ඒවා විසින් ඔහුගේ ඉන්ද්‍රියන් කෙරෙහි ඇති කරන ලද ඡායාවන් ගැන පමණක් බවත් ඔහු තවදුරටත් අපට කියයි. මෙහිදී හුදෙක් විවාදයෙන්ම පමණක් මෙම තර්කණ පිළිවෙල බිද දැමීම දුෂ්කර බව පෙනේ. නමුත් විවාදයට පෙර ක්‍රියාකාරීත්වය පැවතුනි. Im Anfang war die tat (ආරම්භයෙහි වූයේ ක්‍රියාවය - ගෙය්තේගේ "ෆවුස්ත්", 1 පරිච්ඡේදය, 3 දර්ශනය - සංස්කාරක) මිනිස් ශුරත්වය විසින් මෙම දුෂ්කරතාවය නිර්මාණය කරනු ලැබීමට පෙර මිනිස් ක්‍රියාව එය විසදා තිබුණේය. පුඩි රසදැයි දැනගත හැක්කේ ය කෑ කලය. එසේම මෙම වස්තු තුළ අප දක්නා ගුණංගයන් අනුව ඒවා අපගේම ප්‍රයෝජනය පිළිබද අපගේ තක්සේරුවද වැරදි විය යුතුය. එනිසා අපගේ ප්‍රයත්නය අසාර්ථක විය යුතුය. නමුත් අපි අපගේ අරමුණ සපුරා ගැනීමෙහි සමත් වමු නම්, වස්තුව, අප ඒ සම්බන්ධයෙන් දරන අදහසට එකග වන බව අපට දක්නට ලැබේ නම් එමෙන්ම අප එයින් ඉටුකැගැනීමට බලාපොරොත්තු වූ අරමුණ සඵල වේ නම්, එවිට, ය (වස්තුව) හා ගුණාංග පිළිබදව වූ අපගේ සංජානනය අපෙන් බාහිරව පවතින යථාර්ථය හා සමග <u>ඒතාක් දුරට</u> ගැලපෙන බවට ය ස්ථිර සාක්ෂියක් වන්නේ ය. එමෙන්ම අප අසාර්ථකත්වය හා සමග මුහුණට මුහුණලා සිටින හැම අවස්තාවකදීම අප අසමත් කිරීමට හේතුවූ කරුණ සාමාන්‍ය

වශයෙන් වැඩි කලක් ගතවන්නට කලින්ම සොයා ගන්නෙමු. විට අපගේ ක්‍රියාවට පදනම කරගත් සංජානනය අසම්පූර්ණ හෝ මතුපිටට පමණක් සීමා වුවක් වන බව හෝ එසේ නැතහොත්, එය, වෙනත් සංජානයනනයන් මගින් ලබාගත් ප්‍රතිඵල සමග, ඒවා ඉඩ නොදෙන ආකාරයකින් සම්බන්ධ කරගත් බව, එනම් අප කියන පරිදි, වරදි තර්කරණයක් අනුගමනය කළ බව හෝ, පෙනී යනු ඇත. පෙනී යනු ඇත. අපගේ ඉන්ද්‍රියයන් නිසි ලෙස පුහුණු කිරීමට හා උපයෝගි කර ගැනීමට අප සුපරීක්ෂාකාරී වන, එසේම, නිසි ලෙස ඇති කරගත් හා නිසි ලෙස උපයෝගි කරගත් සංජානනයන් විසින් නිර්දිෂ්ඨ සීමාවන් ඇතුලත අපගේ ක්‍රියාකාරීත්වය රදවා ගන්නා තාක් කල් අපගේ සංජානනයන් සංජානික වස්තූන්ගේ වාස්තවික ස්වභාවය සමග ගැලපෙන බව අපගේ ක්‍රියාවෙහි ප්‍රතිඵලවලින් ඔප්පු වනු ඇත. විද්‍යානුකූල ලෙස පාලනය කරනු ලබන අපගේ ඉන්ද්‍රීයානුසාරී සංජානනයන්, බාහිර ලෝකය සම්බන්ධයෙන් අපගේ සිත් තුළ ඇති වීමට පොළඹවන අදහස්, ඒවායේ ස්වභාවයෙන්ම යථාර්තයෙන් වෙනස්වන බව හෝ, එසේ නැතහොත්, බාහිර ලෝකයත්, ඒ පිළිබද අපගේ ඉන්ද්‍රීයානුසාරී සංජානනයන් අතර නෛසර්ගික අසංගතාවයක් පවතින බව හෝ, නිගමනය කිරීමට අප යොමු වුනු එකද අවස්ථාවක් වත් මෙතෙක් නොවීය.

නමුත්, ඉක්බිතිව නව කාන්ට්වාදී අඥෙයවාදීහු ඉදිරියට පැමිණ මෙසේ කියති. කිසියම් දෙයක ගුණාංග නිවරැදි ලෙස අපට සංජානනය කළ හැකි වන්නට පිළිවන, එහෙත් ඉන්ද්‍රිය ගෝචර හෝ මානසික හෝ ක්‍රියාදාමයක් මගින් අපට එම දෙය ඇති සැටියෙන්ම ග්‍රහණය කළ නොහැකිය. මෙම "ඇති සැටියෙන්ම වූ දෙය" අපගේ ඥාන ක්ෂේත්‍රයෙන් ඔබ්බෙහි තිබෙන්නකි. ඉන් පසුව දැන් බොහෝ කලකට පෙර හේගල්, මෙසේ පිළිතුරු දී ඇත. ඔබ කිසියම් දෙයක ගුණාංග සියල්ලම දන්නෙහි නම් එවිට ඔබ ඒ දෙය ඇති සැටියෙන්ම දන්නෙහිය. එකී දෙය අපෙන් බාහිරව පවතින්නේය යන කරුණ හැර වෙනත් කිසිවක් ඉතිරි නොවන්නේය. ඔබගේ සංවේදයන් ඔබට මෙම කරුණද උගැන්වූ පසු, කාන්ට් ගේ චිර ප්‍රසිද්ධ "ding an sich"(ඇති සැටියෙන්ම වූ දෙය - සංස්කාරක) හි ඉතිරි අවසාන ශේෂයද ඔබ ග්‍රහණය කරගත්තා වන්නෙහිය. කාන්ට් ගේ කාලයේදී ස්වභාවික වස්තු ගැනවූ අපගේ ඥාණය ඇත්තෙන්ම ඉතාමත් අසම්පූර්ණ වූ හෙයින්, ඒ හැම වස්තුවක්ම ගැන අප දත් ස්වල්පය පිටුපස ගුප්ත "ඇතිසැටියෙන්ම වූ දෙයක්" වීයැයි කෙනෙකුට සැක සිතීමට බොහෝ ඉඩ තිබින එහෙත් මෙම ග්‍රහණය කළ නොහැකි දේවල් එකින් එක, විද්‍යාවේ යෝධ ප්‍රගතිය විසින් ග්‍රහණය කරනු ලැබ, විශ්ලේෂණය කරනු ලැබ සහ ඊටත් වඩා ප්‍රජණනය කරනු ලැබ තිබේ. ඒ අනුව අප ප්‍රජණනයකර ඇති දෙය දැනගත නොහැකි දෙයක් සේ ඇත්තෙන්ම සැලකිය නොහැක. මෙම ශත වර්ෂයේ ප්‍රථම අර්ධයේ රසායන විද්‍යාවට කාබනික ද්‍රව්‍ය එවැනි ගුප්ත වස්තූන් විය. දැන්, අපි ඒවා එකින් එක, කාබනික ක්‍රියාදාමයන්ගේ ආධාරය නොමැතිව, ඒවායේ මූලද්‍රව්‍ය වලින් ගොඩනැගීමට උගෙනගන්නෙමු. කුමණ හෝ වස්තුවක් වුව රසායනික ඝටනාව දැනගත් වහාම එය එහි මූලද්‍රව්‍යන්ගෙන් තැනිය හැකි බව නූතන රසායනඥයෝ ප්‍රකාශ කරති. උසස්තම කාබනික ද්‍රව්‍ය වන ඇල්බියුමින දේහයන්ගේ ඝටනාව ගැන අප තවමත් දන්නේ ඉතා ස්වල්පයකි. එහෙත්, ශතවර්ෂාධික කාලයකින් පසුව හෝ වුව අප මෙම දැණුම ලබාගෙන, එයින් සන්නද්ධව, කෘතීම ඇල්බියුමන් සෑදීම නොකිරීමට හේතුවක් නැත. නමුත් අප එය ඉටුකළ කල්හි, අපි ඒ අතරම සත්ව ජීවය නිපදවූවෝ වන්නෙමු. මක්නිසාද යත්, ජීවයේ පහලම සිට ඉහලම දක්වා වූ ආකාරයන් නම්, ඇල්බියුමින දේහයන්ගේ පැවැත්මේ ආකාරය වන හෙයිනි.

කෙසේ හෝ වේවා, අපගේ අඥෙයවාදියා, මෙම විධි මාත්‍ර මානසික උපන්‍යශයන් දැක්වූ තැන් පටන් ඔහු කථාකරන්නේ සහ ක්‍රියා කරන්නේ ඔහු අභ්‍යන්තරයේ වන උග්‍ර ද්‍රව්‍යවාදියාගේ ස්වභාවයෙන්මය, අප දන්නා තරමින් ද්‍රව්‍ය හා චලිතය, නැතහොත් දැන් එය හදුන්වන ලබන පරිදි ශක්තිය ඇති කිරීමට හෝ නැති කිරීමට හෝ නොහැක. එහෙත් ඒවා කිසියම් කලකදී නොමවන ලදැයි ඔප්පු කිරීමට අපට සාධක නොමැත. එසේ වුවද, කිසියම්

අවස්ථාවක, මෙම පිළිගැනීම ඔහුට විරුද්ධව පාවිච්චි කිරීමට උත්සාහ කළහොත්, ඔහු අප්‍රමාදව ඔබ උසාවියෙන් එලියට දමනු ඇත. අධ්‍යාත්මවාදයට[16] ඉඩ තිබෙන බව ඔහු in abstracto (වියුක්ත ලෙස - සංස්කාරක) පිළිගන්නේ නමුදු හේ in concreto (නියත ලෙස - සංස්කාරක) ඒ හා සමග කිසිම සම්බන්ධයක් නොපවත්වයි. අප දන්නා දෙය නම්, ද්‍රව්‍යමය ලෝකය වෙනස් කළ නොහැකි නීති විසින් පාලනය වන බවයි. මේ ආදී වශයෙන් ඔහු කියනු ඇත. මේ අනුව, ඔහු විද්‍යාව ගරු කරන මිනිසෙක් වන තාක් දුරට, ඔහුට විද්‍යාවෙන් බාහිර වූ, ඔහු කිසිත් නොදන්නා ක්ෂේත්‍රයන් පිළිබද ඔහුගේ නොදැනවත්කම ග්‍රීක භාෂාවට පරිවර්ථනය කර එයට agnosticism (අඥෙයවාදය - සංස්කාරක) යන නම තබයි.

කරුණු කෙසේ වුවත්, එකක් පැහැදිලිය. කිසියම් ලෙසකින් මා අඥෙයවාදියෙක්ව සිටියද, මෙම කුඩා පොතෙහි දළ වශයෙන් සටන් කර තිබෙන සංකල්පය "ඓතිහාසික අඥෙයවාදය" යනුවෙන් නම් කිරීමට මට පුළුවන්කමක් නොතිබුණු බව පැහැදිලිය. එසේ කරන ලද නම් ආගමිකයන් මට සිනහ වනු ඇත. මා අඥෙයවාදීන්ට විහිළු කරන්නේ මන්දැ? යි ඔවුන් (අඥෙයවාදීන්) කෝපව මගෙන් අසනු ඇත. එනිසා සමාජයේ ආර්ථික සංවර්ධනයද නිෂ්පාදන සහ හුවමාරු ක්‍රමවල වෙනස් වීමද, සමාජයේ ආර්ථික සංවර්ධනයද නිෂ්පාදන සහ හුවමාරු කුමවල වෙනස් වීමද, ් අනුව සමාජය පැහැදිලි පංතිවලට බෙදීමද මෙම පංති අතර එකිනෙකට විරුද්ධ අරගලද විෂයෙහි වන වැදගත් මහා ගාමක බලය ගැන විමසන්නා වූ, ඉතිහාස මාර්ගය පිළිබද දෘෂ්ටියට නම් තැබීම සදහා ඉංග්‍රිසි හා වෙනත් භාෂා කිපයකින්ම "ඓතිහාසීය ද්‍රව්‍යවාදය" යන වදන යෙදීම නිසා බ්‍රිතාන්‍ය නම්බුකාරකම වුවද පමණට වැඩිය නොකැළඹෙනු ඇතැයි මම බලාපොරොත්තු වෙමි.

ඓතිහාසීය ද්‍රව්‍යවාදය බ්‍රිතාන්‍ය නම්බුකාරකමට පවා ප්‍රයෝජනවත් වන බව පෙන්වීම මට හැකි වේ නම් සමහර විට අප්‍රමාදවම මට මෙම අනුග්‍රහය ලැබෙනු ඇත. අවුරුදු හතලිහකට හෝ පණහකට පෙර එංගලන්තයේ නේවාසික වීමට ගිය ඕනෑම වියත් විදේශියෙකු විසින්, නම්බුකාර ඉංග්‍රිසි මධ්‍යම පන්තියේ පටු ආගමික කල්පනා සහ අඥානකම වශයෙන් නිසැකවම සැලකෙනු ඇති දෙය නිසා හු මවිත වී යයි මම ඉහත සදහන් කෙළෙමි. ඒ කාලයේ ඉංග්‍රිසි මධ්‍යම පංතිය බුද්ධිමත් විදේශිකයාට පෙනුනු තරමට සැබවින්ම අඥාන නොවූ බව මම දැන් ඔප්පු කරන්නට බලාපොරොත්තු වෙමි. එහි ආගමික නැඹුරු වීම් සහේතුක විය.

යුරෝපය මධ්‍යකාලීන සමය ගෙවා ඉන් මතු වන විට, එහි විප්ලවීය මූලිකාංගය සමන්විත වුයේ නැගී එන නාගරික මධ්‍යම පංතියෙනි. මධ්‍යකාලීන වැඩවසම් සංවිධානය තුළ එය පිළිගත් තත්වයක් දිනා ගෙන තිබුණ නමුත්, මෙම තත්වයද එහි ප්‍රසාරණීය බලයට අවශ්‍ය තරමට වඩා පටු විය. මධ්‍යම පංතියේ, එනම් ධනපති පංතියේ සංවර්ධනය වැඩවසම් කමය පවත්වා ගැනීම හා සමග අසංගත වූ තත්වයක් මතු විය. එනිසා වැඩවසම් කුමයට ඇද වැටෙන්නට සිදුවිය.

එහෙත් වැඩවසම් කුමයේ මා ජාත්‍යාන්තර මධ්‍යස්ථානය වුයේ රෝමානු කතෝලික පල්ලියයි. වැඩවසම් බටහිර යුරෝපයේ අභ්‍යන්තර යුද්ධ සියල්ලක්ම ඇති වී තිබියදී එහි සම්පූර්ණයෙන්ම එකම මා දේශපාලන පද්ධතියක් වන සේත්, ආගම් භේදවාදී ග්‍රීක සාරධර්මිකවාදීන්ට ස එසේම මුසල්මාන රටවලටද ප්‍රතිපාක්ෂික වන සේත්, එය විසින් එක්සත් කරන ලදී. එය වැඩවසම් ආයතන දේව අභිෂේකයේ රශ්මි වළල්ලෙන් වට කොට සැරසුවේය. එය තමන්ගේ අධිපති මුඩුලුලද වැඩවසම් ආකෘතිය අනුව සංවිධානය කරගෙන තිබුණේය. අන්තිම වශයෙන් එය අන්හැමට වඩා ඉතාමත් බලවත් ඉඩම් හිමියාද විය. කතෝලික ලෝකයේ භූමි ප්‍රමාණයෙන් මුළු තුනෙන් කොටසක්ම යට අයත් විය. දුෂ්ට

වැඩවසම් ක්‍රමයට, එක් රට තුළදී සහ අංගසම්පූර්ණ ලෙස සාර්ථක වශයෙන් පහර දීමට හැකි වන්නට පෙර, එහි ශුද්ධ මධ්‍යම සංවිධානය වන මෙය විනාශ කිරීම අවශ්‍ය විය.

තවද, මධ්‍යම පංතියේ නැගීමත් හා සමග සමාන්තර ලෙස විද්‍යාවේ මා පුනර්ජීවනයද ඉදිරියට ගියේය. තාරකා ශාස්ත්‍රය, යාන්ත්‍රික විද්‍යාව, භෞතික විද්‍යාව, ව්‍යුහ විද්‍යාව නැවතත් ප්‍රගුණ කරන ලදී. එමෙන්ම, ධනපති පංතියේ කාර්මික නිෂ්පාදනය සඳහා ස්වාභාවික වස්තූන්ගේ භෞතික ගුණයන් සහ ස්වභාව ධර්මයේ බලවේගයන්ගේ ක්‍රියාකාර විධි ගැන නිර්ණය කරන විද්‍යාව එයට අවශ්‍ය විය. ඒ දක්වා විද්‍යාව පල්ලියේ අතවැසි සේවිකාවගේ තත්වයෙහි පසුවුනු බැවින් භක්තිය විසින් නියම කරන ලද සීමාවන් ඉක්ම වීමට එයට ඉඩ නොදෙන ලදී. ඒ හේතුකොටගෙන විද්‍යාව කිසි සේත්ම විද්‍යාව නොවීය. විද්‍යාව පල්ලියට විරුද්ධව කැරලි ගැසීය. ධනපති පංතියට විද්‍යාව නැතිව බැරි විය. එනිසා එයද කැරැල්ලට එක් විය.

ඉහත දක්වන ලද කරුණුවලින් සඳහන් වන්නේ නැගී එන මධ්‍යම පංතිය ස්ථාපිත ආගමට විරුද්ධව නොවැලැක්විය හැකි සේ ගැටීමට යොමු කරන අවස්ථා දෙකක් පමණක් ගැන වුවද, ප්‍රථමයෙන්ම රෝමානු පල්ලියේ රැවටිලිවලට විරුද්ධ වූ අරගලය පිළිබඳ ප්‍රධාන කොටස ඉටු කළ පංතිය ධනපති පංතිය බවද, දෙවැනිව, එම වකවානුවේ වැඩවසම් ක්‍රමයට වරුද්ධව කරන සෑම අරගලයක්ම ආගමික වෙශයක් ගත යුතු වූ බව හා ය ප්‍රථමයෙන්ම පල්ලියට විරුද්ධව එල්ල කළ යුතුව තිබුණු බවද පෙන්නුම් කිරීමට ඒ සෑහෙන්නේය. ප්‍රථමයෙන් විශ්විද්‍යාලවලින් සහ නාගරික වාණිජ සහ ව්‍යවසායික කොටස් අතරින් පැන නැගුනු මෙම රණ ඝෝෂාවට ග්‍රාමීය ජනතාවගෙන් නැතහොත් ගොවි ජනතාවගෙන් අනිවාරණීය ලෙස බලවත් සහයෝගයක් ලැබුණු අතර එම ජනතාව ස්වකීය පැවැත්ම සඳහා අරගලයක් කරමින්, තමන්ගේ පූජක හා ලෞකික රදළයන්ට විරුද්ධව සෑම තැනම පැතිරුණු දරුණු අරගලයක් කළහ.

වැඩවසම් කමයට විරුද්ධව ධනපති පංතිය කළ දිර්ඝ මහා තීරණාත්මක සංග්‍රාම තුනක් මගින් උච්ඡ අවස්ථාවට පත්විය. ඉන් පළමුවැන්න ජර්මනියේ ප්‍රොතෙස්තන්ත ප්‍රතිශංස්කරණය යනුවෙන් හදුන්වන ලද ඒකය. පල්ලියට විරුද්ධව ලූතර් නැංවූ රණ ඝෝසාවට ප්‍රතිචාර වශයෙන් දේශපාලන ස්වභාවයේ කැරලි දෙකක් ඇති විය. ඉන් පළමුවැන්න ෆාන්ස් ෆෝන් සිකින්ගන්ගේ නායකත්වය යටතේ (1523) ඇති වූ පහළ වංශවතුන්ගේ කැරැල්ලය. අනික 1525 වර්ෂයේ මහා ගොවිජන යුද්ධය ය. ඒ දෙකම පරාජය විය. ඊට ප්‍රධාන වශයෙන් හේතු වුයේ, ඒ සඳහා වැඩිම උනන්දුවක් දැක්වූ පාර්ශවයන්, එනම් නගරවල වූ නාගරිකයන්ගේ අතීරණය ය. එම අතීරණයට හේතු වූ කරුණු සෙවීමට අපට මෙහිදී යොමු විය නොහැකිය. එතැන් පටන් ප්‍රාදේශීය කුමාර වරුන් හා මධ්‍යම ආණ්ඩු බලය අතර සටනක තත්වයට පහත වැටුනු ම අරගලය කෙළවර වුයේ යුරෝපයේ දේශපාලන වශයෙන් ක්‍රියාකාරී වූ ජාතීන් අතරින් ජර්මනිය අවුරුදු දෙසීයයක කාලයකට පිටමං කිරීමෙනි. ලූතර්වාදී ප්‍රතිසංස්කරණයෙන් සැබවින්ම අළුත් ලබ්ධියක් බිහි විය. එය ඒකාධිපති රාජාණ්ඩුවට ගලපන ලද ආගමක් විය. ඊසානදිග ජර්මනියේ ගොවි ජනයා ලූතර්වාදය වැළඳ ගත් වහාම ඔවුන් නිදහස් මිනිසුන්ගේ තත්වයේ සිට ප්‍රවේණිදාස තත්වයට ඇද වැටුනේය.

නමුත් ලූතර් අසමර්ථ වූ තැන කාල්වින් ජය ගත්තේය. කාල්වින් ගේ ලබ්ධිය ඔහුගේ කාලයේ එඩිතරතම ධනපති පංතියට සුදුසුවූවකි. ඔහුගේ පූර්ව ඉරනම් ධර්මය පිළිබිඹු කල මතය වූයේ තරගකාරී වාණිජ ලෝකයේ සාර්ථකත්වය හෝ අසාර්ථකත්වය රදාපවතින්නේ මිනිසාගේ ක්‍රියාකාරිත්වය හෝ දක්ෂකම් අනුව නොව, ඔහු විසින් පාලනය කරනු නොලබන තත්වයන් මතය යන්නය. එය අනුව වැදගත් වන්නේ තීරණය කරන්නා හෝ ක්‍රියා කරන්නා හෝ නොව හදුනා නොගත් උසස් ආර්ථික බලවේගයන්ගේ කැමැත්තය. පැරනි වානිජ

ගමන්මාර්ග සහ මධ්‍යස්ථාන වෙනුවට අලුත් මාර්ග සහ මධ්‍යස්ථාන ආදේශ කල, ඉන්දියාව සහ ඇමරිකාව ලෝකයා හමුවේ විවෘත්ත කල ඉතාමත් විශ්වාසවත් ශුද්ධ ආර්ථික භාණ්ඩවූ රන් හා රිදී වල පවා අගය හෙල්ලුම්කා ඇද වැටෙන්නට පටන්ගත්, ආර්ථික විප්ලවයක කාල පරිච්ඡේදයෙහිදී මෙම දහම විශේෂයෙන්ම සත්‍යය විය. කාල්වින්ගේ පල්ලි ව්‍යවස්ථාව ඉතාමත් ප්‍රජාතන්ත්‍රවාදී සහ සමූහාණ්ඩුවාදී විය. ඒ අනුව දෙවියන් ගේ රාජධාණිය සමූහාණ්ඩු කරණයට පත් කරන ලද කල මෙම ලෝකයේ රාජධාණිවලට රජවරුන් බිෂොප් වරුන් සහ සාමි වරුන් යටතේ පැවතිය හැකිද? ලූතර්වාදය කුමාර වරුන් අතට පත් ඔවුන්ට කැමැත්තෙන් සේවය කරන උපකරණයක් බවට පත් වූ අතර කාල්වින්වාදය ඕලන්දයේ සමූහාණ්ඩුවක් පිහිටෙව්වේය. එමෙන්ම එංගලන්තයේ සහ විශේෂයෙන්ම ස්කොට්ලන්තයේද ක්‍රියාශීලි සමූහාණ්ඩුවාදී පක්ෂ පිහිටෙව්වේය.

ධනපති පංතියේ දෙවැනි මහා උත්ක්ෂේපණයට අවශ්‍ය ධර්මය කාල්වින්වාදය විසින් සාදා නිම කළ තත්වයෙන් සැපයින. මෙම උත්ක්ෂේපණය ඇති වුයේ එංගලන්තයෙහි ය. නගරවල මධ්‍යම පංතිය එය අවුස්සා ලූ අතර ගම්බද දිස්ත්‍රික්කවල ගොවිජන සේනා සටන කළහ. අරුමයකට මෙන්, මහා ධනපති කැරලි තුනෙහිම සටන කළ යුතු හමුදාව සපයන ලද්දේ ගොවි ජනතාව විසින් වන අතර ජයග්‍රහණය අත්පත් කරගත් පසු එම ජයග්‍රණයේ ප්‍රතිඵලවලින් ඉතාමත් නිසැක ලෙස ආර්ථික වහයෙන් විනාශයට පත් වූ පංතිය වුයේද එම ගොවි ජනතාවමය. ක්‍රොම්වෙල්ගේකාලයෙන් අවුරුදු සියයකට පසුව එංගලන්තයේ ගොවිජනයා අතුරුදහන් වූ තරම් තත්වයක් විය. කෙසේ හෝ වේවා එම ගොවි ජනතාව හා නාගරික සාමාන්‍ය ජන කොටස් නොසිටින්නට ධනපති පංතිය තනිවම එම සටන අන්තිම අවසානය දක්වා කිරීම හෝ පළමුවැනි චාල්ස් රජු පෝරකයට නැංවීම හෝ කිසි කලෙක් සිදු නොවන්නට තිබුණි. ඒ කාලයේදී නෙලා ගැනීමට තරම් පැසී තිබුණු එම ධනපති ජයග්‍රහණයන් පවා තහවුරැ කර ගැනීම පිණිස, විප්ලවය තවත් සෑහෙන දුරක් ඉදිරියට, නම්, හරියටම 1793 දී ප්‍රංශයේ හා 1848 දී ජර්මනියේ සිදු වූ ලෙස ඉදිරියට, ගෙන යාමට සිදු විය. මෙය ඇත්ත වශයෙන්ම, ධනපති සමාජයේ පරිනාමයෙහි එක නියාමයක් බව පෙනේ.

මෙසේ විප්ලව ක්‍රියාකාරීත්වයේ අතිරික්තයක් ඇති වූ තැන නොවැලැකිවිය හැකි ලෙසටම පතිගාමීත්වය ක්‍රියාත්මක වී යද ස්වකීය පැවැත්ම කර ගෙන යා හැකි තත්වය ඉක්මවා ඉන් ඔබ්බට ගියේය. එහා මෙහා පැද්දීම් මාලාවකින් පසුව අන්තිමෙදී නව ගුරුත්වාකර්ෂණ කේන්ද්‍රය සොයා ගන්නා ලදින් එය අළුත් ආරම්භක ස්ථානයක් වුයේය. "මහා කැරැල්ල" යන නමින් නම්බුකාරයන්ගේ ගරු සැලකිල්ට ලක් වූ ඉංග්‍රිසි ඉතිහාසයේ ඒ උදාර කාල පරිච්ඡේදය ා ඒ අනුගාමි අරගලද කොළවර වුයේ "කීර්තිමත් විප්ලවය"[17] යනුවෙන් ලිබරල් ඉතිහාසඥයන් විසින් හදුන්වන ලද සංසන්දනීය වශයෙන් ඉතාමත් සුළු සිද්ධියකිනි.

අළුත් ආරම්භක ස්ථානය වුයේ නැගී එන මධ්‍යම පංතිය සහ කලින් රදළ ඉඩම් හිමියන් වුවන් අතර බේරුම් කර ගැනීමකි. මින් පසු කී කොටස එකල මෙන්ම දැනටද වංශවතුන් යනුවෙන් හදුන්වනු ලැබූහ දැන් බොහෝ කලක සිට රාජධානියේ ප්‍රථම ධනපතියන් වීමේ එනම් ඊට බොහෝ කලකට පසු ප්‍රංශයේ ලුවිෆිලිප් එළැඹුනු තැනට පැමිණීමේ මාර්ගයට පිවිස සිටියහ. එංගලන්තයේ වාසනාවට මෙන් රෝසමල් යුද්ධ [18] වලදී පැරණි පවුල්වල උරුමක්කාරයන් වූ නමුත් ඔවුන් පෙළපත් පිළිවෙළෙන් කොතරම් දුරට බැහැරවීද යත් ඔවුන් රදළ ප්‍රවණතාවයන්ට වඩා ධනපති ප්‍රවණතා වයන් ඇති අළුත්ම පිරිසක් විය. ඔවුහු මුදලේ අගය මැනවින් දැන සිටියහ. එනිසා අප්‍රමාදව සිය ගණන් සුළු ගොවියන් එළවා දමමින් ඔවුන් වෙනුවට බැටළුවන් ආදේශ කිරීම තුළින් ඔවුන්ගේ බදු වැඩි කර ගත්හ. පල්ලි ඉඩම් අන්සතු කළ අටවැනි හෙන්රි තොග පිටින් අළුත් ධනපති ඉඩම් හිමියන් ඇති කළේය දහහත්වැනි ශතවර්ෂය මුළුල්ලේම බුදල් අතිවිශාල සංඛ්‍යාවක් රාජ්‍ය සන්තක කර ඒවා සම්පූර්ණයෙන්ම නැතහොත් සංසන්දනීය වශයෙන් අළුත් බලවතුන්ට ප්‍රධානය කිරීමෙන් ඇති වුයේද එම ප්‍රතිඵලමය. ඒ අනුව හත්වැනි හෙන්රිගෙන් පසු කාලයේ "වංශවතුන්" කාර්මික නිෂ්පාදනයේ සංවර්ධනයට කිසිසේත් ප්‍රතිවිරුද්ධ නොවූ අතර එයින් වක්‍ර

ආකාරයෙන් ලාභ ප්‍රයෝජන ලැබීමට යොමු වුහ. නිසා දේශපාලන හා ආර්ථික හේතු පදනම් කරගෙන මුල්‍ය සහ කාර්මික ධනපති පංතියේ නායක පුද්ගලයන් සමග සහයෝගිව කටයුතු කිරීමට කැමැත්ත දැක්වූ විශාල ඉඩම් හිමි කොටසක් නිතරම සිටියේය. එනිසාම 1689 වර්ෂයේ බේරුම් කර ගැනීම පහසුවෙන්ම ඇති කරගන්නා ලදී. මුල්‍ය කාර්මික සහ වාණිජ මධ්‍යම පංතියේ උවමනාවන් සෑහෙන තරම් ඉටු වූ පසු මුදල් හා තනතුරු පිළිබද දේශපාලන කොල්ලයේ වාසි ලබාගැනීම සදහා මහා ඉඩම් හිමි පවුල්වලට අවස්ථාව සලසන ලදී. මෙම මධ්‍යම පංති ආර්ථික බලවෙගයෝ එවකට ජාතියේ පොදු ප්‍රතිපත්තිය තීරණය කිරීමට තරම් බලවත් වුහ. නොවැදගත් කරුණු ගැන ආරවුල් තිබෙන්නට ඉඩ තිබුණත් සමස්තයක් සේ ගත් කල තමන්ගේ ආර්ථික සමෘධිය කාර්මික හා වාණිජ මධ්‍යම පංතියේ සමෘධිය සමග වෙන් නොකළ හැකි සේ ්කාබද්ධව තිබෙන බව වංශාධිපති කතිපයාධිපතිත්වය ඉතා හොදින් දැන සිටියේය.

ඒ කාලයේ පටන් ධනපති පංතිය එංගලන්තයේ පාලක පංතිවල වෙනත් කොටස් සමග එක් වී ජාතියේ ශ්‍රේෂ්ඨ වැඩකරන පොදු ජනයා යටත් කර තබා ගැනීමේ පොදු උවමනාවක් එයට තිබිණ. වෙළෙදා හෝ කර්මාන්ත කරුවා තමන්ම සේව්‍යයාගේ තැන ගත්තේය. නැතහොත් මෑතක් වනතෙක් කියන ලද පරිදි ඔහුගේ ලිපිකරුවන්ගේ, වැඩකරුවන්ගේ සහ ගෘහ සහ ගෘහ සේවකයන්ගේ "ස්වභාවික සේව්‍යයා" වුයේය. ඔහුගේ උවමනාව වුයේ වුන්ගෙන් හැකි තරම් වැඩියෙන් සහ හැකි තරම් හොදට වැඩ කරවා ගැනීමයි. මෙම අරමුණ ඉටු කර ගත යුතු විය. ඔහු ආගම භක්තිය ඇත්තක් විය. රජුටත් ස්වාමි වරුන්ටත් විරුද්ධව සටන් කිරීම සදහා ඔහු විසින් පෙරටු කොට ගන්නා ලද ධජය සැපයුනේ ඔහුගේ ආගමෙනි. ඔහුගේ ස්වභාවික යටත් සේවකයන්ගේ සිත් සකස් කිරී පිණිසද එම සේවකයන්ට ඉහළින් දෙවියන් විසින්, දේව කැමැත්ත අනුව සිටුවන ලද සේව්‍යයන්ගේ නියමයන්ට ඔවුන් කීකරු කරනු පිණිසද මෙම ආගමෙන්ම සැලසෙන අවස්ථා ගැන දැන ගැනීමට ඔහුටවැඩි කලක් ගත නොවීය. කොටින් කියතොත් "පහළ පංති" නැතහොත් ජාතියේ ශ්‍රේෂ්ඨ නිෂ්පාදක පොදුජනතාව යට කර තැබීමේ කාර්යයට හවුල්වීමට බ්‍රිතාන්‍ය ධනපති පංතියට දැන් සිදුවිය. එම කාර්යය සදහා උපයෝගි කර ගන්නා ලද එක මාර්ගයක් වුයේ ආගමික බල පෑමයි.

ධනපති පංතියේ ආගමික නැඹුරු විම් ශක්තිමත් වීමට ආධාරකාරී වු තවත් කරැණක් විය. එය නම් එංගලන්තය තුල ද්‍රව්‍යවාදයේ නැගීමය. මෙම නව ධර්මය මධ්‍යම පංතියේ ධාර්මික හැගීම් කලඹා ලුයේය. එපමණක් නොව ධනපති පංතිය ඇතුළු නූගත් පොදු ංනතාවන්ට සෑහෙන ආගමට විසංසන්දය වන එය තමන් විශාරදයින්ට හා වියතුන්ට පමණක් සුදුසු වන දර්ශනයක් බව නිවේදනය කළේය. රාජකීය පරමාධිකාරියේ සහ සර්වබලධාරීත්වයේ ආරක්ෂකයෙකු ලෙස එය හොබ්ස් සමග වේදිකාවට නැංගේය. Puer robusus sed malitiosus (හැඩි දැඩි, එහෙත්, ද්වේශ සහගත කොල්ලා - සංස්කාරක) නම් ජනතාව මර්දනය කර තබන ලෙස ය ඒකාධිපති රාජාණ්ඩුවෙන් ඉල්ලා සිටියේය. එමෙන්ම හෝබ්ස්ගේ අනුප්‍රාප්තිකයන්ද බොලිංබ්‍රෝක් ශාෆ්ට්ස්බරි, ආදීන්ද ඉදිරිපත් කළ ද්‍රව්‍යවාදයේ නව දේවවාදී ආකාරය වංහාධිපතියන්ගේ ගුඨ ධර්මයක්ව පැවති අතර එහි මිථ්‍යා දෘෂ්ටියත්, ධනපති විරෝධි දේශපාලන සම්බන්ධකමුත් යන දෙකම නිසා එය මාධ්‍ය පංතියේ වෛරයට ලක් විය. ස්ටුවාට් වරුන්ට විරුද්ධව කළ සටනේ ධජය සහ සටන්කාරී සේනාංකය සැපයු ඒ ප්‍රොතෙස්තන්ත නිකායයන්ම වංශාධිපතියන්ගේ ද්‍රව්‍යවාදයට සහ දේවවාදයට විරුද්ධව මධ්‍යම පංතිය කරන අරගලයේදී ඒ අනුව තවදුරටත් එහි ප්‍රධාන ශක්තිය වුයේය. එසේම අද පවා "මහා ලිබරල් පක්ෂයේ" කොදුනාරටිය වන්නේද එම නිකායයන්මය.

ඒ අතර ද්‍රව්‍යවාදය එංගලන්තයෙන් ප්‍රංශයට සංක්‍රමණය විය හිදී එය දරිශනවාදීන්ගේ තවත් ද්‍රව්‍යවාදී ගුරුකුලයක් වු කාර්ටෙසියන්වාදයේ[19] නිකායක් සමග ඒකාබද්ධ විය. ප්‍රංශයෙහිදී ද එය ප්‍රථමයෙන් තනිකරම වංහාධිපතියන්ගේ ධර්මයක් වශයෙන් පැවතුනි.

හෙත් කල් නොයවාම එහි විප්ලවාදී ස්වභාවය තහවුරු විය. ප්‍රංශ ද්‍රව්‍යවාදීහු ඔවුන්ගේ විවේචනයන් ආගමික විශ්වාසයන් පිළිබඳ කරුණුවලට පමණක් සීමා නොකළහ. ඔවුහු ඔවුන්ට හමුවූ විද්‍යාත්මක ප්‍රවණතාවයන් නැතහොත් දේශපාලන ආයතනයන් සියල්ලම කෙරෙහි එය ව්‍යාප්ත කළහ. වුන්ගේ ධර්මය විශ්වීය වශයෙන් ගැලපෙනබවට කියන ලද අයිතිවාසිකම ඔප්පු කිරීම පිණිස කෙටිම මාර්ගය ගත් ඔවුහු යෝධ කෘතියක් මගින් එම ධර්මය, ඥාණය පිළිබඳ සියලු විෂයයන්ට ගැලපීමේ නිර්භීත පියවර ගත් "විශ්ව කෝෂය" යන එම කෘතියේ නම අනුව ඔවුනට නම් තබන ලදී.[20] ම තත්වයන් යටතේ එම ධර්මයේ දෙ ආකාරයෙන් -- ඒකාන්ත ද්‍රව්‍යවාදය හෝ දේවවාදය -- එකක් මගින් එය ප්‍රංශයේ මුළු උගත් තරුණ පරපුරෙහිම ලබ්ධිය බවට පත්විය. එය කොතරම් දුර ගියේද යත් මහා විප්ලවය ආරම්භ වූ අවස්ථාවේදී ප්‍රංශ සමූහාණ්ඩුවාදීන්ගේ සහ ත්‍රස්තවාදීන්ගේ න්‍යායික ධජය බවට පත් වුයේ ඉංග්‍රිසි රාජ පාක්ෂිකයින් විසින් ගොතන ලද ඒ ධර්මයයි. "මිනිසාගේ අයිතිවාසිකම් ප්‍රකාශනය"[21] සදහා පෙළ සැපයුනේ එයිනි.

ප්‍රංශ මහා විප්ලවය ධනපති පංතියේ තුන්වැනි කැරැල්ල විය. එහෙත් ආගමික කඩතුරාව සම්පූර්ණයෙන්ම ඉවත ලා විවෘත දේශපාලන ප්‍රතිපත්ති මත සටන මෙහෙයවන ලද ප්‍රථම කැරැල්ල එය විය. සටන් අවතීර්ණ එක ප්‍රතිමල්ලයෙක්, නම් වංශාධිපතිත්වය විනාශවන තෙක් හා අනිත් ප්‍රතිමල්ලයාගේ, එනම් ධනපති පංතියේ සම්පූර්ණ ජයග්‍රහණය දක්වාම සැබවින්ම සටන කරන ලද ප්‍රථම කැරැල්ලද එයම විය. එංගලන්තයේ විප්ලව-පූර්ව සහ පශ්චාත් විප්ලව ආතන තවදුරටත් පවත්වා ගැනීම සහ ඉඩම් හිමියන් සහ ධනපතියන් අතර ඇති කරගත් බේරුම් කර ගැනීම අධිකරණමය පූර්ව නිදර්ශන සහ නීතියේ වැඩවසම් ස්වරූප ආගමික වශයෙන් රැක ගැනීම තුළින් ප්‍රකාශිත විය. ප්‍රංශයෙහි විප්ලවය අතීතයේ සම්පදායන් කෙරෙන් සම්පූර්ණයෙන්ම බිඳී වෙන් විමක් විය. වැඩවසම් ක්‍රමයෙන් අවශේෂ වූ සියල්ල අන්තිම අවසානය දක්වා ඉවත ලූ ය Code civil[22] සංග්‍රය නිර්මාණය කළේය. වෙළඳ භාණ්ඩ නිෂ්පාදනය යනුවෙන් මාක්ස් විසින් විස්තර කරන ලද ආර්ථික අවධියට, නැතහොත්, නූතන ධනපති කොන්දේසිවලට අදාළ වන නෛතික සම්බන්ධකම් පිළිබඳ සර්ව සම්පූර්ණ යයි කිව හැකි තරමේ ප්‍රකාශනයක් වන රෝම නීතිය විශාරද ලෙසින් ගලපා ගැනීමක් ම නීති සංග්‍රහය මගින් කෙරින. එම විප්ලවාදී ප්‍රංශ නීති සංග්‍රහය කොතරම් නම් විශාරද ලෙස සකස් කර ිබේද යත්, එය එංගලන්තය ඇතුළු සියලුම රටවල දේපළ පිළිබඳ නීති ප්‍රතිසංස්කරණ සදහා ආදර්ශයක් වශයෙන් මේ දක්වාම ගනු ලැබේ. එසේ වුවද, ඉංග්‍රිසි භාෂාවේ අක්ෂර වින්‍යාසය එහි ශබ්ද උච්ඡාරණයට ගැලපෙන්නා සේම - Vous écrivez Londres et vous prononcez Constantinople (ඔබ ලන්ඩන් යන්න ලියා කොන්ස්තන්තිනෝපල් යනුවෙන් උච්ඡාරනය කරන්නෙහිය - සංස්කාරක) යයි ප්‍රංශ ජාතිකයෙක් කීය. - ප්‍රකාශිත දෙයට ගැලපෙන ඒ මිලේච්ඡ වැඩවසම් භාෂාවෙන් තවදුරටත් ධනපති සම්බන්ධකම් ප්‍රකාශ කරන්නේ වී නමුත් ඒකාධිපති රාජාණ්ඩු කාලයේ යුරෝපා මහා දේශයෙන් අතුරුදහන්ව ගිය හා තවමත් කිසිම දේශයක පුනුරුත්ථාපනය කර නොමැති පැරණි ජර්මානු පෞද්ගලික නිදහසේ, ප්‍රාදේශීය ස්වයං පාලනයේ සහ අධිකරණමය උසාවි මගින් හැර වෙනත් ආකාරයේ වූ ඇඟිලිගැසීම් වලින් තොර ස්වාධීනත්වයේ හොඳම කොටස කාලාන්තරයක් තිස්සේ රැකගත්තා වූද, ඒවා ඇමරිකාවට හා යටත් විජිත වලට පතුරුවා හැරියා වූද, එකම නීතිය ඒ ඉංග්‍රීසි නීතියම බව අපි අමතක නොකළ යුත්තෙමු.

නැවතත් අපේ බ්‍රිතාන්‍ය ධනපතියා වෙත ආපසු එමු. මහා දේශීය රාජාණ්ඩුවල ආධාරයද ඇතිව, ප්‍රංශ යටත් විජිත අත්පත් කර ගැනීමට, ප්‍රතිපාක්ෂික මුහුදු බලවතෙක් ලෙස පාන අන්තිම බොරු පන්කම් අවසානයක් කිරීමටත් ප්‍රංශ විප්ලවයෙන් ඔහුට ලැබුණේ මාහැඟි අවස්ථාවකි. ඔහු එයට විරුද්ධව සටන් කිරීමට හේතුවූ එක් කරුණක් එය යි. එම විප්ලවයේ වාරය ඔහුගේ ගති සිරිත්වලට බෙහෙවින් පටහැනි වීම තවත් කරුණකි. එහි "තුච්ඡ" ත්‍රස්තවාදය පමණක් නොව බ්‍රිතාන්‍ය ධනපතියා පුරුදුව සිටි ආචාර විධි ඔහුට උගඅන්වූ ඔහුට මෝස්තර නිර්මාණය කර දුන් ස්වදේශයේ සාමය ආරක්ෂා කළ යුද්ධ හමුදාට සහ

නාවුක හමුද්‍රාවට නිලධාරීන් සම්පාදනය කළ යටත් විජිත රටවල් අත්පත් කරගත් සහ අළුත් විදේශ වෙළද පොළවල් අත්පත් කරගත් ඔහුගේ වංශාධිපතියන් ගැන ඔහු කළ යුත්තේ කුමක්ද? ධනපති පංතියේ ප්‍රගතිශීලී අල්පතරයක්ද වූ බව සැබවි. ඒ බේරුම්කර ගැනීමේදී ස්වකීය අයිතිවාසිකම් මනාසේ ආරක්ෂා කිරීමක් නොලද අල්පතරය ය. ප්‍රධාන වශයෙන් ධනවත් මධ්‍යම පංතියෙන් සමන්විත වූ මෙම කොටස විප්ලවයට අනුකූලතාවය දැක්වුවද, ඔවුහු පාර්ලිමේන්තුව තුල බල රහිත වූහ.

මේ අනුව ද්‍රව්‍යවාදය ප්‍රංශ විප්ලවයේ ලබ්ධිය බවට පත් වූ අත දෙවියන්ට බය ඉංග්‍රිසි ධනපතියා ඔහුගේ ආගම තවත් තර කොට බදා ගත්තේය. පොදු ජනතාවගේ ආගමික සහජාසය නැතිව ගිය තැන පැන නගින්නේ කුමක්ද යන්න යන්න පැරිසියේ අභිසේක ලත් ත්‍රස්තයෙන් ඔප්පු නොවුයේද? ප්‍රංශයේ සිට ද්‍රව්‍යවාදය තවතවත් රටවලට පැතිර යත්ම, එය ඒ සමාන ධර්ම ධාරාවන්ගෙන් විශේෂයෙන්ම ජර්මන් දර්ශනවාදයෙන් පෝෂණය වත්ම ද්‍රව්‍යවාදය හා නිදහස් චින්තනය මහා ද්වීපිත දේශයන්හි වියතෙකුට අවශ්‍ය සුදුසුකමක් බවට ඇත්ත වශයෙන්ම පත් වෙත්ම ඉංග්‍රිසි මධ්‍යම පංතිය එහි විවිධාකාර ආගමික ලබ්ධි කෙරෙහි තවත් තදින් එල්බ ගත්තේය. මෙම ලබ්ධි එකක් අනිකට වඩා වෙනස් විය හැකිය. එහෙත් ඒ සියල්ලම නිසැකවම ආගික ක්‍රිස්ත්‍රියානි ලබ්ධි විය.

විප්ලවය විසින් ප්‍රංශයේ ධනපති පංතියේ දේශපාලන විජයග්‍රණය සහතික කරනු ලබද්දී එංගලන්තයේ වට් ආක්රයිට් කාට්රයිට් ස වෙනත් අය කාර්මික විප්ලවයට මුල පිරූහ. එම කාර්මික විප්ලවය නිසා ආර්ථික ගුරුත්වාකර්ෂණ කේන්ද්‍රය සම්පූර්ණයෙන්ම වෙනස් වුයේය. ඉඩම් හිමි වංශවතුන්ට වඩා සැලකිය යුතු තරම් වෙගයකින් ධනපති පංතියේ ධනය වැඩි වී ගියේය. ධනපති පංතිය තුළම වුවද කර්මාන්ත කරුවන් විසින් මුල්‍ය වංශාධිපතීන් බැංකු කරුවන් ආදීන් තවතවත් පසුබිමට තල්ලු කරන ලදී. 1689 වර්ෂයේ බේරුම් කර ගැනීම ධනපති පංතියට වාසි වන සේ ක්‍රමික වශයෙන් වෙනස් වීමෙන් පසුව වුවද එය එයට සම්බන්ධවු පාර්ශවකරුවන්ගේ සාපේක්ෂ ප්‍රතිස්ඨාවන්ට තවදුරටත් නොගැලපෙන තත්වයක් ඇති විය. එම පාර්ශවයන්ගේ ස්වභාවය පවා වෙනස් වී තිබුණේය. 1830 වර්ෂයේ ධනපති පංතිය කලින් ශතවර්ෂයේ ධනපති පංතියට වඩා බොහෝ වෙනස් විය. වංශාධිපතියන් වෙත තවමත් ඉතිරිව තිබුණු හා නව කාර්මික ධනපති පංතියේ උජාරු හිමිකම් පෑමට ප්‍රතිරෝධනය දැක්වීම සඳහා යොදාගන්නා ලද දේශපාලන බලය නව ආර්ථික අවශ්‍යතාවයන් හා සමග අසංගතියට පත් වුයේ ය. වංශාධිපතියන්ට එරෙහිව නව අරගලයක් අවශ්‍ය විය. එය කෙළවර විය හැකිව තිබුනේ නව ආර්ථික බලවේගයේ ජයග්‍රහණයෙන් පමණකි. 1830 ප්‍රංශ විප්ලවයේ ආවේගය යටතේ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ පණත[23] සම්මත කරන ලද්දේ ප්‍රතිරෝධය මධ්‍යයේ ය. එයින් ධනපති පංතියට පාර්ලිමේන්තුව තුළ බලවත් සහ පිළිගත් තත්වයක් ලැබුණේය. ඊළගට අවසාන වශයෙන් සහ නිශ්චිත වශයෙන් ඉඩම් හිමි වංහාධිපතියන් අභිබවා ධනපති පංතියට විශේෂයෙන්ම එහි ඉතාමත් ක්‍රියාකාරී කොටස වූ කර්මාන්ත කරැවන්ට අදිපතිත්වය ලබා දෙමින් දාන්‍ය නීති[24] අවලංගු කරන ලදී. මෙය ධනපති පංතියේ ශ්‍රෙෂ්ඨම ජයග්‍රහණය විය. කෙසේ හෝ වේවා තමන්ගේම තනි යහපත සඳහා ය දිනාගත් අවසාන ජයග්‍රහණය වුයේ ද එයයි. ඉන් පසුව එය ලබා ගත් කුමන ජයග්‍රහණයකදී වුව එය ප්‍රථමයෙන් තම මිත්‍රයා වු එහෙත් කල් නොයවාම ප්‍රතිපාක්ෂික වුව එය ප්‍රථමයෙන් තම මිත්‍රයා වු එහෙත් කල් නොයවාම ප්‍රතිපාක්ෂික වු අළුත් සමාජ බලවේගයක් සමග බෙදා ගැනීමට ධනපති පංතියට සිදුවිය.

කාර්මික විප්ලවය විශාල කර්මාන්තකාර ධනපති පංතියක් ඇති කර තිබුණි. කාර්මික විප්ලවය කර්මාන්තයේ අංශයක් අංශයක් පාසා එහි ග්‍රහණය පැතිර වු අනුපාතය අ◌ුවම මෙම පංතියේ සංඛ්‍යාව ක්‍රමිකවශයෙන් වැඩී ගියේය. එම අනුපාතයෙන්ම එහි බලයද වැඩින. 1824 තරම් ඈත කාලයක වැඩ කර ජනයාගේ සමාගම් ඇති කිරීම තහනම් කරන පණත් අකමැත්තෙන්ම අවලංගු කිරීමට පාර්ලිමෙන්තුවට බල කිරීමෙන්[25] මෙම බලයේ

මහිමය ඔප්පු කරන ලදී. ප්‍රතිශංස්කරණ උද්ඝෝෂණයේදී ප්‍රතිසංස්කරණ පක්ෂයේ රැඩිකල් අංශය සමන්විත වුයේ වැඩකරන ජනයාගෙනි 1832 වර්ෂයේ පණතින් ඔවුනට ඡන්ද බලය නොදී පිටමං කර තබන ලදින් ඔවුන් තමන්ගේ ඉල්ලීම් මහජන ප්‍රඥප්තිය[26] මගින් ඉදරිපත් කොට මහා ධනපති ධාන්‍ය නීති විරෝධි සංගමයට[27] විරුද්ධව ස්වාධීන පක්ෂයක් වශයෙන් නූතන සමයේ ප්‍රථම වැඩකරන ජනතා පක්ෂය වන චාටිස්ට් පක්ෂය වශයෙන් සංවිධානය වූහ.

ඊළගට 1848 පෙබරවාරි සහ මාර්තු මහා ද්විපික විප්ලව ඇති විය. ඒවායේදී වැඩ කරන ජනතාව ඉතාමත් ප්‍රමුඛ කාර්ය කොටසක් ඉටු කළ අතර යටත් පිරිසෙයින් පැරීසියේදී පමණක් වත් ඔවුහු ධනපති සමාජයේ දෘෂ්ටි කෝණයෙන් පිළිගත නොහැකි වන ඉල්ලීම් ඉදිරිපත් කළහ. අනතුරුව ඊට විරුද්ධව පොදු ප්‍රතිචාරයක් ඇති විය. ප්‍රථයෙන්ම 1848 අප්‍රියෙල් 10 දින චාටිස්ට් වරුන්ගේ පරාජයද එම වර්ෂයේම ජුනි මාසයේදී පැරීසියේ වැඩ කරන ජනතා කැරැල්ල මර්දනය කිරීමද ඊළගට 1849 දී ඉතාලියේ හංගෙරියාවේ සහ දකුණු ජර්මනියේ මහා විනාශයන්ද අවසානයේ 1851 දෙසැම්බර් 2 වැනි දි පැරීසිය යටපත් කරමින් ලුවි බොනපාට් ජයග්‍රහණය අත්පත් කර ගැනීමද සිදුවිය. තාවකාලිකව හෝ වුව යළි යළිත් කරදර දෙන කම්කරු පංතිය එඩිය මැඩලන ලදී. එහෙත් ඒ මොන තරම් අලාභ හානි සහිතවද පොදු ජනතාව ආගමික හැගීමෙන් තබා ගැනීමේ අවශ්‍යතාවය ගැන බ්‍රිතන්‍ය ධනපතියාට කලින් අවබෝධ වී තිබිණි නම් මෙ අත්දැකීම් සියල්ලෙන්ම පසුව ඔහුට එම අවශ්‍යාතාවය කොතරම් වැඩියෙන් දැනී යා යුතුද? ඔහුගේ මහා දුවිපික සමානයන්ගේ විරිත්තීම ගැන නොතකා පහළ සමාජ පංතිය අතර ආගම් භක්තිය පැතිරවීම සදහා ඔහු අවුරුදුපතා දහස් ගණන් සහ දස දහස් ගණන් මුදල් වියදම් කළේයතමන් ගේම දේශීය ආගමික යන්ත්‍රයෙන් නොසැනසුන ඔහු ව්‍යාපාරයක් වශයෙන් ආගම සංවිධානය කිරීමෙහි විශිෂ්ටතම දක්ෂයා වු "බ්‍රදර් ජොනතන්ට"[28] ආයාචනා කොට ඇමරිකාවෙන් පුනර්ජනනවාදය[29], මූඩි, සැන්කි සහ එවැන්නක් ආනයනය කරගත්තේය. එසේම "ගැලවීමේ හමුදාවේ" භයානක ආධාරයද ඔහු භාර ගත්තේය. ආදි ක්‍රිස්තියානි ආගමේ ප්‍රචාරයට පුනර්ජීවනයක් දෙන "ගැලවීමේ හමුදාව" දේව අනුග්‍රහධාරින් වශයෙන් දුප්පතුන් වෙත ආයාචා කරන අතර ආදි ක්‍රිස්තියානි පංති විරෝධතාවයෙහි මුලිකාංයක් පෝෂණය කරන හෙයින් දැන් යට නොපැකිල මුදල් ආධාර දෙන පොහොසතුන්ට කිසියම් දිනක එයින් කරදරයක් වීමට ඉඩ තිබේ.

මධ්‍ය කාලීන යුගයේ රදළ වංශාධිපතියන් දේශපාලන බලය තනි අයිතිය අල්ලා ගෙන සිටි ආකාරයෙන්ම යුරෝපීය රටවල් එකක්වත් යටත් පිරිසෙයින් කිසියම් කාලයකට පවා දේශපාලන බලය තනි අයිතියට අල්ලා ගෙන සිටි ආකාරයෙන්ම යුරෝපිය රටවල් කක්වත් යටත් පිරිසෙයින් කිසියම් කාලකට පවා දේශපාලන බලය තමන් සතු කර ගැනීමට ධනපති පංතියට නොහැකි වීම ඓතිහාසික සංවර්ධනයේ නීතියක් සේපොනේ වැඩවසම් ක්‍රමය සම්පූර්ණයෙන්ම අකා මකා දමන ලද ප්‍රංශයේ පවා ධනපති පංතිය සමස්තයක් වශයෙන් සම්පූර්ණ දේශපාලන බලය අල්ලාගෙන සිටියේ ඉතාමත් කෙටි කාල පරිච්ඡේදතුළ පමණකි. ලුවි-ෆිලිප්ගේ පාලනය පැවති 1830 - 1848 කාලයේදී රාජධානිය ආණ්ඩු කළේ ධනපති පංතියෙන් ඉතා විශාල 1848-1851 සමස්ත ධනපති පංතියම ආන්ඩු කල නමුත් ඒ තුන්අවුරැද්දකට පමණකි. ඔවුන්ගේ අසමත්කම නිසා දෙවැනි අධිරාජ්‍යය බිඳ වැටුනේය. මුළු ධනපති පංතියම සමස්තයක් ලෙසට විසි අවුරුද්දකට වැඩි කාලයක් බලය අල්ලා ගෙන සිටියේ දැන් පවතින මෙම තුන්වැනි සමුහාණ්ඩුවේ පමණකි. ඔවුහු දැනටමත් පරිහානියේ ක්‍රියාශීලි ලක්ෂණ පෙන්වති. ධනපති පංතියේ කල්පවත්නා පාලනයක් පැතීමේ ඉඩ කඩ තිබුණේ වැඩවසම් ක්‍රමය නොදත් සහ සමාජය ආරම්භයේ පටන්ම ධනපති පදනමක් මත පටන්ගත් ඇමරිකාව වැනි රටවල පමණකි තවද ප්‍රංශයේ හා ඇමරිකාවේ පවා ධනපති පංතියේ අනුප්‍රාප්තිකයෝ එනම් වැඩ කරන ජනතාව දැනටමත් දොරට තට්ටු කරමින් සිටිති.

එංගලන්තයේ ධනපති පංතිය කිසි සලෙකත් තනි බලය නො දැරුවේය. 1832 ජයග්‍රහණය පවා ආණ්ඩුවේ ප්‍රධාන තනතුරු සියල්ලම පාහේ ඉඩම් හිමි වංශාධිපතියන්ගේ තනි අයිතියට ඉතිරි කළේය. ධනවත් මධ්‍ය පංතිය මෙයට සුවච ලෙස යටත් වීම ට වටහා ගත නොහැකි දෙයක් විය. මට එය වටහා ගත හැකි වුයේ මහා ලිබරල් කර්මාන්තකරු ඩබ්ලිව් එ. ෆොස්ටර් මහතා ප්‍රසිද්ධ කථාවක් කරමින් ඔහුගේ අත්දැකීම්වලින් උපුටා දක්වමින් යටත්පිරිසෙයින් ඉංග්‍රිස භාෂාව තරම්වත් ප්‍රංශ භාෂාව අවශ්‍ය වන සමාජයේ ඔහුට කැබිනට් ඇමතිවරයෙකු වශයෙන් ගැවසීමට සිදු වු විට ඔහු කොතරම් නම් චතික ස්වභාවයක් දැක්වුයේ දැයි කියා ලෝකයේ කල්ගෙවීමේ මාර්ගයක් වශයෙන් ප්‍රංශ භාෂාව උගෙන ගන්නා ලෙස ඔහු බ්‍රිැඩ් ෆෝඩ් හි තරුණයන්ට ආයචනා කළ කල්හිය! සත්‍ය කාරණය වුයේ එකල ඉංග්‍රිසි මධ්‍යම පංතිය නීතියක් වශයෙන්ම මෙන් සම්පූර්ණයෙන්ම නුගත් නවකයන් වු නිසා ව්‍යාපාරික තීක්ෂණභාවය විසින් පුරුදු පුහුනු කරන ලද පරිවරණක පටු ස්වභාවයට සහ පරිවරණක උඩගුකමට (ව්‍යාපාරික කටයුතුවලදී වුවද උඩගුකම සහ ජාතික උමතුව ඉතා දුර්වල උපදේශකයෙකි මේ මෑතක් වන තෙක්ම ඉංග්‍රිසි කර්මාන්ත කරුවා කල්පනා කළේ තමන්ගෙම භාෂාවෙන් හැර වෙනත් භාෂාවකින් කථා කිරීම ඉංග්‍රිසි මිනිසාට අවනම්බුවක් බවය. එපමණක් නොව විදේශික "දුප්පත් යකුන්" එංගලන්තයේ පදංචි වීම සහ එමගින් ස්වකීය භාණ්ඩ විදේශයේ අලෙවි කිරීමේ කරදරය අඩු වීම එසේ නොවීට වඩා සුදුසු දෙයක් සේ සලකා එය එක්තරා ප්‍රමාණයට ආඩම්බරයට කරුණක් ලෙසද ඔහු සැලකීය. මෙම විදේශකයන් වැඩි වශයෙන්ම ජර්මානුන් වු බවත් ඔවුන් එමගින් බ්‍රිතන්‍ය විදේශ වෙළඳාමෙහි ආනයනයෙහි සහ අපනයනයෙහි විශාල කොටසක් තමන්ගේ බලයට හසු කරගත් බවත් එනිසා ඉංග්‍රිසි ජාතිකයාගේ සෘජු විදේශ වෙළඳාම සීමා වු බවත් එය යටත් විජිතවලට චීනයට එක්සත් ජනපදයට සහ දකුණු ඇමරිකාවට පමණක්ම මෙන් සීමා වු බවත් ඔහු කිසි කලෙකත් නොදිටීය. මෙම ජර්මානුන් ලෝකයේ සෑම තන්හිම සම්පූර්ණ වාණිජ ජනපද ජාලයක් සංවිධානය කළ විදේශවල ව වෙනත් ජර්මානුන් සමග වෙළඳාම් කළ බවද ඔහු දුටුවේ නැත. නමුත් අවුරුදු හතළිහකට පමණ පෙර ජර්මනිය අපනයනය සඳහා බරපතල ලෙස නිෂ්පාදනය පටන්ගත් කල ඇය ධන්‍ය අපනයන රටක තත්වයේ සිට ප්‍රථම පෙළේ කාර්මික රටක තත්වයට පරිවර්තනය වීම සඳහා මෙම ජනපද පාලය ඇයට ඉතාමත් ප්‍රයෝජනවත් විය. අනතුරුව අවුරුදු දහයකට පමණ පෙර බියගත් බ්‍රිතාන්‍ය කර්මාන්ත කරුවා තමන්ගේ ගනුදෙනු කරුවන් එක් කොට තබා ගත නොහැක්කේ මන්ද යන්න විදේශවල සිටින ඔහුගේ තානාපති වරුන්ගෙන් සහ කොන්සල් වරුන්ගෙන් විමසීය. එයට ලැබුණු ඒකමතික පිළිතුර වුයේ මෙයයි. 1 - ඔබ ඔබගේ ගනුදෙනු කාරයාගේ බස ඉගෙන නොගන්නා නමුත් ඔහු ඔබේම භාෂාව කථා කළ යුතු යැයි ඔබ අපේක්ෂා කරන්නෙහිය. 2 - ඔබ ඔබගේ ගනුදෙනු කාරයාගේ අවශ්‍යතාවයන් පුරුදුකම් හා රුචිකත්වයන් සමග ගැලපෙන්නට උත්සාහයක්වත් නොකරන නමුත් ඔහු ඔබගේම ඉංග්‍රිසි අවශ්‍යතාවයන් පුරුදුකම් සහ රුචිකත්වයන් අනුව කටයුතු කළ යුතුයයි ඔබ අපේක්ෂා කරන්නෙහිය) වඩා වෙනත් සුදුසුකම් අවශ්‍ය වන උසස් ආණ්ඩු තනතුරු වංශාධිපතීන්ට ඉතිරි කර තැබීම හැර වෙනත් දෙයක් කිරීමට ඔවුනට නොහැකි වීමයි. දැන් පවා ප්‍රවෘත්ති පත්‍ර මගින් මධ්‍යම පංතියේ අධ්‍යාපනය (middle-class education) ගැන කෙරෙන කෙළවරක් නැති විවාදවලින් පෙනෙන්නේ හොදම අධ්‍යාපනය ලැබීම සඳහා තමන් තවමත් සුදුසු නැතැයි ඉංග්‍රිසි මධ්‍ය පංතිය කල්පනා කරන බව හා ඊට වඩා අඩු ප්‍රමාණයේ යමක් සොයා ගැනීමට ඔවුන් විපරම් කරන බවත්ය. ඒ අනුව ධාන්‍ය නීති අවලංගු කිරීමෙන් පසුව වුවද ඒ සඳහා සටන් කර ජය අත්පත් කරගත් කොබ්ඩන්ලා බ්‍රයිට්ලා ෆෝස්ටර් ආදීන්ට රටේ නිල ආණ්ඩුවෙන් කොටසක් භාර නොදී ඔවුන් ඉන් පිටතතැබීම සාමාන්‍ය දෙයක් ලෙස පෙනුනි. එහි වෙනසක් ඇති වූයේ ඉන් ඉක්බිතිව විසි අවුරුද්දක් ගෙවී ගිය තැන නව ප්‍රතිසංස්කරණ පනතකින්[30] ඔවුනට අමාත්‍ය මන්ඩලයේ දොර විවෘත වීමෙන් පසුව පමණකි. ඉංග්‍රිසී ධනපතියා තුල ගැඹුරට කිදා බැස තිබෙන සමාජ හිමානයක් අද දක්වාම පවතින නිසා ඔවුහු රාජ්‍ය කාර්යන්හිදී ජාතිය වෙනුවෙන් ගෞරව සහිතව පෙනී සිටීම සඳහා ආභරණයක් බදුවන අලස කුලයක් තමන්ගේ සහ ජාතියේ වියදමින් නඩත්තු කරති. ඇත්ත වශයෙන්ම තමන් විසින්ම නිෂ්පාදනය කරන ලද මෙම සුවිශේෂ හා වරප්‍රසාද ලත් පිරිසට තමන් අතරින්

එකකු වැද්ද ගැනීමට තරම් සුදුසු වූ විටෙක එය මහත් ගෞරවයක් සේ ධනපතියෝ සැලකූහ.

එනිසා ඉඩම් හිමි වංශාධිපතියන් සම්පූර්ණයෙන්ම දේශපාලන බලයෙන් ඉවත් කර දැම්මටකාර්මික සහ වාණිජ මධ්‍යම පංතිය සමත් වීමට පෙර තවත් තරග කරුවෙක් එම් කම්කරු පංතිය වේදිකාවට වන්නේය. චාටිස් ව්‍යාපාරයට සහ මහාද්වීපික විප්ලවයන් සම්බන්ධයෙන් දක්වන ලද ප්‍රතිචාරයද 1848-1866 කාලයේදී (සාමාන්‍යයෙන් හුදෙක්ම නිදහස් වෙළඳාම නිසා යයි කියතත් ඊට වඩා දුම්රිය මාර්ගවල සමුද්‍ර තරණය කරන දුම් නැව්වල සහ පොදු වශයෙන් ගනුදෙනු මාධ්‍යන්ගේ යෝධමය සංවර්ධනය නිසා) ඉංග්‍රිසි වෙළඳාම පෙර නොවූ විරූ පරිද්දෙන් ව්‍යාප්ත වීමද නිසා නැවතත් කම්කරු පංතිය ලිබරල් පක්ෂයේ පිහිට ලබන තත්වයට යොමු කරන ලදින් ඔවුහු චාටිස්ට් කාලයට පෙර මෙන් එි රැඩිකල් අංශයක් ඇති කළහ. කෙසේ හෝ වේවා ඡන්ද බලය සඳහා ඔවුන් කියන අයිතිවාසිකම් ඉවත ලිය නොහැකි තත්වයක් ඇති විය. ලිබරල්වාදීන්ගේ විග් නායකයන් ඒ ගැන බියක් දැක්වූ අතර වාසිදායක අවස්ථාවකින් ප්‍රයෝජන ගනිමින් බරෝ ප්‍රදේශවල ගෘහ මූලික ඡන්ද බලය (househoid suffrage) ක්‍රියාත්මක කිරීමට සහ ආසන නැවත බෙදා වෙන් කිරීමට ටෝරි[31] පාක්ෂිකයන් පෙළඹවීමෙන් ඩිසේරලි ඔහුගේ විශිෂ්ටත්වය පෑවේය. ඉන් අනතුරුව රහස් ඡන්දය ඇතිවිය[32] නැවත 1884 දී ගෘහ මූලික ඡන්ද බලය කවුන්ටි ප්‍රදේශ දක්වා පුළුල් කිරීම සහ මැතිවරන දිස්ත්‍රික්ක එක්තරා දුරකට සමාන වන ආකාරයට ආසන නැවත බෙදා වෙන් කිරීමද සිදු කෙරින. මේ සියලු පියවරයන්ම කම්කරු පංතියේ මැතිවරණ බලය සැලකිය යුතු තරමින් වැඩි කළේය. වත් පිරිසෙයින් ආසන 150 සිට 200 දක්වා වූ ගණනක වත් බහුතර ඡන්ද දායකයන් සංඛ්‍යාව ම පංතියේ සැපයෙන තරමට ම වැඩි වීම සිදුවිය. නමුත් පාර්ලිමේන්තු ආන්ඩුව යනු සම්ප්‍රදායයන්ට ගරුකිරීමට උගන්වන ප්‍රධාන පාසැලකි අපගේ පැරණි වංශාධිපතියන් යනුවෙන් ජෝන් මැනර්ස් සාමි වරයා විසින් කවටකමට මේ සඳහන් කරන ලද පිරිස කෙරෙහි මධ්‍යම පංතිය බියක් සහ ගෞරව සම්ප්‍රයුක්ත බවක් දැක්වූයේ නම් කම්කරුවන් ඔවුන්ගේ ප්‍රධානින් වශයෙන් හැදින්වීමට පුරුදුව සිටි මධ්‍යම පංතිය කෙරෙහි දැක්වූයේ ගරුසරු බවක් හා සැලකිල්ලකි. අවුරුදු පහළොවකට පමණ පෙර ඇත්ත වහයෙන්ම ආදර්ශමත් කම්කරුවෙක් වූ බ්‍රිතාන්‍ය කම්කරුවා ඔහුගේ ස්වාමියාගේ තත්වය කෙරෙහි දැක්වූ ගරු සරු සහිත තත්වයද තමන්ම සඳහා අයිතිවාසිකම් ඉල්ලීමේදී හු දැක්වූ ආත්ම මර්දන නිහතමානි භාවයද දක්නා අපගේ කතේදර්-සමාජවාදී [33] ගුරුකුලයේ අපගේ ජර්මන් අර්ථ ශාස්ත්‍රඥයින්ට සුව කළ නොහෙන කොමියුනිස්ට් සහ විප්ලවාදී ප්‍රවණතාවයන් ඇති තමන්ගේම දේශයේ වැඩ කරන ජනයා සමග සසඳන කල ඉංග්‍රිසි කම්කරුවාගෙන් ලැබුණේ අස්වැසිල්ලකි.

නමුත් හොඳ ව්‍යාපාරකයන් වන ඉංග්‍රිසි මධ්‍යම පංතිය ජර්මන් මහාචාර්යවරුන්ට වඩා දුරදීටීය. ඔවුහු අකැමැත්තෙන් වුවද කම්කරු පංතිය සමග බලය බෙදා ගත්හ. Puer robustus malitiosus එනම් ජනතාව කෙබඳු දේ කිරීමෙහි සමත් ද යන්න ඔවුන් චාටිස්ට් අවුරුදුවලදී උගෙන ගෙන තිබුණි. එනිසා එවක් පටන් එක්සත් රාජධානියේ අණපණත්වල මහජන ප්‍රඥප්තියෙන් වැඩි කොටසක් ඇතුලත් කිරීම ඔවුනට නොකර බැරි දෙයක් විය. දැන් සදාචාරමය මාර්ගයෙන් කිසි කලෙක හෝ ජනතාව සාමයෙන් තබාගැනීමට නම් ජනතාව කෙරෙහි සදාචාමය බලපෑමේ ප්‍රථම සහ ප්‍රධාන මාර්ගය ආගම වන්නේය. ආගමව පවතින්නේය. පාඨශාලා පාලක මණ්ඩලවල දේවගැතිවරුන්ගේ බහුතරයක් දක්නට ලැබෙන්නේ එහෙයිනි. ආගමික පිළිවෙත්වාදය පටන් "ගැලවීමේ හමුදාව"[34] දක්වාවූ නොයෙක් ආකාරයේ පුනර්ජනනවාදවලට ලෙවීමට ධනපතියා තමන්ටම පනවා ගන්නා බදු වැඩි වන්නේ එබැවිනි.

මෙම අවස්ථාවේදී මහා ද්වීපික ධනපති පංතියේ නිදහස් චින්තනය සහ අඩු ආගමික භක්තිය පරදවා බ්‍රිතාන්‍ය නම්බුකාරකම ජයග්‍රහණය කළේය. ප්‍රංශයේ සහ ජර්මනියේ කම්කරුවන් කැරලිකාර බවට පත් විය. ඔවුනට සමාජවාදය තදින්ම බෝවී තිබිණ. ඔවුහු

තමන්ට උසස් තත්වයක් ලබා ගැනීම සඳහා අනුගමනය කළ මාර්ගවල නීති සහගත භාවය ගැන ඉතාමත් සහේතුකවම කිසිම සැලකිල්ලක් නොදැක්වූහ. මෙහිදී puer robustus(හැඩි දැඩි කොල්ලා - සංස්කාරක) දිනෙන් දිනම තවත් malitiosus(ද්වේශ සහගත - සංස්කාරක) විය. ආඩම්බර ලීලාවෙන් සුරුට්ටුවකුත් දල්වාගෙන නැවකට නැගුනු තරුණයෙකුට මුහුදු කැරකිල්ල හැදෙන විට ඔහු පත්තුවන සුරුට්ටුව හෙමින්ම විසි කරන සේ ප්‍රංශ සහ ජර්මන් ධනපති පංතියටද ඔවුන්ගේ නිදහස් චින්තනය නිඩ ලෙස අත්හැර දැමීම හැර අන්තිම පිළියම වශයෙන් කළ හැකිවෙනත් කිසිවක් නොවීය. ගරහන්නන් එකින් එකා බාහිර හැසිරීමෙන් ධාර්මිෂ්ඨ බවක් පෙන්වූහ. පල්ලියට එහි මත වාදයන්ට හා පුද පූජාවලට ගෞරවයක් දක්වමින් කථා කළහ. පමණක් නොව ආගමික පුද පූජාවට අනුකූල වීමට නොවැලැක්විය හැකිවූ තාක් දුරට ඒ අනුව කටයුතු ද කළහ ප්‍රංශ ධනපතියන් සිකුරාදා දිනවල maigre (මස් මාංශ තොර - සංස්කාරක) ආහාර ගත් අතර ජර්මන් ධනපතියන් ඉරිදා දිනවල පල්ලියේ අසුන් මත හිදගෙන දීර්ඝ ප්‍රොතෙස්තන්ත දේශනාවලට සවන් දුන්හ. ඔවුහු ද්‍රව්‍යවාදයෙන් මහත් අපදාවට පත් වූහ. "Die Religion muß Volk erhalen warden" ජනතාව සඳහා ආගම ප්‍රාණවත්ව තබාගත යුතුය සමාජය අන්ත විනාශයෙන් මුදා ගැනීමට තිබුණු එකම සහ අන්තිම මාර්ගය එයයි. ඔවුන්ගේ අවාසනාවට මෙන් ආගම සඳහටම කඩා කප්පල් කර දැමීමට වුන්ට හැකි සියල්ලම කර අවසාන වන තෙක් ඔවුන්ට මෙය සොයා ගත නොහැකි විය. නිසා දැන් අවඥාවෙන් විලිස්සා මෙසේ කීමේ අවස්ථාව බ්‍රිතාන්‍ය ධනපතියාට ලැබින ඇයි මෝඩයිනි අවුරුදු දෙසීයකට පෙර මට මෙය නුබලාට කිව හැකිව තිබුණි.

නමුත් බ්‍රිතාන්‍ය ධනපතියන්ගේ ආගමික මුග්ධකම නිසා වත් මහා ද්විපික ධනපති පංතියේ pos fesum (උත්සවයට පසුව, නැතහොත් කල් පසුවී - සංස්කාරක) සාකච්ඡාව මගින්වත් නැගී එන නිර්ධන පංති වඩදිය වැලැක්විය නොහැකියයි මම අදහස් කරමි. සම්ප්‍රදාය මහත් ප්‍රමාදකාරී බලවේගයකි. ඉතිහාසයෙහි vis inertiae (ඒකාකාර කරන බලවේගය - සංස්කාරක) එයයි එහෙත් එම හුදෙක්ම අකර්මන්‍ය බලවේගයක් වන නිසා එය නිසැකවම බිඳ දමනු ලැබෙනු ඇත. ඒ අනුව බලන කල ආගම ධනපති සමාජයට සදාකාලික ආරක්ෂාවක් නොවනු ඇත. අපගේ නෛතික දාර්ශනික සහ ආගමික අදහස් නිශ්චිත සමාජයක පවතින ආර්ථික සම්බන්ධකම්වලින් ඒවාට අඩු වැඩි දුරකින් පැන නගින රිකිලි වන හෙයින් මෙම සම්බන්ධකම් සම්පූර්ණයෙන්ම වෙනස් වීම නිසා පැන නගින ප්‍රතිඵලවලින් කල් යාමේදී මෙල්ල නොවී සිටීමට එම අදස්වලට නොහැකිය. අද්භූත ප්‍රාතිහාර්යය ගැන අපි විශ්වාස කරමු නම් මිස පුපුරා හැලෙනසමාජයකට රුකුල් දී නගා සිටු වීමට ආගමික ප්‍රතිපත්ති කිසිසේත් නොසෑහෙන බව අපි පිළිගත යුත්තෙමු.

ඇත්ත වශයෙන්ම එංගලන්තයෙහි පවා වැඩ කරන ජනතාව නැවතත් ක්‍රියාත්මක වීමට පටන්ගෙන තිබේ. ඔවුන් නොයෙක් වර්ගයේ සම්ප්‍රදායන්ගෙන් බැදී සිටින බවට සැකයක් නැත. තිබිය හැක්කේ පක්ෂ දෙකක් පමණකැයිද ඒ කොන්සවට්ව් සහ ලිබරල් පක්ෂ යයිද කම්කරු පංතිය එහි විමුක්තිය සකස් කරගත යුත්තේ මහා ලිබර්ල් පක්ෂ මගිනැයිද යන පුළුල් ලෙස පැතිරී ගිය විශ්වාසය වැනි සම්ප්‍රදායන් ඇත. ස්වාධීන ක්‍රියාකාරීත්වය සඳහා කම්කරු ජනතාව දැරූ ප්‍රථම තාවකාලික ප්‍රයත්නයන්ගෙන් උරුම කොටගත් විධිමත් ආධුනිකත්වයක් නිම කර නොමැති සියලු ඉල්ලුම් කරුවන් වෘත්තිය සමිති බොහෝ ගණනකටම වැද්ද නොගෙන ඔවුන් පිටමං කර තැබීම වැනි වැඩ කරන ජනතාවගේ සම්ප්‍රදායන්ද ඇත. එයින් අදහස් කෙරෙන්නේ එම සංගම් විසින් ඒවායේ හොරිකඩයන් බෝ කරන වගයි. මහාචාර්ය බ්‍රෙන්ටානොට පවා ඔහුගේ සහෝදර කතේදර සමාජවාදීන් වෙත ශෝකී ලෙස වාර්ථා කිරීමට සිදුවු පරිදි[35] මේසියල්ල එසේ තිබියදී ඉංග්‍රිසි කම්කරු පංතිය ක්‍රියාත්මක වෙමින් පවතී. එංගලන්තයේ වන සියළු දේ මෙන්ම එයද හෙමින් සීරුවේ පියවර මනින ආකාරයෙන් තැනකදී පැකිලෙමින් අන් තැනකදී අඩු වැඩි වශයෙන් ප්‍රතිපල සහිත තාවකාලික ප්‍රයත්න දරමින් ක්‍රියාත්මක වෙයි. ඉදහිට වැඩි ප්‍රවේශමට සමාජවාදය යන නම ගැන අවිස්වාශ උපදවමින් ඒ අතරම එහි සංධාරය උකහාගනිමින් එය ක්‍රියාත්මක වේ. එසේ

පැතිරී යන ව්‍යාපාරය ස්ථරයෙන් ස්ථරය කම්කරුවන් ග්‍රහණය කරයි. එය ලංඩන් ඊස්ට් එන්ඩ්[36] ප්‍රදේශයේ නුපුහුණු කම්රුවන් ඔවුන්ගේ නිදාවෙන් අවදි කළේය. අනික් අතට මෙම අළුත් බලවෙගයන් එම ව්‍යාපාරයට දී තිබෙන්නේ කුමන නම් ආවේගයක්ද යන්න අපි සියළු දෙනාම දන්නෙමු. එම නිසා ව්‍යාපාරයේ වේගය කිසියම් පිරිසකගේ නොවිසිලිමත් කමට ගැලපෙන තරම් ප්‍රමාණවත් නොවේ නම් ඉංග්‍රිසි චරිත ස්භාවයේ හොදම ගතිගුණ ජීවමාණව රැක ගන්නේ කම්කරු පංතිය බවත් එමෙන්ම එංගලන්තයේදී වරක් ඉදිරියට තබන පියවරක් නීතියක් වශයෙන් නැවත නැති නොවන බවත් ඔවුන් අමතක නොකල යුතුය. ඉහත සදහන් කරන ලද හේතු නිසා චාටිස් වරුන්ගේ පුතුන් අවශ්‍ය තරමටම සමත් නොවුනි නම් ඔවුන්ගේ මුණුපුරන් ස්වකීය මුතුන් මිත්තන්ගේ ගෞරවය රකිනු ඇත.

නමුත් යුරෝපීය කම්කරු පංතියේ ජයග්‍රහණය එංගලන්තය මත පමණක් රදා පවතින්නක් නොවේ. එය අත්පත් කරගත්තේ යටත් පිරිසෙයින් එංගලන්තයේ ප්‍රංශයේ සහ ජමනියේ හෝ සහයෝගයෙනි. පසු කී රටවල් දෙකෙහිම කම්කරු පංති ව්‍යාපාරය එංගලන්තයට වඩා බොහෝ ඉදිරියට ගොස් ඇත. ජමනියේ එය සාර්ථකත්වයට පැමිණිය හැකි දුරකින් සිටින තරමට පවා එයට ආසන්න වී ඇත. පසු ගිය විසිපස් වසර තුල එය ලබාගත් ඇති වර්ධනය පෙර නොවු විරුය. ජර්මන් මධ්‍යම පන්තිය කණගාටුදායක ලෙස දේශපාලනික හැකියාවෙන් විනයෙන් ධෛර්යයෙන් ශක්තියෙන් සහ නොපසු බස්නා වීර්යයෙන් අඩු බව ඔවුන් පෙන්නුම් කර තිබේ. නම් ජර්මන් කම්කරු පංතිය තුළ මෙම ගතිගුණ පවතින බව එය මනා සේ ඔප්පු කර තිබේ. අවුරුදු හාරසියයකට පෙර ජර්මනිය යුරෝපයේ මධ්‍යම පංතියේ ප්‍රථම උත්ක්ෂේපණයේ ආරම්භක ස්ථානය විය. දැන් තිබෙන තත්වය අනුව ජර්මනිය යුරෝපීය නිර්ධන පංතියේ ප්‍රථම ජයග්‍රහණයේ භූමිය වීම හැකියාවේ සීමාවෙන් පිටත දෙයක්ද?

1892 අප්‍රියෙල් 20
එෆ්. එංගලස්

ඉංග්‍රිසි බසින් ලියන ලද මුල් හැදින්වීමේ අනුවාදයකි.

## පළමු කොටස

සාරානුකූල වශයෙන් නවීන සමාජවාදය ජනිත වුයේ එක් අතකින් ඇත්තන් හා නැත්තන් අතර නම් ධනපතියන් සහ වේතන කම්කරුවන් අතර අද සමාජයේ පවත්නා පංති සතුරුකමද අනික් අතින් නිෂ්පාදනයේ පවතින අරාජිකභාවයද තත් ලෙසින් පිලිගැනීමේ ඒකාන්ත ප්‍රතිඵලයක් ලෙසටය. එසේ වුවද නවීන සාජවාදයේ න්‍යයික ආකෘතිය මුලින්ම ඉදිරිපත් වුයේ දහ අට වැනි ශතවර්ෂයේ ශ්‍රේෂ්ඨ ප්‍රංශ දර්ශනවාදීන් නම නියම කළ ප්‍රතිපත්තිවල වඩාත් තර්කානුකූල ව්‍යාපීකරණයක ස්වරූපයෙනි. සෑම නව න්‍යායකට මෙන්ම සමාජවාදයටද එහි වටපිටාවෙහි වු බුද්ධිමය අලෙවි භාණ්ඩ සමග සම්බන්ධයක් ඇති කර ගැනීමට ප්‍රථමයෙන් සිදුවිය. එසේ වුවද එහි මුල් ගැඹුරට විහිදී තිබුණේ ද්‍රව්‍යමය ආර්ථික කරුණු තුලය.

ඉදිරියේ එන විප්ලවය සදහා ප්‍රංශ ජනයාගේ සිත් සතන් සුදානම් කළ ඒ ශ්‍රේෂ්ඨ මිනිසුන් තමනුදු අත්‍යන්තයෙන්ම විප්ලවාදීන් විය. ඔවුහු කිසිම වර්ගයක කිසිම බාහිර අධිකාරයක් පිළි නොගත්හ ආගම ස්භාවික විද්‍යාව සමාජය දේශපාලන ආයතන යන මේ සිල්ලම ඉතාමත් ක්ෂමා රහිත විවේචනයට විසය කාරණා විය. ඒ සියල්ලක්ම තර්ක බුද්ධියේ විනිශ්චයාසනය හමුවේ ස්වකීය පැවැත්ම සාධාරණ කර පෙන්විය යුතුය. නැතහොත් පැවැත්ම අත් හළ යුතුය. තර්ක බුද්ධිය සියල්ලම මනින එකම මිම්ම බවට පත් විය. ලෝකය ඔළුවෙන් සිට ගෙන ඇතැයි හේගල් ප්‍රකාශ කළ කාලය එය විය. (ප්‍රංශ විප්ලවය ගැන වු මෙ කොටස මෙසේය. නීතිය පිළිබද චින්තනය සහ අවබෝධය <u>එක් වරම</u> පිළි ගැනුණු අතර එයට විරුද්ධව නැගී සිටීමට හැකියාවක් අවනිතිය පිළිබද වු පැරණි දිරාගිය පලංචියට නොවීය. එනිසා මෙම නීතිය පිළිබද වු සංකල්පයෙන් දැන් ව්‍යවස්ථාවක් ස්ථාපිත කර තිබේ. මෙතැන් පටන් සියල්ලම ඒ මත පදනම් විය යුතුය. සූර්යයා දෙව් ලොව සුරක්ෂිතාගාරයේ සිටි තාක් සහ ග්‍රහ තාරකා ඔහු වටා යමින් සිටි තාක් කල් මිනිසා ඔහුගේ හිසෙන් එනම් අදහස් මත සිට මෙම පිළිරුව අනුව යථාර්ථය ගොඩ නගනු කිසි කළෙකත් නොදක්නා ලදී. Nus නැතහොත් ඥාන ලොව පාලනය කරතියි ඇනක්සගෝරස් ප්‍රථමයෙන් කීය. නමුත් දැන් පළමු වතාවට පරමාදර්ශයෙන් මානසික යථාර්ථය පාලනය විය යුතුය යන්න පිලිගැනීමට මිනිසා යොමු වී ඇත. එකල මිනිසුන් <u>පරමෝදාර චිත්තාවෙගයකින්</u> ඔද වැඩී ගිය අතර දේව ප්‍රතිපත්තිය ලෝකය හා සමග සැසදුනු කලෙක මෙන් <u>තර්කයේ උද්වේගයෙන්</u> ලොවම ඇලලී ගියේය. (හේගල් "ඉතිහාසය පිළිබද දර්ශනය" 1840 පිටුව 535) - නැසීගිය මහාචාර්ය හේගල්ගේ මෙවැනි පෙරළිකාරී සහ පොදු වශයෙන් අන්තරායකාරී වන උගැන්වීම්වලට විරුද්ධව සමාජවාදීන්ට විරුද්ධ නීතිය[37] ක්‍රියාත්මක කිරීමට ඉතාමත් සුදුසු කාලය දැන් පැමිණ තිබෙනවා නොවේද?) ප්‍රථමයෙන් සියලුම මිනිස් ක්‍රියා සහ සමාගමයන් සදහා පදනම වුයේ මිනිස් හිස සහ එහි චින්තනයෙන් බැස ගන්නා ලද ප්‍රතිපත්ති වෙතියි යන අර්ථයෙන්ද නමුත් කල් යත්ම මෙම ප්‍රතිපත්තිවලට ප්‍රතිවිරෝධි වන යථාර්ථය උඩු යටි හැරවිය යුතුය. යනඅර්ථයෙන්ද එසේ කියන ලදී එවකට පෙර පැවති සෑම සමාජ සහ ආන්ඩු ආකෘතියක්මත් සෑම පැරණි සම්ප්‍රදායික මති මතාන්තරයක්මත් ආතර්කික සේ සලකා පරණ බඩු දමන කාමරයට විසි කර දමන ලදී. ලෝකය මෙතෙක් තමන්ට ඉඩ දී ඇත්තේ දුර්මතයන් පසු පස යාමට පමණකි. පැරණි සියල්ලක්ම කෙරෙහි දැක්විය යුතු වන්නේ අනුකම්පාව ස පිළිකුල පමණකි. දැන් ප්‍රථම වතාවට හිරු එළිය තර්ක බුද්ධියේ රජදහන පෙනෙන්නට විය. මෙතැන් පටන් සදාකාලික සත්‍යය සදාකාලික යුක්තිය ස්වභාව ධර්මය පදනම් කර ගත් සමානාත්මතාවය හා මිනිසාට අහිමි කළ නොහැකි ඔහුගේ අයිතිවාසිකම් යන මේවා අන්ධ විශ්වාසයත් අසාධාරණයත් වරප්‍රසාදත් පීඩනයත් අභිබවා සිටියේය.

තර්ක බුද්ධියේ රජදහන යනු ධනපති පංතිය පරමාදර්ශ කොටගත් රජදහන වන බවත් මෙම සදාකාලික යුක්තිය ධනපති නීතිය වශයෙන් ක්‍රියාත්මක වු බවත් මෙම සමානාත්මතාවය නීතිය ඉදිරියේ ඇති ධනපති සමානාත්මතාවය වන සේ පහත වැටුනු බවත් ධනපති දේපළ හිමිකම් අයිතිය මුලික මිනිස් අයිතිවාසිකම් වලින් එක් බවත් තර්ක

බුද්ධියේ ආණ්ඩුව එමෙන්ම රුසෝගේ සමාජ ගිවිසුම[38] ජීයනය ලැබුවේ ප්‍රජාන්ත්‍රවාදී ධනපති සමූහාණ්ඩුවක් වහයෙන් බවත් අපි දැන් දන්නෙමු. දහ අටවැනි ශතවර්ෂයේ ශ්‍රේෂ්ඨ චින්තකයන් ඔවුන්ගේ පූර්වගාමීන් මෙන්ම ස්වකීය යුගය විසින් තමන් වටකොට පැනවූ සීමාවන් ඉක්මවීමෙහි අසමත් විය.

නමුත් රදළ වංශවතුන්ද සමාජයේ ඉතිරි කොටස මුලුමනින්ම නියෝජනය කරන බවට හිමිකම් දැක්වූ නාගරිකයන්ද අතර සතුරු තාවය සමග එක පෙළටම සූරා කන්නන්ද සූරා කනු ලජන්නන්ද අතරත් වූ පොදු සතුරුතාවය පැවතියේය. එක විශේෂ පංතියක් පමණක් නොව පීඩා විදි සමස්ත මිනිස් සංහතියම වෙනුවෙන් පෙනී සිටින නියෝජිතයන් වශයෙන් ඉදිරිපත් වීමට ධනපති පංතියට හැකියාව ලැබුණේද මෙම තත්වය නිසාමය එපමණක් නොවේ ධනපති පංතියේ සමාරම්බයේ පටන්ම එය එහි ප්‍රතිප්‍රත්‍යයේ බර දරා සිටියේය. වේතන කම්කරුවන් නොමැතිව ධනපතියනට පැවතීමට නොපුළුවන මධ්‍ය කාලීන ශ්‍රේණී නාගරිකයා නූතන ධනපතියා වන සේ සංවර්ධනය වූහ. සමස්තයක් සේ සලකන කල ධනපති පංතිය <u>වංශාධිපතියනට විරුද්ධව කළ ඔවුන්ගේ අරගලයේදී;</u> ඒ හා එක්වරම එවකට වූ විවිධ වැඩ කරන පංතිවල අවශ්‍යතාවයන් වෙනුවෙන්ද පෙනී සිටින බවට අයිතිවාසිකම් කීමට හැකියාවක් එයට තිබුණත් නූතන නිර්ධන පංතියේ පුරෝගාමියා වූ සහ අඩු වැඩි පමණින් සංවර්ධනය වූ එම (වැඩ කරන) පංතියේ ස්වාධීන කඩාපැනීම් සෑම මහා ධනපති ව්‍යාපාරයකදීම ඇති වනු දක්නා ලදී. මේ සම්බන්ධයෙන් ජර්මන් ප්‍රතිසංස්කරණය සහ ගොවි යුද්ධය සමයේදී ඈනාබැප්ටිස්ට් වරු[39] සහ තෝමස් මූන්සර් ද, මහා ඉංග්‍රීසි විපලවයේදී ලෙවලර් වරුන් ද[40] ප්‍රංශ මහා විප්ලවයේදී බාබේෆ් ද පිළිබද නිදර්ශන දැක්විය හැකිය. තවමත් සංවර්ධනය වී නොතිබුණු පංතියක මෙම විප්ලවාදී කැරලි ගැසීම්වලට ගැලපෙන නයයික ප්‍රකාශනයන් දක්නා ලදී. පරමාදර්ශ වහයෙන් සලකන ලද සමාජ තත්වයන් පිළිබද මනෝරාජික පින්තූර දහසය හා දහහත්වැනි ශතවර්ෂවලදී ඉදිරිපත් විය[41]. දහඅටවැනි ශතවර්ශයේදී සැබෑ කොමියුනිස්ට් ස්වරූපයේ න්‍යාය (මොරෙප්පි සහ මාබිලි) ඉදිරිපත් විය. සමානාත්මතාවය සදහා ඉල්ලීම තවදුරටත් දේශපාලන තත්වයන් සහ පුද්ගලයන් දක්වා ව්‍යාප්ත කරන ලදී හුදෙක්ම පංති වරප්‍රසාදයන් පමණක් නොව පංති වෙනස් කම්ද අහෝසි කිරීමට අපේක්ෂා කරන ලදී. නව උගැන්වීමේ ප්‍රථම අකෘතිය වූයේ ජීවිතයේ සියලු සැප සම්පත් හෙළාදකින තවුස් පිලිවෙතක් වැනි කොමියුනිට් වාදයකි. ස්පාර්ටන්වාදයකි අනතුරුව මහා මනෝරාජවාදීන් තිදෙන ඉදිරයට වන්හ. සෙන්-සිමෝන් - නිර්ධන පංති ව්‍යාපාරය සමග එකපෙළට සිටුවන ලද මධ්‍යම පංති ව්‍යාපාරය තවමත් එක්තරා දුරකට වැදගත් සේ ඔහු සැලකීය. ෆුරියේ සහ ඕවන් ධනපති ක්‍රමය වඩාත්ම දියුණුවූ රටෙහි එම දියුනුවෙන් පැන නැගුණු සතුරුතාවයන්ගේ බලපෑම යටතේ ක්‍රමානුකූල ලෙස සහ කෙළින්ම ප්‍රංශ ද්‍රව්‍යවාදයට ගැලපෙන ආකාරයට පංති වෙනස් කම් ඉවත් කිරීම පිණිස ඔහුගේ යෝජනා සකස් කළේය.

මේ තිදෙනාට පොදු එක් කරුණක් ඇත. ඒ වන විට ඓතිහාසික සංවර්ධනය විසින් ඉදිරිපත් කරනු ලැබ සිටි නිර්ධන පංතියේ අවශ්‍යතාවයන්ගේ නියෝජිතයෙක් වශයෙන් ඉන් එක් අයෙක් වත් පෙනි නොසිටි ප්‍රංශ දර්ශනිකයන් මෙන් මොවුහුද මුලින් එක් විශේෂ පංතියක් මුදා ගැනීම ගැන නොකී අතර එක් වරම මුළු මිනිස් වර්ගයාම මුදා ගැනීම කීහ. ඔවුන් මෙන්ම මොවුහුද තර්ක බුද්ධියේ සහ සදාකාලික යුක්තියේ රාජධානිය පහළ කිරීමට අපේක්ෂා කරන නමුත් ඔවුන් එයින් අදහස් කරන්නේ ප්‍රංශ දර්ශනවාදීන් අදහස් කරන දෙයට වඩා අහසට පොළව මෙන් දුරස්තර වූවකි. මෙම දර්ශනිකයන්ගේ ප්‍රතිපත්ති මත පදනම් වූ ධනපති ලෝකය අපගේ සමාජ ප්‍රතිසංස්කාරකයන් තිදෙනාට පෙනෙන්නේ ඉතාමත් අතාර්තික සහ අයුක්ති සහගත ලෙසටය. නිසා වැඩවසම් ක්‍රමය හා ඉතිහාසයේ මුල් අවධි සියල්ලම මෙන් එයද ඒකාන්ත වශයෙන් කසල ගොඩ කරා යන්නේය. පිරිසිදු තර්ක බුද්ධිය හා යුක්තිය මෙතෙක් ලොව පාලනය නොකළේ. නම් එයට කම හේතුව මිනිසුන් විසින් ඒවා හරි ආකාර ලෙස වටහා එක් පුද්ගලයෙකි. දැන් ඔහු බිහිවී සිටි දැන් ඔහු බිහිවි සටීමත් සත්‍ය පැහැදිලි ලෙස අවබෝධ කරගෙන තිබීමත් ඓතිහාසික සංවර්ධනයේ

සිදුවීම් මාලාවෙන් පැන නැගුනු අනිවාරණීය සිද්ධියක් නොවූ හුදු වාසනාවන්ත අහුඹුවක් පමණිකි. ඔහු අවුරුදු 500 කට පෙර මෙසේම උපදින්නට තිබුණි. එසේ වී නම් අවුරුදු 500 ක වැරදි කලි කළහ සහ දුක් පීඩාවලින් මිනිස් වර්ගයා නිදහස් වන්නට තිබුණි.

විප්ලවයේ පුරෝගාමීන් වූ දහඅටවැනි ශතවර්ෂයේ පංශ විප්ලවාදීන් තර්ක බුද්දිය මේ සියල්ලෙහි විනිශ්චය කරු සේ සලකා එයට ආයාචනා කරනු දක්නා ලදී. තර්කානානුකූල ආණ්ඩුවක් හා තර්කානුකූල සමාජයක් ඇති කිරීම අපේක්ෂා කරන ලදී. සදාකාලික විචාර බුද්දියට හරස් වන සියල්ලක්ම අනුකම්පා විරහිතව තොර කිරීමට අරමුණු විය. මෙම සදාකාලික තර්ක බුද්ධිය යනු දැන් දැන් ධනපති තත්වයට පරිනාම වෙමින් සිටි දහඅටවැනි ශතවර්ෂයේ පුරවැසියාගේ අවබෝධය පරමාදර්ශයක් කර ගැනීමෙන් නිමවා ගන්නා ලද්දක් මිස අනෙක් නොවන බව අපි දුටුවෙමු. ප්‍රංශ විප්ලවය විසින් මෙම තර්කානුකූල සමාජයහා ආණ්ඩුව ඇති කරන ලදී. එහෙත් නව තත්වය කලින් පැවති කොන්දේසි සමග සංසන්දනය කරන කල තර්කානුකූල යයි ගත හැකි නමුත් එය කිසිසේත් සම්පූර්ණයෙන්ම බිද වැටුනි. රුසෝ ගේ සමාජ ගිවිසුම ත්‍රස්තයේ රජයක් ලෙසින් ක්‍රියාත්මක වූ අතර ස්වකීය දේශපාලන හැකියාව ගැන බිදක් විශ්වාසයෙන් යුත් ධනපතියන් ප්‍රථමයෙන් අධ්‍යක්ෂ මන්ඩලයේ[42] දූෂණය තළිනුත් අවසානයේ නැපෝලියන්වාදී සර්වාධිකාරයේ සෙවන යටතෙත් ආරක්ෂාව පැතූහ. ඇති කිරීමට පොරොන්දු වූ සදාකාලික සාමය රටවල් අල්වා ගැනීමේ කෙළවරක් නැති යුද්ධයක් බවට පරිවර්තනය විය. තර්ක බුද්ධිය පදනම් කරගත් සමාජයටද අත්වූයේ ඊට වඩා හොද ඉරණමක් නොවේ. පොදු සමෘද්ධියක් ඇති වෙමින් එය තුළ පොහොසතුන් හා දුප්පතුන් අතර විරුද්ධතාවය දිය වී යනු වෙනුවට එය එක්තරා දුරකට තුනී කළ ශ්‍රෙණි සහ අනෙකුත් වරප්‍රසාදයන් ඉවත් කිරීම නිසාද පල්ලියේ ප්‍රණ්‍යායතන ඉවත් කිරීම නිසාද එය උත්සන්න විය. දැන් සාර්ථක වූ සේ සැලකිය හැකි වූ රදළ බන්ධනයන්ගෙන් "දේපළ නිදහස්" දිනා ගැනීම ලොකු ධනපතියන්ගේ හා ඉඩම් හිමියන්ගේ ප්‍රබල තරගය යටතේ මිරිකීගිය සුළු ධනපති සුළු ධනපති ගොවි දේපළ හිමියන්ට දේපලවලින් "නිදහසක්ද" බවට පත් වුයේය. ධනපති ක්‍රම පදනමක් මත වූ කර්මාන්ත සංවර්ධනය විසින් වැඩ කරන ජනතාවගේ දුප්පත්කම හා දුක් දොමනස් සහිත භාවය සමාජ පැවැත්මේ කොන්දේසි බවට පත් කරන ලදී. කාලයිල්ගේ වාක්‍ය ඛණ්ඩයෙහි එන පරිදි මුදල් ගෙවීම එන්න එන්නම මිනිසා සහ මිනිසා අතර සම්බන්ධයෙහි එකම මාධ්‍ය බවට පත්විය. අපරාධ සංඛ්‍යාව වසරෙන් වසර ඇවිද්දේය. ඒවා දැනුදු නැති කර නොමැති නමුත් කෙසේ හෝ පසුබිමට වුව තල්ලුවී ඇත. ඒ වෙනුවට මේ දක්වා රහසේ කෙරුණු ධනපති දුසිරිත් වඩාත් සරුසාර ලෙස මල් ගනිමින් වැඩෙන්නට විය. වෙළදාම වැඩි වැඩියෙන් රැවටිල්ලක් බවට පත්විය.

"සහෝදරත්වය" යන විප්ලවවාදී ආදර්ශපාඨය[43] ක්‍රියාවට නැගුනේ තරගය නැමති සංග්‍රාමයේ වංචාවන් සහ ප්‍රතිපාක්ෂික භාවය වශයෙනි. බලහත්කාරී පීඩනය වෙනුවට දූෂණය ආදේ කරන ලදී. ප්‍රථම සමාජ ලීවරය වශයෙන් තිබුනු කඩුව වෙනුවට රත්තරන් ආදේශ කරන ලදී. ප්‍රථම රාත්‍රියේ අයිතිය රදළ සාමි වරුන්ගෙන් ධනපති කර්මාන්ත කරුවනට මාරු කෙරින වෛශ්‍යා වෘත්තිය පෙර නොඇසූ විරූ තරමින් වැඩි විය. කලින් මෙන්ම විවාහය තවදුරටත් වෛශ්‍යා වෘත්තියේ නිල සළුව ලෙසට පැවති අතර ඊට අමතරව සරුවට කෙරෙන අනාචාරයද එකතු විය. කොටි් කියතොත් දාර්ශනිකයන් හුවා දැක්වූ විශිෂ්ඨ පොරොන්දු හා සමග සසදා බලන කල "තර්ක බුද්ධියේ විජයග්‍රහණය" තුළින් ඇති වුනු සමාජ හා දේශපාලන ආයතනයන් සම්පූර්ණයෙන්ම බලාපොරොත්තු සුන් කරන හා ඒවායේ විකට රූප සමාන ඒවාවිය. අඩුවකට තිබුණේ මෙම බලාපොරොත්තු සුන් වීම ගැන විස්තර කිරීමට ඉදිරිපත් වන පුද්ගලයන් පමණකි. නව ශතවර්ෂය ආර්ම්භයේදී මෙම පුද්ගලයෝ ඉදිරිපත් වුහ. 1802 දී සෙන්-සිමොන්ගේ "ජිනිවා ලිපි" පළ විය. ෆූරියේගේ න්‍යායයට පසුබිම 1799 පටන් සකස් වී තිබුණ නමුත් ඔහුගේ ප්‍රථ කෘතිය 1808 දී පළ විය. 1800 ජනවාරි 1 දින නිව් ලනාක්[44] හි පාලනය රොබට් ඕවන් විසින් භාර ගන්නා ලදී.

එනමුත් මේ වන විට ධනපති නිෂ්පාදන ක්‍රමයක් ඒ සගම ධනපති පංතිය සහ නිර්ධන පංතිය අතර සතුරුතාවයන් තවමත් ඉතා අසම්පූර්ණ ලෙස සංවර්ධනය වු තත්වයක තිබුණේය. දන් දැන් එංගලන්තයේ පැන නැගී තිබුණු නවීන කර්මාන්තය තවමත් ප්‍රංශයේ එළි දැක නොතිබුණි එහෙත් නවීන කර්මාන්තය එක් අතකින් ගැටුම් ඇති කරයි එම ගැටුම් නිසා නිෂ්පාදන ක්‍රමයේ විප්ලවයක් කිරීමත් එහි ධනපති ස්භාවය නැති කර දැමීමත් පරම අවශ්‍යතා වයක් බවට පත් වන්නේය. එම ගැටි කෙළවර කිරීමේ මාධ්‍ය වන්නේවී නිෂ්පාදීය බලවේගයන්ය. එනිසා 1800 වර්ෂය පමණ වන විට සමාජ ක්‍රමයෙන් පැන නගින ගැටුම් යම්තමින් හැඩ ගැන්වෙමින් තිබුණේ නම් ඒවා කෙළවර කිරීමේ කිරීමෙන් මාධ්‍යයන් එහි තුළ අන්තර්ගතව තිබුණේ ඊටත් වඩා යම්තමිනි. ත්‍රස්තයේ රාජ්‍ය පැවති සමයේදී පැරීසියේ කිසි දේපළක් නැති පොදු ජනතාව මොහොතකට ප්‍රමුඛත්වය ලබා ගැනීමෙහි සමත් වු හෙයින් ධනපතියන්ගේ බාධකයන්ද නොතකා ධනපති විප්ලවය ජයග්‍රහණය දක්වා මෙහෙයවීම එයට කළ හැකි විය. එහෙත් එසේ කිරීමෙන් ඔවුන් ඔප්පු කළේ එවකට පැවති තත්වය යටතේ ඔවුන්ගේ ප්‍රමුකත්වය පවත්වා ගැනීම කොතරම් අන්ත දුෂ්කරතාවයක්ද යන්න පමණකි. මෙම කිසිම දේපළක් නැති පොදු ජනතාවගෙන් නව පංතියක න්‍යෂ්ටියක් මෙන් ප්‍රථම වතාවට පරිනාම වුනු නිර්ධන පංතිය ඒ වන විට ස්වාධීන දේශපාලන ක්‍රියාකාරීත්වය පිළිබද කිසිම හැකියාවක් නොමැතිව සිටියේය. එය ඉදිරියට පැමිණියේ පීඩනයට පත් කරන ලද හා වේදනා විදින සමාජ පංතියක් ලෙසටය. තමන්ට ආධාර කර ගැනීමේ හැකියාව නොමැති අයට පිටතින් හෝ ඉහළින් ලබා ගත හැකි ආධාරයට වඩා හොද වෙනත් ආධාරයක් නොමැත.

මෙම ඓතිහාසික තත්වය සමාජවාදයේ නිර්මාතෘවරයන් කෙරෙහිද තදින් බල පෑවේය. ධනපති නිෂ්පාදනයේ ගොරෝසු කොන්දේසිවලට හා ගොරෝසු පංති තත්වයන්ට ගැලපුනේ ගොරෝසු න්‍යායයන්ය. සමාජ ප්‍රශ්නවලට අදාළ විසදීම් වමත් නොදියුණු ආර්ථික තත්වයන් අස්සේ ගැන්වී සගවී තිබුණු අතර ඒවා මිනිස් මොළයෙන් සකස් කර ගැනීමට මනෝරාජිකවාදීහු ප්‍රයන්ත දැරූහ. සමාජයෙන් ඉදිරිපත් විය. එනිසා වඩාත් අංග සම්පූර්ණ සංවිධාන ක්‍රමයක් සොයා ගැනීමත් ප්‍රචාරය හා ආදර්ශ පරීක්ෂණ පිළිබද නිදසුන් මගින් මෙය පිටතින් සමාජය මත සවි කිරීමත් අවශ්‍ය විය. මේම නව සමාජ ක්‍රම වඩාත් අංගසම්පූර්ණ ලෙස හා විස්තර සහිතව සකස් කළ තරමටම ඒවා මනෝවිකාර ලෝකයට ගසා ගෙන යාම වැලැක්විය නොහැකි විය.

මෙම කරුණු තහවුරු කිරීමෙන් පසුව ප්‍රශ්නයේ මෙම අංශය ගැන තවදුරටත් එක බිදක් හෝ විස්තර කිරීම අපට අවශ්‍ය නොවේ. එය දැන් සම්පූර්ණයෙන්ම අතීතයට අයත් දෙයකි. අද අපට සිනහව පමණක් ගෙන එන මෙම මනෝවිකාරයන් ගැන ගම්භීර ලෙස වාද විවාද කිරීමටත් ඒ "උමතුව" හා සමග සසදන කල තමන්ගේ නිසරු තර්කණයෙහි උසස්කම ගැන වගාඩම්බර දෙඩීමටත් සාහිත්‍යයේ පැංචන් හට ඉඩ තබමු. අප යොමුව සිටින්නේ මෙම අමනයන්ට නොපෙනෙන විස්ම උපදවන සුලු මහා චින්තන හා සෑම තන්හිම ස්වකීය මනෝවිකාර වහුන් බිදගෙන එළිදකින චින්තන බීජ ඇසුරෙන් ප්‍රමෝදයට පත්වීමටය.

සෙන්-සිමෝන් ප්‍රංශ මහා විප්ලවයේ පුත්‍ර රත්නයක් විය. එය පටන් ගන්නා විට ඔහු තිස්වැනි විය ඉක්මවා නොසිටියේය. විප්ලවය මහ ජනතාවගේ ජයග්‍රහණයක් විය. එය ජාතියේ වරප්‍රසාද ලත් අලස පංති නැතහොත් වංශවතුන් සහ පූජකයන් පරදවා නිෂ්පාදනයේ සහ වෙළදාමේ නියුක්තව වැඩ කරන පොදු මහ ජනතාවගේ ඉතා කුඩා කොටසක ජයග්‍රහණයක් පමණක් ව බවද එහි සමාජමය වරප්‍රසාද ලත් කොටසක් වන දේපල හිමි ධනපතියන් විසින් දේශපාලන බලය අත්පත්කර ගැනීමක් පමණක් වූ බවද කල් නොයවාම පැහැදිලි විය. එමෙන්ම විප්ලව කාලය තුලදී ධනපතියන්ගේ සංවර්ධනය ඒකාන්ත වශයෙන්ම සීඝ්‍රවිය. වංශවතුන්ගෙන් හා පල්ලියෙන් රාජසන්තක කරන ලද ඉඩම් සම්බන්ධයෙන් සම්ප්‍රේෂණයෙහි යෙදීමෙන්ද යුද්ධ හමුදා කොන්ත්‍රාත් මගින් ජාතියට වංචා කිරීමෙන්ද ඔවුහු එසේ සංවර්ධනය වූහ. අධ්‍යක්ෂ මණ්ඩලය යටතේ ප්‍රංශය විනාශ මුඛයට ආසන්න වීමෙන්

නැපෝලියන්ට ඔහුගේ කුමන්ත්‍රනය කිරීම සදහා හේතුවක් ලැබුනේ එවකට බල පැවති මෙම වංචාකාරයන්ගේ අධිපතීත්වය නිසාය. මහජනයා සහ වරප්‍රසාද ලත් පංති අතර සතුරුතාවය "වැඩ කරන්නන්" හා "අලසයන්" අතර වන සතුරුතාවයක ආකාරයකින් සෙන්-සිමොන් ට පෙනී ගියේ එහෙයිනි. අලසයන් වූයේ හුදෙක් පැරණි වරප්‍රසාද ලත් පංති පමණක්ම නොවේ. නිෂ්පාදනයට හෝ බෙදාහැරීමට හවුල් නොවී ස්වකීය ආදායමෙන් යැපෙන සියළු දෙනාමත් හම ගණයට අයත් විය. එමෙන්ම "වැඩ කරන්නන්" වූයේ වේතන කම්කරුවන් පමණක් නොව, කර්මාන්ත කරුවන් වෙළෙන්දන් සහ බැංකු කරුවන්ද ඇතුළුවය. බුද්ධිමය නායකත්වය දීමේ සහ දේශපාලන ප්‍රධානත්වය ගැනීමේ හැකියාව නොමැති බව ත්‍රස්තයේ රාජ්‍යයේ අත්දැකීම් වලින් ඔප්පු වූ සෙයක් සෙන්-සිමොන්ට පෙනී ගියේය. එසේනම් මෙම අණදෙන බලය තිබුණේ කාටද? සෙන්-සිමොන් කියන ලෙසට විද්‍යාව සහ කර්මාන්තය යන දෙකම නව ආගමික බැම්මකින් එකට බැදී එක්සත් වන්නේය. ප්‍රතිසංස්කරණයෙන් පසුව නැතිව ගිය ආගමික අදහස් වල සමතයක්, එනම්, අවශ්‍යයෙන්ම ගූඨ ස්වභාවයක් දරණ සහ අනම්‍යශීලි තනතුරු පද්ධතියක් සහිත "නව ක්‍රිස්තියානි" දහමක් පුණරුත්ථාපනය කිරීමට එම එක්සත් කම ඉරණම්ව ඇත. එහෙත්, විද්‍යාව කියන විදිහට එහි ඇත්තේ උගතුන්ය, කර්මාන්තයෙහි ඇත්තේ, පලමුකොටම වැඩ කරන ධනපතියන්, කර්මාන්ත කරුවන්, වෙළෙන්දන් හා බැංකු කරුවන්ය. සෙන්-සිමොන් ඇත්ත වශයෙන්ම බලාපොරොත් වූයේ මෙම ධනපතියන් සහජන නිලධාරීන් සහ සමාජයේ භාරකාරයන් විශේෂයක් ලෙසට පරිවර්තනය වනු ඇතැයි යන්නය. එහෙත් ඒ අතරම ඔවුහු කම්කරුවන් හමුවේ අණදෙන සහ ආර්ථික වශයෙන් වරප්‍රසාද ලත් තත්වයක් දැරිය යුතු විය. ණය හැසිරවීම තුලින් සමස්ත සමාජමය නිෂ්පාදනයම මෙහෙය වීම විශේෂයෙන් බැංකුකරුවන්ට පැවරීමට අදහස් කරන ලදී. ප්‍රංශයේ නවීන කර්මාන්ත හා ඒ සමගම ධනපති පංතිය හා නිර්ධන පංතිය අතර පරතරයද ඇතිවීම ආරම්භයෙන් ඔබ්බට නොගිය කාලයකට මෙම සංකල්පය හරියටම ගැලපුනේය. නමුත් සෙන්-සිමොන් විශේ්ෂයෙන්ම අවධාරණය කරන්නේ මෙයයි. ප්‍රථමයෙන්ම හා අන් සියල්ලටම වඩා ඔහුගේ උනන්දුව යොමු වූයේ "සංඛ්‍යාවෙන් ඉතාම වැඩි සහ ඉතාමත් දුප්පත් පංතියට" අත් වූ ඉරණම කෙරෙහිය. (la classe la plus nombreuse et la plus pauvre) සෙන්-සිමොන්ගේ ජිනීවා ලිපිවලින්ම "සියළු මිනිසුන් වැඩ කළ යුතුය" යන ප්‍රස්තුතය ඔහු ඉදිරිපත් කරයි. තවද ත්‍රස්තයේ රාජ්‍ය දේපල අහිමි පොදු ජනතාවගේ රජයක් වූ බවත් ඔහු එම කෘතියෙන්ම පිලිගනී. ඔහු ඔවුනට මෙසේ කියයි.

"ඔබගේ සහෝදරවරු ප්‍රංශයේ පාලන බලය ඇතිව සිටි කාලයේ එහි සිදුවූ දේ බලන්න, ඔවුහු දුර්භික්ෂයක් ඇති කලහ"

එසේ නමුත් ප්‍රංශ විප්ලවය පංති යුද්ධයක් ලෙසට, හුදෙක් වංශවතුන් හා ධනපතියන් අතර නොව, වංශවතුන්ද, ධනපතියේ සහ දේපල අහිමියන් අතර කෙරුණු යුද්ධයක් ලෙසට 1802 වර්ෂයේදී හදුනා ගැනීම අනාගතයට ඉතාමත් වැදගත් සොයා ගැනීමක් විය. 1816 දී දේශපාලනය යනු නිෂ්පාදනයේ විද්‍යාවයයි ප්‍රකාශ කල ඔහු අර්ථ සාස්ත්‍රය විසින් සම්පූර්ණයෙන්ම උදුරාගනු ඇතැයි යනුවෙන් අනාවැකියක්ද පලකරයි. දේශපාලන ආයතන වල පදනම වන්නේ ආර්ථික තත්වයන්ය යන ප්‍රස්තුතය මෙහි අන්තර්ගතව ඇත්තේ කලල ස්වරූපයෙන් පමණකි. එසේ වුවද මෙහි ඉතා පැහැදිලිවම ප්‍රකාශ කර තිබෙන්නේ මිනිසුන් මත පනවා තිබෙන දේශපාලන පාලනය අනාගතයේදී භාණ්ඩ පාලනයක් හා නිෂ්පාදන ක්‍රියාදාමය මෙහෙය වීමක් බවට පත්වීම, එනම් මෑතදී මෙතරම් ඝෝෂාවකට හේතු වුනු "රාජ්‍ය අහෝසි කිරීම" පිලිබද අදහසය. යුරෝපයේ සමෘධිමත් සාමයක් ඇති වීමේ එකම සහතිකය ප්‍රංශය හා එංගලන්තය අතරද ඒ දෙරටම හා ජර්මනිය අතරද සන්ධානයක් ඇතිවීමය යි. 1814 දි මිත්‍ර හමුදා පැරීසියට ඇතුළු වූ පසු ඒ වහාම සහ 1815 දී සිය දවසේ යුද්ධය[45] සමයේදී සෙන්-සිමොන් ප්‍රකාශ කළ විට, ඔහුගේ සමකාලීනයන්ට වඩා ඔහු

ශ්‍රේෂ්ඨයෙක් වන බව නැවතත් පෙනී ගියේය. වෝටර්ලු හි[46] ජයග්‍රහකයන් හා සමග සන්ධානයක් ඇති කර ගැනීම ගැන 1815 දී ප්‍රංශුවන්ට දේශනා කිරීමට විශාල ධෛර්යක් හා එතරම්ම විශාල ඓතිහාසීය ඉදිරිදැක්මක්ද අවශ්‍ය විය.

සෙන්-සිමොන් කෙරෙන් අපට සර්වග්‍රාහී ස්වභාවයේ පුළුල් දෘෂ්ටියක් දක්නට ලැබෙන නිසාම පසු කාලයේ සමාජවාදීන් ප්‍රකාශ කළ නිශ්චිත වශයෙන් ආර්ථික නොවන අදහස් සියල්ලම පාහේ ඔහුගේ අදහස් තුළ කලල ස්වරූපයෙන් ගැබ්ව ඇති බව පෙනේ නම් සාජයේ පවත්නා තත්වයන් ගැනසැබවින්ම ප්‍රංශ ස්භාවය ඇති සහ සිනා රස මුසු හෙත් එනිසා කිසිසේත් පරිපූර්ණත්වයෙන් අඩු නොවන විවේචනයක් අපට ෆූරියේ කෙරෙන් දක්නට ලැබේ. ධනපතියනුත් විප්ලවයට පෙර ඔවුන්ගේ ආශිර්වාදය ලත් අනාගත වක්තෘවරුනුත් ඉන් පසුව ඔවුන් ගැන ගුණ ගායනා කරන ඔවුන්ගේ යහපත පතන්නනනුත් කියන දේ ෆූරියේ ඒ හැටියෙන්ම ගන්නේය. ඔහු ධනපති ලෝකයේ ද්‍රව්‍යමය සහ සදාචාර දුකෙන් පිරුනු ස්භාවය කිසිම පැකිළිමකින් තොරව විවේචනය කළේය. ඔහු මෙම ලෝකයත් තර්ක බුද්ධියම පමණක් රජ කරන සමාජයක්ද වාසනාව විශ්වීය වන ශිෂ්ඨාචාරයක්ද සීමා නොකළහැකි මිනිස් පරිපූර්ණත්වයද පිලිබදව කලින් දර්ශනවාදීන් දුන් කාන්තිමත් පොරෝදුත් එමෙන්ම ඔහුගේ කාලයේ ධනපති දෘෂ්ට්ටාවාදීන් හඩ නැංවූ මිහිර වාග් මාලාවනුන් එකකට අනික අභිමුඛ කොට තැබීය. ඉතාමත් ඝෝශාකාරී මහා ශාබ්දික පාඨ සමග සාමගාමීව සෑම තැනකම පවතින්නේ ඉතාමත් කණගාටුදායක යථාර්ථයක් බව පෙන්වා දෙන ඔහු මෙම මහා පාඨ පටලැවිල්ල ඔහුගේ ඇනුම් පද සහිත උපායෙහි ගිල්වයි. ෆූරියේ විවේචකයෙක් පමණක්ම නොවේ. ඔහුගේ නොකැළඹෙන ශාන්ත ස්භාවය ඔහු උපහාස රචකයකු බවට පත් කරයි. එපමණක් නොව ඔහු මෙතෙක් දක්නා ලද ශ්‍රෙෂ්ඨතම උපහාස රචකයන්ගෙන් කෙනෙක් වන බවද නිසැකය. විප්ලවයේ බිද වැටීම මතුයෙහි පිපීගිය වංචාකාරී සමපේක්ෂණය සහ එකල ප්‍රංශ වාණිජයෙහි බල පැවැත්වූ සහ ස්භාව නිරූපි වූ සාප්පුකාර ජීවගුණයද බලවත් ලෙස සහ ඒ සමානව මනස්කාන්ත ලෙස ඔහු විසින් විස්තර කරනු ලැබේ. ස්ත්‍රී පුරුෂ සම්බන්ධයේ ධනපති ආකෘතිය සහ ධනපති සමාජයේ කාන්තාවට හිමි තැන පිලිබද වූ ඔහුගේ විවේචන ඊටත් වඩා විශිෂ්ඨය. ඕනෑම නියමිත සමාජයක කාන්තාවකගේ විමුක්තිය පොදු විමුක්තියේ ස්භාවික මිම්ම වන බව ප්‍රථමයෙන් ප්‍රකාශ කළ තැනැත්තා ඔහුය. නමුත් ෆූරියේ ඔහුගේ ශ්‍රේෂ්ඨත්වයේ උසස්ම තැනට එළඹෙන්නේ සමාජයේ ඉතිහාසය පිළිබද ඔහුගේ සංකල්පය ඉදිරිපත් කිරීමෙනි. මෙතෙක් ගෙවුනු සම්පූර්ණ ඉතිහාස මාර්ගය ඔහු විසින් පරිනාම අවධි හතරකට බෙදනු ලැබේ. ම්ලෙච්ච අවධිය, පිතෘ මුලික සමාජ ක්‍රමය, අශිලාචාර යුගය හා ශිෂ්ඨාචාර යනු ඒ අවධි හතරය මෙහි සදහන් අවසාන අවධිය අද පවත්නා ඊනියා සිවිල් හෝ සේ නැතහොත් ධනපති සමාජය සමග නම් දහසයවන වර්ෂයේ පටන් ආර්ම්භ වූ සමාජ ක්‍රය සමග සර්සවම වන්නේය.

"වනචාරි යුගය විසින් සරල විධියකින් ක්‍රියාත්මක කරන ලද දුශ්චරිතයන් ශිෂ්ඨාචාර යුගය විසින් සංකීරණ ව්‍යකූල අනිශ්චිත හා කුහක ාකාරයේ පැවැත්මකට උසස් කරන" බවද ශිෂ්ඨාචාරය "විෂම කවයක" එය නිරතුරුවම ප්‍රයෝජනය කරන එහෙත් එයට විසදිය නොහැකි ප්‍රතිවිරෝධයන් තුලින් ගමන්කරන බවද එනිසා ය දිනාගැනීමට අපේක්ෂා කරන නැතහොත් දිනා ගැනීමට අපේක්ෂා කරන බවත් පෙන්වන දෙයට සම්පූර්ණයෙන්ම ප්‍රතිවිරුද්ධ ාදය වෙත එය නිතරම එළඹෙන බවද නිදර්ශනයක් වශයෙන් "ශිෂ්ඨාචාරය යටතේ දුප්පත්කම උපදනේ වස්තු අතිබාහුල්‍යතාවයෙන්ම" වන බවද ඔප්පු කරයි.

ෆූරියේ ඔහුගේ සමකාලීන හේගල් මෙන්ම ඉතාමත් දක්ෂ ලෙස දයලෙක්තික විධිය උපයෝගි කරගන්නා බව අපට පෙනේ. මෙම දයලෙක්තික විධියම යොදා ගනිමින් සීමා නොකළ හැකි මිනිස් පරිපූර්ණත්වය ගැන වූ කථාවට එරෙහිව තර්ක කරන ඔහු සෑම ඓතිහාසික සමයකම උද්ගමන කාලයක් සහ අවගමන කාලයක් ඇතැයි කියමින් එම නිරීක්ෂණය සමස්ත මිනිස් වර්ගයාගේම අනාගතයට ගලපන්නේය. කාන්ට් පොළෝතලයේ අවසාන

විනාශය පිළිබඳ අදහස ස්භාවික විද්‍යාවට ඇතුලත් කළ සේම ෆූරියේ මිනිස් වර්ගයාගේ අවසාන විනාශය පිළිබඳ අදහස ඓතිහාසීය විද්‍යාවට ඇතුලත් කළේය.

ප්‍රංශ දේශය හරහා විප්ලව සුළි සුළඟ වේගයෙන් හමා ගිය අතර එංගලන්තයේ ඊට වඩා නිහඩ එහෙත් නිසා ප්‍රබලත්වයෙන් නොඅඩු වු විප්ලවයක් සිදු වෙමින් පැවතුණේය. වාෂ්ප සහ නව උපකරණ නිෂ්පාදක යන්ත්‍ර විසින් භාණ්ඩ තැනීම නවීන කර්මාන්තය බවට පරිවර්තනය කෙරෙමින් තිබුණේය. එමගින් ධනපති සමාජයේ අඩිතාලම විප්ලවයකට භාජනය වෙමින් තිබුණේය. එමගින් ධනපති සම්ජයේ අඩිතාලම විප්ලවයකට භාජනය වෙමින් තිබුනේය. භාණ්ඩ තැනී පිළිබඳ සංවර්ධනයේ හෙමින් ගමන වෙනස් වී නිෂ්පාදනයේ කුණාටුවක් බදු හා කලබලයෙන් පිරි කාලයක් උදාවිය. ලොකු ධනපතියන් සහ දේපළ අහිමි නිර්ධන පංතිකයන් වශයෙන් සමාජය බෙදී යාම නිරන්තරව වර්ධනය වන වේගයකින් සිදු වී ගෙන ගියේය. මේ දෙකොටස අතර කලින් සිටි ස්ථායි මධ්‍යම පංතිය වෙනුවට ජනගහණයේ වැඩියෙන්ම උච්ඡාවචනයට ලක්වන අස්ථායි ජනකායක් වන කර්මාන්ත ශිල්පීහු හා කුඩා සාප්පු කරුවෝ දැන් ඉතාමත් අඩමාන දිවි පෙවෙතක් ගෙවමින් සිටියහ. නව නිෂ්පාදන කුමය තවමත් එහි උද්ගමනයේ ආරම්භක කාලයේ පසුවෙමින් තිබුණි. තවමත් පැවතියේ උද්ගමනයේ ආරම්භක කාලයේ පසුවෙමින් තිබුණි. තවමත් පැවතියේ සාමාන්‍ය සුපුරුදු නිෂ්පාදන විධියමය පවත්නා කොන්දේසි යටතේ පැවතිය හැකි වු එක විධිය එය විය. එසේ වුවත් එම තත්වය යටතේ පවා එයින් දරුණු සමාජ අයථාකම් ඇති කරන ලදී. ගෙයක් දොරක් නැති ජනයා මහා නගරවල ඉතාමත් අසතුටුදායක නිවාසවල එකට ගාල් කිරීමද සම්ප්‍රදායික සදාචාර බැඳීම් පිතෘ මූලික කීකරුකම් හා පවුල් සම්බන්ධකම් සියල්ලම ලිහිල් කිරීමද ඉතාමත් භයංකර තරම් දුරකට අධික ලෙස වැඩ ගැනීම හා විශේෂයෙන්ම කාන්තාවන් හා ළමයින් එසේ වැඩෙහි යෙදීමද හදිසියේම සම්පූර්ණයෙන් අළුත් තත්වයන්ටත් ස්ථායි පැවතුමක තත්වයන්ගෙන් දිනෙන් දින වෙනස් වන සුරක්ෂිත නොවන පැවතුම් තත්වයන්ටත් ඇද දමන ලද කම්කරු පංතිය සම්පුර්ණයෙන්ම අධෛර්යයට පත් කිරීමද සිදු විය. මෙම අවස්ථාවේදී ප්‍රතිසංස්කාරකයෙක් වු අවුරුදු 29ක් වයසැති කර්මාන්ත කරුවෙක් ඉදිරියට වන්නේය. ඔහු අති උදාරයයි කිව හැකි හා ළදරුවෙකුගේ මෙන් අකලංක චරිතයක් ඇත්තෙකු සහ මිනිසුන් අතර උපන් දුර්ලභ ගණයේ නායකයෙකු ද විය. රොබට් ඕවන් ද්‍රව්‍යවාදී දාර්ශනිකයන්ගේ උගැන්වීම් එනම් ිනිසාගේ චරිතය එක් අතකින් පාර්පරික උරුමයන්ගේද අනිත් පුද්ගලයාගේ ජීවිත කාලය තුළ විශේෂයෙන්ම ඔහුගේ සංවර්ධන කාලය තුළ ඔහු කල් ගෙවන වටපිටාවෙහිද නිමැවුමක් ය යන උගැන්වීම ඔහුට සුදුසු පරිදි සකසා ගත්තේය. කාර්මික විප්ලව තුළින් ඔහුගේ පංතියේ බොහෝ දෙනෙක්ම දුටුවේ අවුල් සහ වියවුල්ද මෙම බොර දියේ මාළු අල්ලමින් ඉක්මණින් විශාල ලාභ උපයා ගැනීමේ අවස්ථාද පමණකි ඔහු එය තුළින් දුටුවේ ඔහුගේ සුරතල් න්‍යායය ක්‍රියාත්මක කිරීමේ සහ එමගින් අවුලෙන් ක්‍රමවත් බව ඇති කිරීමේ අවස්ථාවකි. ඔහු ඒ වන විටත් මැන්චෙස්ටර් පැක්ටරියක මිනිසුන් පන්සියකට වැඩි පිරිසක පාලකයා වශයෙන් එය සාර්ථක ලෙස අත්හදා බලා තිබුණේය. 1800 පටන් 1829 දක්වා ඔහු ස්කොට්ලන්තයේ නිව් ලනාක්ි මා කපු මොලේ කළමණාකාර කොටස්කරු වශයෙන් එම පිළිවෙත අනුවම හෙත් ක්‍රියාකිරීමේ වැඩි නිදහසක් ඇතිව එහි කටයුතු මෙයෙවීම කළේය. එයින් ලැබු සාර්ථකත්වය නිසා ඔහු යුරෝපය පුරා ප්‍රසිද්ධියට පත්විය. මුලදී විවිධ කොටස්වලින් සමන්විත වු සහ බොොේ කොටම ඉතාමත් අධෛර්යයට පත් පිරිසක් ක්‍රමාණුකූලව 2500 ක් දක්වා වැඩීගිය පිරිසක් ඔහු විසින් ආදර්ශමත් ජනපදයක් බවට පත් කරන ලදී. එහි බීමත්කම, පොලීසිය, මහේස්ත්‍රාත් වරු, නඩු, දුප්පතුන් සදහා නීති හා පුණ්‍යාධාර කිසි විටෙකත් නොදක්නා ලදී. මේ සියල්ලම කළ හැකි වුයේ මිනිසුන් මිනිසුනට සුදුසු තත්වයන් යටතට පත් කිරීමෙන් හා විශේෂයෙන්ම නැගී එන පරම්පරාව සුපරික්ෂාකාරී ලෙස දා වඩා ගැනීමෙනි. ළදරු පාසල්වල නිර්මාතෘවරයා වු ඔහු ප්‍රථම ළදරු පාසල නිව් ලනාක්හි ආරම්භ කළේය. වයස අවුරුදු දෙකේදී ළදරුවන් පාසලට ආහ. එහි ඔවුහු කොතරම් සතුටින් කල් ගත කළෝද යත් ඔවුන් නැවත ගෙදර යාමට පවා මැළි වූහ. ඔහුගේ තරග කරුවි ඔවුන්ගේ සේවකයන් ලවා දිනකට පැය දහතුනක් හෝ දාහතරක්

වැඩ කරවූ අතර නිව් ලනාක්හි වැඩ දිනය පැය දහය හමාරක් පමණක් විය. කපු අර්බුදයක් නිසා මාස හතරක් තිස්සේ වැඩ නතරවී තිබුණු විට ඔහුගේ කම්කරුවන්ට ඒ මුළු කාලයම සඳහා සම්පූර්ණ වැටුප් ලැබිනි. මේ සියල්ලමත් කෙරුණු නමුත් ව්‍යාපාරයේ අගය දෙගුණයකට වඩා වැඩි විය. එමෙන්ම අන්තිම දක්වාම එහි අයිතිකරුවන්ට විශාල ලාභ ගෙන දුන්නේය.

මේ සියල්ලෙන්ම වුවද ඕවන් සැනසුනේ නැත. ඔහු කම්කරුවනට ලබා දුන් පැවැත්ම ඔහුගේ අදහසේ හැටියට මිනිසුනට තරම් වන මට්ටමට වඩා තවමත් බොහෝ පහළ එකකි. "ජනතාව මගේ කැමැත්තට යටත් වහළුන් වෙති" ඔහු ඔවුන් සාපේක්ෂ ලෙස වාසිදායක වූ තත්වයනට පත් කළ නමුත් ඒවා ඔවුන්ගේ චරිතය හා බුද්ධිය සෑම අංශයකින්ම වර්ධනය වීමට තරම් කිසිසේත් ප්‍රමාණවත් නොවීය. ඔවුන්ගේ දක්ෂතාවයන් නිදහස් ලෙස ක්‍රියාත්ක කරවීම සඳහා ඒවා එතරම්ම ප්‍රමාණවත් නොවීය. "එහෙත් 2500 ක් වූ මෙම ජනගහණයෙන් වැඩ කරන කොටස දිනපතා සමාජය සඳහා නිෂ්පාදනය කළ මූර්ත ධනය ශතවර්ෂ භාගයකට අඩු කලකට පෙර නිස්පාදනය කිරීමට 600 000 ක ජනගහණයකින් වැඩ කරන කොටස අවශ්‍ය වන තරම් ප්‍රමාණයක් විය. මිනිසුන් 2500 ක් 6 00 000 ක් විසින් කරන පාරිභෝජනයෙන් වෙනසට කුමක් සිදු වී දැයි මම මගෙන් අසා ගත්තෙමි." පිලිතුර පැහැදිලි එකක් විය. ආයතනයේ අයිති කරුවන්ට වුන් යෙදවූ මුල් ධනයෙන් සියයට 5 ක් හා ඊට අමතරව රන් පවුම් 3 00 000 ක ශුද්ධ ලාභයක් ගෙවීමට ය උපයෝගි කරගෙන තිබුණි. එපමණක් නොව නිව් ලනාක් හා සම්බන්ධයෙන් සත්‍ය වූ එය එංගලන්තයේ පැක්ටරි සියල්ලම සම්බන්ධයෙන් ඊටත් වඩා සත්‍ය විය.

"යන්ත්‍ර විසින් මෙම අළුත් ධනය නිෂ්පාදනය නොවිනි නම් නැපෝලියන්ට විරුද්ධව සහ සමාජයේ වංශාධිපති ප්‍රතිපත්තිවලට පක්ෂව කරන ලද යුරෝපයේ යුද්ධ පවත්වාගත නොහැකි වන්නට තිබුණි. එසේ වුවද මෙම නව බලය කම්කරු පංතියේ නිර්මාණයක් විය." ('සිතෙහි සහ ව්‍යවහාරයෙහි විප්ලවය' යන කෘතියෙන්. එය 'යුරෝපයේ සියලුම රතු සමුහාණ්ඩුවාදීන් කොමියුනිස්ට්වරුන් සහ සමාජවාදීන් සහ සමාජවාදීන්' අමතා ලියන ලද්දකි. එය 1848 ප්‍රංශ තාවකාලික ආණ්ඩුවටත් 'වික්ටෝරියා රැජිණට හා ඇගේ වගකිව යුතු උපදේශකයන්ටද යැවිනග)

එනිසා නව බලයේ ප්‍රතිඵල අයත් වුයේ ඔවුනටය මෙතෙක් පුද්ගලයන් ධනවත් කිරීම හා ජනතාවන් වහල් කිරීම සඳහා උපයෝගි කර ගන්නා ලද නව නිර්මාණයක යෝධ නිෂ්පාදනීය බලවේග ඕවන්ට නැවත සමාජය ගොඩ නැගීමේ අඩිතාලමක් ලබා දුන්නේය. සියලු දෙනාටම පාදු දේපළ වූ ඒවා සියලු දෙනාගේම පොදු යහපත සඳහා ක්‍රියාත්මක කිරීමට ඉරණම්ව තිබුණි.

ඕවන්ගේ කොමියුනිස්ට්වාදය පදනම්ව තිබුණේ පිරිසිදු ව්‍යාපාරික අඩිතාලමක් මතය නැතහොත් එය වාණිජ සංසරණයේ ප්‍රතිඵල මත පදනම් වීයයිද කිව හැක හැම විටම එය මෙම ප්‍රායෝගික ස්වභාවය රැකගත්තේය. ඒ අනුව අයර්ලන්තයේ ආපදා ආපදා සහන සැලසීම කොමියුනිස්ට් ජනපද මගින් කරන ලෙස ඔහු 1823 දී යෝජනා කළේය. එමෙන්ම ඒවා පිහිටුවීම සඳහා යන වියදම් වාර්ෂික වියදම් හා ලැබීමට බලාපොරොත්තු විය ැකි ආදායම්ද පිළිබඳ සම්පූර්ණ ඇස්තමේන්තු පිළියෙල කළේය. අනාගතය සඳහා ඕවන් සකස් කරන නිශ්චිත සැලැස්ම හා එහි නීත්‍යානුකූල විස්තරාත්මක කොටස්- බිම් සැලැස්ම, ඉදිරිපස පෙනුම, උඩින් පෙනෙන ආකාරය යන මේ සියල්ලම ඇතුලත් කර - ඉමහත් ප්‍රායෝගික දැනුමක් ඇතිව සකස් කෙරෙන නිසා, ඔහුගේ සමාජ ප්‍රතිසංස්කරණයේ විධික්‍රම පිළිගත හොත්, විස්තර කරුණු නියත ලෙස පෙළ ගස්වා තිබෙන ආකාරය ගැන, ප්‍රායෝගික දෘෂ්ටි කෝණය ගැන කළ හැකි විවේචන අල්පය.

කොමියුනිස්ට්වාදය දෙසට ඉදිරියට යාම ඕවන්ගේ ජීවිතයේ සන්ධිස්ථානය විය. ඔහු හුදෙක්ම ධනපතියෙක්ව සිටිතාක් කල් ඔහුට තෑගි කොට ලැබුණේ ධනය, ප්‍රශංසාව, ගෞරවය හා කීර්තිය මය. ඔහු යුරෝපයේ ඉතාමත් ජනප්‍රිය පුද්ගලයා විය. ඔහුගේම පංතියේම අය පමණක් නොව, රාජපාළකයින් හා කුමාරවරු පවා ඔහුට අනුබලකාරී ලෙස ඇහුම්කන් දුන්හ. නමුත් ඔහු කොමියුනිස්ට් න්‍යායන් ඉදිරිපත් කිරීමට පටන්ගත් පසු සම්පූර්ණයෙන්ම වෙනස් විය. විශේෂයෙන්ම මහා භාධක තුනක් සමාජ ප්‍රතිසංස්කරණයේ මාර්ගය අවුරා සිටින බව ඔහුට පෙනී ගියේය. පෞද්ගලික ධනය, ආගම සහ වර්ථමාන විවාහ ක්‍රමය ඔහු දුටු භාධක විය. ඔහු මේවාට පහර දුන හොත් ඔහුට මුහුණ දෙන්නට සිදුවන්නේ කුමකටදැයි යන්නත්, ඒ නම්, නීති විරෝධී කිරීම, නිළ සමාජයෙන් පිටුවහල් කිරීම හා ඔහුගේ මුළු සමාජ තත්වයම නැතිව යන බවත් ඔහු දැන සිටියේය. එහෙත් ප්‍රථිපල ගැන නොබියව මේවාට පහර දීමෙන් ඔහු වැලැක් වීමට සමත් කිසිවක් නොවූයෙන් ඔහු කල්තබා දුටු දෙය සිදුවිය. නිළ සමාජයෙන් පිටුවහල් කරනු ලදුව පුවත් පත් ඔහුට විරුද්ධව ක්‍රියාත්මක කළ නිහැඩියා කුමණ්ත්‍රණයක් පවතිද්දී, ඔහුගේ මුළු ධනයම කැප කරමින් ඇමරිකාවේ ගෙන ගිය අසාර්ථක කොමියුනිස්ට්වාදීන් අත්හදා බැලීම නිසා විනාශයට පත්වූ ඔහු කෙළින්ම කම්කරු පංතිය වෙත හැරී තිස් අවුරුද්දක් තිස්සේ දිගටම ඔවුන් අතර වැඩ කළේය. කම්කරුවන් වෙනුවෙන් ගෙන යන ලද සෑම සමාජ ව්‍යාපාරයක්ම තබන සෑම සැබෑ ඉදිරි පියවරක්ම, රොබට් ඕවන්ගේ නම සමග සම්බන්ධ වන්නේය. පස් අවුරුද්දක සටනකින් පසු ඔහු 1819 දී භාධක බිඳගෙන ඉදිරියට යමින් පැක්ටරි වල වැඩකරන කාන්තාවන් ගේ හා ළමයින්ගේ වැඩ පැය ගණන සීමා කරන ප්‍රථම නීතිය [47] සම්මත කැවා ගත්තේය. එංගලන්තයේ වෘත්තීය සමාතා සියල්ලම එකම වෘතිය සංගමයකට [48] එක්සත් කළ ප්‍රථම සම්මේලනයේ සභාපති වූයේ ඔහුය. සමාජය කොමියුනිස්ට්වාදී ලෙස සම්පූර්ණයෙන්ම සංවිධානය කිරීම සඳහා පරිවර්තණීය පියවරයන් වශයෙන්, ඔහු එක් අතකින් සුළු වෙළදාම සහ නිශ්පාධනය සඳහා සමුපකාර සමිති ඇති කළේය. එවක් පටන් මෙම සමිති විසින්, වෙළෙන්දා සහ කර්මාන්ත කරුවා සමාජමය වශයෙන් කිසිසේත්ම අවශ්‍ය නොවන්නේය යන්න ප්‍රායෝගික වශයෙන් ඔප්පු කිරීම හෝ යටත් පාරාසෙයින් සිදුවී තිබේ. අනිත් අතින් කම්කරුවන්ගේ නිශ්පාධිතයන් හුවමාරු කිරීම සඳහා ඔහු කම්කරු කඩමණ්ඩි ඇති කොට ඒවායේ ගනු දෙනු එක වැඩ පැයක් ඒඛකය වශයෙන් ගත් ශ්‍රම නෝට්ටු මගින් සිදු කෙරිනි.[49] අවශ්‍යයෙන්ම අසාර්ථක වීමට ඉරනම්ව තිබුණු නමුදු, එම ආයතන, ප්රුදෝන් ඊට බොහෝ කලකට පසු ඇතිකළ විනිමය බැංකුව [50] ගැන හොඳ අනාගත දැක්මක් ඇති, එහෙත්, එය මෙන් සියළු දොස් සුව කරන පිළියමක් වන පවට අයිති වාසිකම් නොකී සමාජය වඩාත් අංග සම්පූර්ණ විප්ලවයකට බඳුන් කිරීම සඳහා ගන්නාවූ ප්‍රථම පියවරක් වශයෙන් හඳුන්වනු ලබන ඒවා විය.

මනෝ රාජික චින්තන ක්‍රමය දීර්ඝ කාලයක් තිස්සේ දහනව වැනි ශත වර්ෂයේ සමාජවාදී අදහස් ආණ්ඩු කළේය. ඉන් සමහරක් තවමත් ආණ්ඩු කරන්නේය. ඉතා මෑතක් වන තුරු ප්‍රංශ සහ ඉංග්‍රීසි සමාජවාදීහු එයට පුදසත්කාර කලහ. වයිට්ලින් ඇතුළු මුල් අවදියේ ජර්මන් කොමියුනිස්ට්වාදයද එම ගුරුකුලයටම අයත් විය. මේ සියළු දෙනාම සමාජවාදය පරම සත්‍යය තර්ක බුද්ධිය සහ යුක්තිය වශයෙන් දුටහ. එය සොයාගත හොත්, එපමණින්ම, එහි ස්වයං බලයෙන්ම මුළු ලොවම ජයගත හැකියයි ඔවුහු සිතූහ. තවද පරම සත්‍ය කාලයෙන්, අවකාශයෙන් හා මිනිසාගේ ඓතිහාසිය සංවර්ධනයෙන් නිදහස්ව ස්වාධීනව පවතින නිසා එය සොයාගනු ලබන්නේ කවදාද කොතැනක දීද යන්න හුදෙක්ම අහඹුව විසින් තීරණය වන දෙයකි එය සියල්ලම එසේ වුවත්, එක් එක්, විවිධ ගුරු කුලයෙහි ආදි කතෘ වරයෝ පරම සත්‍ය, විචාර බුද්ධිය හා යුක්තිය එකිනෙකාට වෙනස් ආකාරයට විස්තර කරති. එපමණක් නොව එක් එක් අයගේ පරම සත්‍ය තර්ක බුද්ධිය හා යුක්තිය, නැවතත් ඔහුගේම මනෝමූල අවබෝධයත්, පැවැත්මේ කොන්දේසිත් දැණුම ප්‍රමාණය සහ බුද්ධිමය පුහුණුවත් අනුව සකස්වී තිබෙන නිසා, මෙම පරම සත්‍යයේ ගැටුම එකකින් අනික

අන්‍යෝන්‍ය වශයෙන් ප්‍රතික්ෂේප වීමෙන් හැර වෙනත් ආකාරයකින් කෙලවර විය නොහේ. එනිසා මෙයින් මතු විය හැක්කේ සාර සංග්‍රහවාදී වර්ෂයක සමාජවාදයක් මිස අන් කිසිවක් නොවේ. ඇත්තවශයෙන්ම මේ දක්වා ප්‍රංශයේ සහ එංගලන්තයේ සමාරවාදී කම්කරුවන් බොහොමයකගේ සිත් තුල රජ කළේ ඒ නිසයි. එබැවින්, එය ඉතාමත් විවිධාකාර මතිමතාන්තර වලට ඉඩ දෙන මැල්ළුමකි, විවිධ නිකායන්ගේ කතෘවරු ඉදිරිපත් කරන, අවම ප්‍රතිරෝධනයක් අවුස්සන සුළු, එවැන් විවේචනාත්මක ප්‍රකාශන ආර්ථික න්‍යාය, අනාගත සමාජයේ පිංතූර, සහිතවූ පඹගාලකි. දොල පහරේ වටකුරු ගල් කැට මෙන් විවාද නදියේදී එයට සහභාගිවන එක් එක් පුද්ගලයන්ගේ මත පිළිබද අහු කොන් අඩුවනසේ සෝදාහැරිය හැකි වන තරමටම සකස්කර ගැනිම පහසුවන සකල මනාවකි. සමාජවාදය විද්‍යාවක් ලෙස සකස්කර ගැනීම සදහා එය ප්‍රථමයෙන්ම නියම පදනමක් මත පිහිටුවීම අවශ්‍යවිය.

## දෙවන කොටස

ඒ අතරතුර දහඅටවැනි ශතවර්ෂයේ ප්‍රංශ දර්ශනවාදය සමග හා ඉන් පසුව නව ජර්මන් දර්ශනවාදය මතු වී විත් හේගල් මගින් උච්චස්ථානයට පත් විය. එහි උසස්තම යහ ගුණය වූයේ තර්කණයේ උසස්ම ආකෘතිය වශයෙන් නැවතත් දයලෙක්තික ක්‍රමය පිළිගැනීමය. පැරණි ග්‍රීක දර්ශනවාදීහු සියලු දෙනාම උපන් හපන්කම් ඇති ස්වාභාවික දයලෙක්තිකවාදීහු සියලුදෙනාම උපන් හපන්කම් ඇති ස්වභාවික දයලෙක්තික වාදීන් වූහ. ඔවුන් අතරින් ඉතාමත් සර්වප්‍රාඥ බුද්ධිමතා වූ ඇරිස්ටෝටල් එකල්හිම දයලෙක්තික චින්තනයේ ප්‍රධාන ක්‍රම ගැන විශ්ලේෂණයක් කර තිබුනේය. අනිත් අතට වඩාත් මෑත දර්ශන වාදය තුලද, දයලෙක්තික ක්‍රමය උපයෝගි කරගත් ඉතා දීප්තිමත් දාර්ශනිකයන් (නිදර්ශන වශයෙන් දෙකාර්ට් සහ ඉස්ටිනෝසා) සිටියත්, විශේෂයෙන්ම එය කෙරෙහි ඇතිවූ ඉංග්‍රීසි බලපෑම නිසා එය වඩාත් අනම්‍යශීලී ලෙස ඊනියා අධ්‍යාත්මවාදී තර්කණ ක්‍රමයෙහි ඇලුනේය. දහඅට වැනි ශත වර්ෂයේ ප්‍රංශවන් සම්පූර්ණයෙන්ම පාහේ, නැතහොත්, කෙසේ වුවත්, ඔහුන්ගේ විශේෂ දර්ශනවාදී කෘති කිරීමේදී වත් අධ්‍යාත්මවාදී ආදිපත්‍යයට හසුව සිටියහ. එසේ වුවද ප්‍රංශුවෝ දර්ශනවාදයෙන් පිටස්තරව වඩාත් සීමිත අර්ථයෙන් දයලෙක්තික ක්‍රමයෙන් විසාරද කෘතීන් බිහිකළහ. මේ බව ඔප්පු කිරීමට දිකේරෝගේ "රාමෝගේ බෑනා" සහ රූසෝගේ "මිනිසුන් අතර අසමාන තාවයේ ප්‍රභවය පිළිබද විමර්ශනය" ගැන මතක්කිරීමම ප්‍රමානවත්ය. අපි මෙම චින්තන ක්‍රම දෙකෙහි ප්‍රධාන ස්වභාව ලක්ෂණ මෙහි දක්විනෙමු.

අප ස්භාව ධර්මය ගැන, මිනිස් වර්ගයාගේ ඉතිහාසය ගැන, නැතහොත් අපගේම බුද්ධිමය ක්‍රියාකාරිත්වය ගැන සලකන හෝ පරාවර්ථනය කරන කල, අපට ප්‍රථමයෙන් දක්නට ලැබෙන්නේ කට පැටළුනු සම්බන්ධතාවයන් හා ප්‍රතිචාරයන්ද, සංස්කරණයන් හා සංයෝජනයන්ද පිළිබද සීමානික්‍රාන්ත පින්තූරයයි. එය තුල තිබුනු දෙය වශයෙන් හෝ පවතින්නේ නැත. සියල්ලම චලනය වෙයි, වෙනස් වෙයි, ඇති වෙයි, නැතිව යයි. එනිසා අපට ප්‍රථමයෙන් පෙනෙන්නේ පින්තූරය සමස්තයක් වශයෙනි එහි එක් එක් කොටස් තවමත් ඇත්තේ අඩු වැඩු වශයෙන් පසුබිමෙහිය. අපගේ නිරීක්ෂණයට හසුවන්නේ චලනයන්, පරිවර්ථනයන් හා සම්බන්ධකම්ය, නැතහොත්, චලනය වන සංයෝජනය වන හා සම්බන්ධවූ ද්‍රව්‍යයන්ය. ලෝකය පිළිබදවූ මෙම ප්‍රාථමික, සරල එහෙත්, නෛසර්ගික ලෙස නිරවද්‍ය සංකල්පය පෞරාණික ග්‍රීක දර්ශනයට අයත් අතර එය ප්‍රථමයෙන්ම පැහැදිළි ලෙස ඉදිරිපත් කරන ලද්දේ හෙරක්ලිටස් විසිනි. සියල්ලක්ම සරල නිසාද, නිරන්තරවම වෙනස්ව නිසාද, නිරන්තරවම ඇතිවන හා නැතිවන නිසාද සියල්ලක්ම ඇත්තේය, එහෙත් නැත්තේය. නමුත් සමස්ථයක් වශයෙන් දෘශ්‍යමානතාවය විසින් ගෙනදෙනු ලබන පින්තූරයේ සාමාන්‍ය ස්වභාව ලක්ෂණ මෙ සංකල්පයෙන් නිවැරදි ලෙස ප්‍රකාශ වෙතත් මෙම පින්තූරය සකස්වීමට සාධකවූ සවිස්තර කොටස් ගැන පැහැදිළි කිරී සදහා එය ප්‍රමානවත් නොවේ. අප ඒවා ගැන වටහා නොගන්නාතාක් කල් අපට සමස්ථ පිංතූරය ගැන පැහැදිළි අදහසක් නොමැත. මෙම විස්තර කොටස් ගැන අවබෝධකරගනු වස් අපි ඒවා එහි ස්වභාවික නැතහොත් ඓතිහාසික සම්බන්ධකම් කෙරෙන් ඉවතට ගෙන ඒවා එක එකක් ගැන වෙන වෙනම එහි ස්භාවය විශේෂ හේතු සාධක හා එහි ප්‍රතිපල ආදිය ගැන පරීක්ෂා කල යුතුය. මෙය මූලික වශයෙන්ම ස්වභාවික විද්‍යාවට හා ඓතිහාසිය පර්යේෂණයට භාරකර්ථව්‍යයන්ය. එම විද්‍යාවන්ට ක්‍රියාත්මක වීම පිණිස ප්‍රථමයෙන්ම කරුනු රුස් කරගතවූ නිසා ඉතාමත් සාධාරණ හේතු අනුව පැරණි ග්‍රීකයන් ඒවා අප්‍රධාන තත්වයට දැමූහ. කිසියම් හෝ ආකාරයක විවේචනාත්මක විශ්ලේෂණයක් සංසන්ධනයක් සහ පංති වර්ග හා ජාති අනුව පිළිවෙලකට තැබීමක් කිරීමට පෙර සෑහෙන තරම් ස්වභාවික සහ ඓතිහාසික කරුණු රුස්කර ගතයුතුවේ. එනිසා නිශ්චිත ස්වභාවික විද්‍යාවන්ගේ අඩිතාලම් සකස් කිරිම ප්‍රථමයෙන්ම අලෙක් සන්ද්‍රියානු කාලයේ [51] ග්‍රීකයන් විසින්ද පසුව මධ්‍යකාලීන යුගයේදී අරාබි වරුන් විසින්ද කරන ලදී. සැබෑ ස්වභාවික විද්‍යාව පහලොස් වැනි ශත

වර්ෂයේ දෙවන භාගයේ සිට පැවත එන්නෙකි. එතැන් පටන් එය වර්ධණය වන වේගයකින් ඉදිරියට ගියේය. පසුගිය අවුරුදු 400 ඇතුලත ස්භාව ධර්මය පිළිබද වූ අපෙේ දැණුම නැගූ යෝධ පියවරයන්ට සාධකවූ මූලික කොන්දේශි නම්, ස්වභාව ධර්මය එහි විවිධ කොටස් පැහැදිළි වන සේ විශ්ලේෂණය කිරීම, විවිධ ස්වභාවික ක්‍රියාධාමයන් සහ වස්තු විවිධ නිශ්චිත පංති වලට ඇතුලත් වන සේ ඒවා කණ්ඩායම් ගත කිරීම අනේකවිධ ජීවේන්ද්‍රිය සහිත දේහයන්ගේ ආකෘති ගනිමින් ඒවායේ අභ්‍යන්තර ව්‍යුහය අධ්‍යනය කිරීම යන මේවාය.නමුත් මෙම ක්‍රමයෙන් වැඩ කිරීම නිසා ස්භාවික වස්තූන් හා ක්‍රියාදාමයන් ඒවායේ අති මහත් සමස්තයෙන් වෙන් කොට ගෙන ඒවා තනි කර නිරීක්ෂණය කිරීමෙත් ඒවා චලිත වෙමින් පවතින ස්භාවයෙන් නොව තැන්පත් ස්භාවයෙන්ද ප්‍රධාන වශයෙන් විචල්‍යයන් ලෙසට නොව තැන්පත් ස්භාවයෙන්ද ප්‍රධාන වශයෙන් නොව මළ ස්භාවයෙන්ද ගෙන නිරීක්ෂණය කිරීමෙත් පුරුද්ද නැමති උරුමය අපට ඉතිරිවී තිබේ. ද්‍රව්‍ය දෙස බැලීමේ මෙ ක්‍රමය බේකන් ස ලොක් විසින් ස්භාවික විද්‍යාවෙන් දර්ශනවාදයට මාරු කරන ලද කල්හි පසුගිය ශතවර්ෂයන්ට විශේෂ චින්තනයක් වු අධ්‍යාත්වාදී චින්තක ක්‍රමය යින් ඇතිවිය.

අධ්‍යාත්මවාදියා ද්‍රව්‍යයන් හා ඒවායේ මානසික ප්‍රතිකයන් එනම් දෙස් වටහා ගන්නේ තනිවු එකකින් පසුව අනික ගැනත් එකකින් වෙන් කොට ගෙන අනික ගැනත් සැලකිය යුතු දේ ලෙසටය පරීක්ෂණයට භාජනය කළ යුතු ස්ථිර අනම්‍ය හා සැමදා එක සේ වෙතින වස්තු හැටියටය. ඔහුෙේ චින්තනය කිසිසේත්ම නොගැලපිය ැකි ප්‍රතිප්‍රත්‍යයකි. ඔහුගේ පනිවුඩය "ඔව් නැත, නැත" යනුයි මෙය ඉක්මවා යන යක් වෙතොත් එය යක්ෂයා නිසා සිදු වන්නකි. ඔුට වැටහෙන ලෙසට යම් ද්‍රව්‍යයක් එක්කෝ පවතී. එසේ නැතහොත් නොපවතී. කිසියම් දෙයක් එක්වරම එයත් තවත් දෙයකුත් විය නොහැකිය. ධන හා සෘණ එකකින් අනික සම්පූර්ණයෙන්ම බැහැර කෙරේ. හේතුව හා ඵලය අනම්‍යශීලි ලෙස එකිනෙකට ප්‍රතිප්‍රත්‍යව පිහිටා ඇත. මෙම චින්තන ක්‍රමය ඒ ඊනියා ශක්තිමත් සාමන්‍ය බුද්ධියේ ක්‍රමයක් වන හෙයින් එය බැබළෙන්නක් ලෙස අපට බැලූ බැල්මට පෙනේ. සාමාන්‍ය බුද්ධි නැමති තැනැත්තේ ඔහුගේ බිත්ති හතරෙන් වටවූ ඔහුගේම ගෘහමය රාජධානිය තුළ ගෞරවාදරයට පත්‍රවන නමුත් එයින් පිටව අති මත් පර්යේෂණ ලෝකයට බට ඔහුට එක එල්ලේම පුදුමාකාර අළුත් සොයාගැනීම්වලට මුහුණ දෙන්නට සිදු වන්නේය. තවද පරීක්ෂණයට බදුන් කෙරෙන විශේෂ වස්තුවෙි ස්භාවය අනුව විශාලත්වය වෙනත් වන ක්ෂේත්‍රයන් ගණනකදී අධ්‍යාත්මවාදී චින්තන ක්‍රමය සාධාරණ හා අවශ්‍ය වන නමුත් අප්‍රමාදවහෝ ප්‍රමාදව එය සීමාවකට එළඹෙන අතර ඉන් ඔබ්බෙහිදී එය පාක්ෂික සීමාවුණු වියුක්ත හා ජයගත නොහැකි ප්‍රතිරෝධතාවයන් අතර මං මුළා වුණු තත්වයකට පත්වේ. එක් එක් ද්‍රව්‍යන් ගන මෙනෙහි කිරීමේදී පැවැත්මේ ආරම්භය හා අවසානය ගැනද, ඒවායේ තැන්පත්කම ගැන මෙනෙහි කිරීමේදී ඒවායේ චලනය ගැනද අමතක කරයි. ගස් නිසා එයට කැළය නොපෙනේ. සාමාන්‍ය ව්‍යවහාරයේ අවශ්‍යතාවයයන්හිදී නිදර්ශනයක් වශයෙන්, සතකු මැරී සිටීද නැද්ද යන්න අපි දන්නෙමු. එය අපට කිව හැකිය. නමුත් මේ ගැන වඩාත් සමීප ලෙස පිරික්සා බැලීමේදී, බොහොවිට මෙය ඉතා සංකීර්ණ ප්‍රශ්නයක් බවට පත්වේ. නීතිවේදීහු මේ බව හොදින් දනිති. මව් කුස තුළ දරුවෙක් මරා දැමීම මිනී මැරුමක් වන්නේ කුමණ සීමාව ඉක්ම වුවහොත් දැයි නිගමනය කිරීම පිණිස සාධාරණ සීමාවක් සොයා ගැනීමට ඔවුහු ඔවුන්ගේ මොළවලට වද දුන්හ. මරණ අවස්ථාව නිර්ණය කිරීම ද එසේම දුෂ්කර දෙයකි. මක්නිසාදයත්, මරණය එක මොහොතකින් සිදුවන දෙයක්, නැතහොත් ක්ෂණික ප්‍රපංචයක් නොවන බවත්, ඉතා දීර්ඝ සිදවීම් මාලාවක් බවත්, කායික විද්‍යාව ඔප්පු කරන බැවිනි. මෙසේම, ජීවේන්ද්‍රිය සහිත සෑම සත්තාවක්ම සෑම මෙහොතකම එයම වන්නේද, නොවන්නේ ද වේ. සෑම මොහොතක් පාසාම එය පිටතින් එය පිටතින් සැපයෙන ද්‍රව්‍ය සවිකර ගනියි. ඒ අතරම වෙනත් ද්‍රව්‍ය ඉවතලයි. සෑම මොහොතකම එහි දේහයේ සමහර සෛල අභාවයට යයි. තවත් ඒවා අළුතින් සෑදෙයි. දීර්ඝ කෙටි කාලයකදී එහි දේහයේ ද්‍රව්‍ය සම්පූර්ණයෙන්ම අළුත්වෙයි. එනිසා සෑම ජීවේන්ද්‍රිය සහිත සත්තාවක් නිතරම එයම වන්නේය. එහෙත්, එයට වඩා වෙනස් දෙයන් වන්නේය. තවද, ප්‍රතිප්‍රත්‍යයක උැව දෙක, එහි ධන හා සෘණ, එකිනෙකට

ප්‍රතිවිරුද්ධ වන සේම ඒවා එකිනෙකෙන් වෙන්කළ නොහැකි බවද, ඒවායේ සියළුම ප්‍රතිපාක්ෂිකතාවයන් පවතිද්දීම ඒවා අන්නොන්‍ය වශයෙන් කාවැදී තිබෙන බවද, එය වඩාත් සමීප පරීක්ෂණයකට භාජනය කළ විටෙක අපට පෙනේ. එසේම හේතුව හා ඵලය ගැන සංකල්පයන් වලංගු වන්නේ එක් එක් තනි අවස්ථාවන් වලට ගලපාගත් කළ පමණක් වන බව ද අපට පෙනේ. නමුත් අපි තනි අවස්ථා ගෙන, සමස්තයක් වශයෙන් විශ්වය සමග ඒවා සම්බන්ධ වී ඇති පරිද්දෙන් ඒවා ගැන සලකා බවන කළ, ්වා එකිනෙක තුළට කාවැදී තිබෙන බව ද, විශ්වීය ක්‍රියාව සහ ප්‍රතික්‍රියාව තුළ හේතුව සහ ඵලය සදාකාලිකවම තැන් මාරැ කරගන්නා බවත්, එනිසා මෙහිදී ඵලය අන් තැනකදී හේතුව වන බව හා නැවතත්, එහි අනික් පැත්ත සිදුවන බවත්, ඒවා ගැන මෙනෙහි කිරීමේදී අපට පෙනෙන නිසා, එම අවස්ථා අවුල්වී යන බව ද අපට පෙනේ.

මෙම ක්‍රියාදාම හා චින්තන ක්‍රම කිසිවක් අධ්‍යාත්මවාදී තර්කණයේ රාමු කට්ටුවට ඇතුළත් නොවේ. අනිත් අතට, දයාලෙක්තික ක්‍රමය, ද්‍රව්‍යයන් හා ඒවායේ නියෝජනයන් වන අදහස්, ඒවායේ ප්‍රධාන සම්බන්ධය, අනුසන්ධානය, චලනය, සම්භවය හා අභාවයඅනුව ඒවාගැන වටහා ගනියි. එනිසා, ඉහත සදහන් කළ වැනි ක්‍රියාදාමයන්ම එහි කාර්ය පිළිවෙලම සනාථ කරණ සාධක ගණනාවකි. දයාලෙක්තික ක්‍රමය නිවැරදි බව ඔප්පු කරන සාක්ෂිය ස්වභාව ධර්මයයි. එමෙන්ම නවීන විද්‍යාවද මෙය ඔප්පු කිීමට උපකාර වෙමින් දිනෙන් දිනම වැඩිවන ඉතා සාරවත් කරුණු රැසක් සපයමින්, ඒ අනුව ස්වභාව ධර්මය අවසාන වශයෙන් කටයුතු කරන්නේ දයාලෙක්තික ක්‍රමයට මිස, අධ්‍යාත්මවාදය අනුව නොවන බවත්, ඇය නිත්‍ය වශයෙන් පුණරාවර්ථනය වන වක්‍රයක, සාදාකාලික ඒකීයත්වයක් තුළ චලනය නොවන අතර, සැබෑ ඓතිහාසීය පරිණාමයක් තුළින් ගමන් කරන බවත්, පෙන්නුම්කර තිබේ. මේ හා සම්බන්ධයෙන් අන් හැමදෙනාටම ප්‍රථම ඩාවින්ගේ නම සදහන් කළ යුතුය. ජීවෙන්ද්‍රිය සහිත සියළු සත්වයන්, පැළෑටි, සතුන් හා මිනිසාමත්, අවුරුදු කෝටි ගණනක් තිස්සේ සිදුවුණු පරිනාම ක්‍රියාදාමයක නිර්මාණයන් වන බව ඔප්පු කිරීමෙන් ඔහු ස්වභාව ධර්මය පිළිබද අධ්‍යාත්මවාදී සංකල්පයට බරපතලතම පහර ගැසුවේය. එහෙත් දයාලෙක්තික ක්‍රමයට චින්තනය කිරීමට උගත් ස්වභාවාත්මවාදීන් ඉතා අඩුය. ඔවුන් දක්නට ලැබෙන්නේ කලාතුරකිනි. මෙකළ ස්වභාවික විද්‍යාවේ රජයන, කොනක් නොමැති අවුලටත්, එය උගන්වන්නන්ගේ මෙන්ම උගෙන ගන්නන්ගේ හා කර්තෘවරුන්ගේ මෙන්ම කියවන්නන්ගේ ද වික්ෂිප්තතාවයටත්, හේතුවී තිබෙන්නේ සොයාගැනීම්වල ප්‍රතිඵල සහ කලින් පිළිගත් චින්තන ක්‍රම අතර ඝට්ටනයයි.

එනිසා, විශ්වය, එහි පරිනාමය හා මිනිස් වර්ගයාගේ පරිණාමය හා මෙම පරිණාමය මිනිස් සිත තුළ පරාවර්ථනය වීම පිළිබද නිවැරදි පිළිබිඹුවක් ලබාගත හැක්කේ, ජීවිතයේ සහ මරණයේද, ප්‍රගතිගාමක සහ ප්‍රතිගාමක වෙනස් වීම් වලද අසංඛ්‍යාත ක්‍රියා හා ප්‍රතික්‍රියා ගැන අනවරත සැලකිල්ලක් දක්වමින් දයාලෙක්තික ක්‍රමය අනුගමනය කිරීමෙන් පමණකි. නව ජර්මන් දර්ශනය කටයුතු කර තිබෙන්නේ මෙම ජීවගුණයෙන් යුතුවය. ප්‍රසිද්ධ ප්‍රාරම්භක ආවේගය දෙනුලැබීමෙන් පසුව, කාන්ට් ඔහුගේ චරියාව පටන්ගත්තේ, නිව්ටන්ගේ ස්ථායීසෞරග්‍රහ මණ්ඩලය සහ එහි සදාකාලික පැවැත්ම පිළිබද ගැටළුව විසදමින්, හා එය ඓතිහාසික ක්‍රියාදාමයක ප්‍රතිඵලයක් බවත්, බ්‍රමණය වන මහා පටල ස්කන්ධයකින් සූර්යයා සහ සියළුම ග්‍රහ තාරකා සැදුණු බවත් පෙන්වා දෙමින්ය. ඒ අතරම, සෞරග්‍රහ මණ්ඩලයේ මුල මෙසේම පිළිගත් විට, එහි අනාගත මරණය අවශ්‍යයෙන්ම සුදුවිය යුතු බව ඔහු නිගමණය කළේය. අර්ධ ශතවර්ෂයකින් පසුව ඔහුගේ න්‍යායය ලාප්ලාස් විසින් ගණිතමය වශයෙන් ඔප්පු කරන ලදී. විවිධ ඝනීභවනීය අවස්ථාවල පසුවන එවැනි තාපදීප්ත වායු ස්කන්ධයන් අවකාශයේ පවතින බව වර්ණාවලී දර්ශකය විසින් ඊට ශතවර්ෂයකට පසුව ඔප්පුකරන ලදී.

නව ජර්මන් දර්ශනවාදය හේගල්ගේ ක්‍රමයෙන් උච්ඡාවස්ථාවට පත්විය. ප්‍රථම වතාවට, ස්වාභාවික, ඓතිහාසික හා බුද්ධිමය යන හැම අංශයක්ම ඇතුළත් මුළු ලෝකයම, ක්‍රියාවලියක් ලෙස, එනම් අනවරත ලෙස චලිත වෙමින්, වෙනස් වෙමින් පරිවර්ථනය වෙමින් සංවර්ධනය වෙමින් පවතින්නක් ලෙස පිළිබිඹු කරන ලද්දේ මෙම ක්‍රමයෙනි. එම ක්‍රමයේ ශ්‍රේෂ්ඨ යහ ගුණය එයයි. තවද, චලනය සහ සංවර්ධනය අවිච්ඡේද සමස්තයක් බවට පත්කරන අභ්‍යන්තර සම්බන්ධතාවය සොයා ගැනීමේ ප්‍රයත්නයක් ද එය දරයි. මෙම දෘෂ්ටි කෝණය අනුව බලන කළ මිනිස් වර්ගයාගේ ඉතිහාසය, පරිනත තර්ක බුද්ධියේ විනිශ්චයාසනය හමුවේ එකසේ හෙළා දැකිය හැකි සහ හැකි තරම් ඉක්මනින් අමතක කිරීමට සුදුසු වන අර්ථයක් නැති ප්‍රචන්ඩ ක්‍රියා පිළිබඳ නපුරු සුලියක් මෙන් තවදුරටත් නොපෙනෙන අතර, එය මිනිසාගේම පරිණාමයේ ක්‍රියාදාමය ලෙසට පෙනේ. මෙම ක්‍රියාවලිය එහි සියළු දහර මාර්ගයන් ඔස්සේ ක්‍රමික ලෙස ගමනේ යෙදෙන කළ ඒ ගැන සෝදිසියෙන් සිටීමත්, අහඹුවෙන් සිදුවන සේ පෙණෙන එහි ප්‍රපංචයන් සියල්ලම තුළින් දිවෙන අභ්‍යන්තර නීතිය සොයා ගැනීමත්, දැන් බුද්ධියට පැවරී තිබෙන කර්තව්‍යය ය.

හේගල්ගේ ක්‍රමයෙන් ගෙනහැර දැක්වූ ප්‍රශ්නය එය විසින් නොවිසදන ලද බව මෙහිදී වැදගත් කරුණක් නොවේ. නමුත් එහි යුග නිර්මාණක ගුණය වුයේ එය එම ප්‍රශ්නය ගෙන හැර දැක්වීමය. මෙය නම් කිසිම තනි පුද්ගලයෙකුට විසදිය නොහැකි ප්‍රශ්නයකි. හේගල් සෙන්-සිමොන්ද සමග-ඔහුගේ කාලයේ ඉතාමත් සර්ව විද්‍යා විශාරද චින්තනය විය. එහෙත්, ඔහුද සීමාවන්ට යටත් විය. ප්‍රථමයෙන්ම අවශ්‍යයෙන්ම ඔහුගේ දැනුමේ සීමාවන්ටද, දෙවැනිව ඔහුගේ යුගයේ දැනුමේ හා සංකල්පයන්ගේ ප්‍රමාණය හා ගැඹුර පිළිබද සීමාවන්ටද ඔහු යටත් විය. මෙම සීමාවන්ට තවත් තුන්වැන්නක් එකතු කළ යුතු වේ. හේගල් විඥානවාදියෙක් විය. ඔහු තම මොළය තුළ වු චින්තනයන්, සැබෑ ද්‍රව්‍යයන් සහ සිද්ධිමාලාවන් දක්වන තරමක් වියුක්ත පින්තූර පමණක් වන බවය. මේ ආකාර චින්තන ක්‍රමය සියලු දේම උඩයට හැරෙව්වේය. ලෝකයේ වන ද්‍රව්‍යවල සම්බන්ධය සම්පූර්ණයෙන්ම ප්‍රතිවර්තනය කළේය. හේගල් එක් එක් කාරණා කාණ්ඩ නිවැරදි ලෙස හා විචක්ෂණ ලෙස සාක්ෂාත් කරගත්තේය. සාක්ෂාත් කරගත්තේය. එහෙත් එසේම, ඉහත දක්වා ඇති හේතු කාරණා කොට ගෙන මතගෑ, කෘත්‍රිම, රළු ලෙස නිමවාගත්, කොටින් කියතහොත්, විස්තරාත්මක කරුණු අනුව වැරදි තැන් ඔහුගේ කුමයෙහි ඇත. හේගල්ගේ ක්‍රමය මුළුමනින්ම ගත් කල එය යොධ ගබ්සාවක් බදුවිය. එහෙත් එය එම වර්ගයේ අවසාන එකද විය. ඇත්ත වශයෙන් එය අභ්‍යන්තර හා අසාධ්‍ය ප්‍රතිවිරෝධයකින් පීඩිතව පැවතියේය. එක් අතකින් එහි මුඛ්‍ය ප්‍රස්තුතය, මිනිස් ඉතිහාය යනු පරිනාමයේ සිද්ධිමාලාවක්ය යන සංකල්පය වූ අතර, එහි ස්වභාවය නිසාම, ඊනියා පරම සත්‍ය සොයා ගැනීම තුළින් එයට තමන්ගේ අංග සම්පූර්ණ සංණඛිතය දැකගත හැකි නොවීය. නමුත්, අනිත් අතට, එය මෙම පරම සත්‍යයයේ වැදගත්ම කොටස වන බවට අයිතිවාසිකම් කීවේය. සර්වග්‍රාහී සහ සදාකාලික සේ සර්ව සම්පූර්ණ සවභාවික හා ඓහාසීය ඥාන ක්‍රමයක් යනු දයලෙක්තික තර්කණයේ මූලික නීතියට ප්‍රතිවිරෝධී වන්නකි. බාහිර විශ්වය ගැන වූ ක්‍රමික දැණුම යුගයෙන් යුගයට යෝධ පියවරයන් තබන්නේය. යන අදහස මෙම නීතියෙහි අන්තර්ගතය. එය එම අදහස කිසිසේත් ප්‍රතික්ෂේප නොකරයි.

ජර්මන් විඥ්ඥානවාදයේ මූලික ප්‍රතිවිරෝධය හදුනා ගැනීම නිසා අවශ්‍යයෙනම ආපසු ද්‍රව්‍යවාදය කරා ගමන සිදුවිය. එහෙත් මෙහිදී එක් වැදගත් කරුණක් සදහන් කරගත යුතුවේ. ඒ ආපසු යාම වූයේ හුදෙක්ම දහඅටවන ශත වර්ෂයේ අධ්‍යාත්මවාදී, තනිකරම යාන්ත්‍රික සවභාවයේ ද්‍රව්‍යවාදය වෙතට නොවේ. පැරණි ද්‍රව්‍යවාදය මුලු ඉකුත් ඉතිහාසයම දෙස බලන්නේ කදු ගැසුනු දළදඩු අතාර්කික භාවයක් හා සැඩකමක් ලෙසටය. නවීන ද්‍රව්‍යවාදය එය දකින්නේ මිනිස් වර්ගයාගේ පරිනාම සිද්ධිමාලාව තුලිනි. එය එහි නීති තේරුම් ගැනීමට අරමුණු කරයි. දහ අටවන ශතවර්ෂයේ ප්‍රංශුවන් අතර හා හේගල් තුළ

පවා ස්වභාව ධර්මය පිළිබඳව බලපැවති සංකල්පය වූයේ එය පටු කව මාර්ගයක චලනය වන, සදාකාලිකවම විපරිනාම ලෙස පවතින, එසේම, නිව්ටන් ඉගැන්වූ පරිදි එහි සදාකාලික ඛගෝල වස්තූද, ලින්නේ උගැන්වූ පරිදි වෙනස් කළ නොහැකි ජීවේන්ද්‍රීය වර්ගයන් ද අන්තර්ගත කරගත් එකක් බවයි. නවීන ද්‍රව්‍යවාදය සවභාවික විද්‍යාවේ වඩාත් මෑත සොයාගැනීම් ආලිංගණය කර ගනී. නවීන විද්‍යාවේ සොයාගැනීම් අනුව ස්වභාව ධර්මයාටද කාලයානු බද්ධ ඉතිහාසයක් ඇත. යහපත් තත්වයන් යටතේ ඛගෝලීය වස්තුවල වෙසෙන ජීවේන්ද්‍රීය දේහයන් මෙන්ම එම වස්තූද උපදවමින්, විනාශ වෙමින් පවතී. සවභාව ධර්මය සමස්තයක් වශයෙන් පුනරාවර්තන චක්‍ර මාර්ගයක ගමන් ගනිතයි කීමට කිසියම් ලෙසකින් තවමත් උවමනා කරතත් එම චක්‍රයන් විශාලත්වයෙන් අනන්තමය පරිමාණයක් ගන්නේය. මේ දේඅංශයෙන්ම නවීන ද්‍රව්‍යවාදය ප්‍රධාන වශයෙන්ම දයලෙක්තික වේ. එනිසා, රැජිනක් ලෙසට අනෙකුත් විද්‍යාවන් නැමැති කළහකාරී රංචුව පාලනය කරන බවත්, පෙනවූ ආකාරයේ දර්ශනවාදයක ආධාරය දැන් එයට උවමනා නැත. මහා ද්‍රව්‍ය සමස්තයක්, ද්‍රව්‍ය පිළිබඳව අපේ දැණුම සම්භාරයක් තුළ විශේෂ විද්‍යාවකට හිමිවන තැන නොවැලැක්විය හැකි ලෙසම පැහැදිළි කිරීමට එයට සිදුවූ වහාම සමස්තය සම්බන්ධයෙන් ව්‍යාවෘත වන විද්‍යාවක් යනු අතිරික්තයක් හෝ අනවශ්‍ය දෙයක් හෝ වන්නේය. මුළුමහත් අතීත දර්ශනවාදය සමස්තයෙන්ම තවමත් රැකී පවතින්නේ චින්තන විද්‍යාව හා එහි නීති, එනම් විධිමත් තර්ක ශාස්ත්‍රය හා දයලෙක්තික ක්‍රමය පමනෙකි.

කෙසේ හෝ වේවා, සවභාවධරමය පිළිබඳ සංකල්පයේ විප්ලවය ඇතිකළ හැක්කේ, පර්යේෂණ විසින් සම්පාදනය කරන නියත කරුණු වලට අනුපාත වන ලෙස නමුත්, දැනටමත්, ඉතිහාසය පිළිබඳව සංකල්පය තීරණාත්මක ලෙස වෙනස් වීමට තුඩුදුන් යම් යම් අයිතිහාසික සාධක බොහෝ ඉහතදී ඇතිවී තිබේ. ප්‍රථම කම්කරු පංති කැරැල්ල 1831 දී ලියෝන් හිදී ඇති විය. ප්‍රථම ජාතික කම්කරු පංති ව්‍යාපාරය, එනම් ඉංග්‍රීසි චාටිස්ට් වරුන්ගේ ව්‍යාපාරය 1838 හා 1842 අතර කාලයේදී එහි උච්ඡස්ථානයට නැංගේය. යුරෝපයේ දියුණු රටවල් බොහෝමයකම ඉතිහාසය තුළ නිර්ධන පංතිය හා ධනපති පංතිය අතර පංති අරගලය පෙරමුණට වන්නේය. එය පෙරමුණට ආයේ එක් අතකින් නවීන කර්මාන්තයේද අනික් අතින් ධනපති පංතිය අළුතින් ලබාගත් දේශපාලන අධිපතිත්වයේද සංවර්ධනයට අනුපාත ලෙසය. ප්‍රග්ධනයේ සහ ශ්‍රමයේ අවශ්‍යතාවයන්ගේ සර්ව සමතාවය ගැන ද, මුදාහරින ලද තරගයේ ප්‍රථිඵලයක් වශයෙන් ඇතිවන විශ්වීය සංගතතාවය හා විශ්වීය සමෘද්ධිය ගැන ද කියන ධනපති ආර්ථිකයේ උගැන්වීම් සත්‍ය කරුණු විසින් වැඩි වැඩියෙන් බොරුකරනු ලැබ තිබේ. ඉතාමත් අසම්පූර්ණ ලෙස වුවද මේ සියල්ලෙහි න්‍යායික ප්‍රකාශනය වූ ප්‍රංශ හා ඉංග්‍රීසි සමාජවාදය අමතක කළ නොහැකි සේම, මෙම කරුණු තවදුරටත් අමතක කළ නොහැකිය. නමුත්, තවමත් ඉවත්කර දමා නැති, ඉතිහාසය පිළිබඳව වූ විඥානවාදී සංකල්පය ආර්ථික උවමනාවන් පදනම් කරගත් පංති අරගල ගැන කිසිවක් නොදත්තේය; ආර්ථික උවමනාවන් ගැන කිසිවක් නොදත්තේය. නිශ්පාදනය හා සියලුම ආර්ථික සම්බන්ධකම් එය තුළ පිළිබිඹු වූයේ "ශිෂ්ටාචාරයේ ඉතිහාසයෙහි" අමතර හා අප්‍රධාන කොටස් ලෙසටය.

නව කරුණු සොයා ගැනීම නිසා, මුළු අතීත ඉතිහාසයම නව විමර්ශනයකට ලක් කිරීම අවශ්‍ය විය. ආදිකල්පික අවධි හැර, <u>මුළු</u> අතීත ඉතිහාසයම පංති අරගල ඉතිහාසයක් බවත්, මෙම යුද්ධකාරී පංති නිතරම නිශ්පාදන සහ හුවමාරු මාර්ගවල, කොටින් කියතොත්, එම වකවානුවේ පැවති <u>ආර්ථික</u> තත්වයන්ගේ නිශ්පාදිතයන් වූ බවත්, සමාජයේ සැබෑ පදනම සැපයෙන්නේ ආර්ථික ව්‍යුහයෙන් බව හා නිශ්චිත ඓතිහාසික කාලයක නෛතික හා දේශපාලන ආයතන ද, ආගමික, දේශපාලන සහ අනෙකුත් අදහස් ද ඇතුලත් සමස්ත උඩු ව්‍යුහයම ගැන සම්පූර්ණ සහේතුක විස්තරයක් කළ හැක්කේ එම පදනමෙන් පටන් ගැනීමෙන් පමණක් බවත්, එවිට පෙනී ගියේය. හේගල් ඉතිහාසය ගැන අවබෝධය ආධ්‍යාත්ම වාදයෙන් මුදා ගත්තේය. ඔහු එය දයලෙක්තික ස්වභාවයට පත්කර තිබුණි.

නමුත් ඉතිහාසය පිළිබඳ වූ ඔහුගේ සංකල්පය ප්‍රධානකොටම විඥානවාදී විය. එහෙත් මේ වන විට විඥානවාදය එහි අවසාන රක්ෂස්ථානයෙන්, එනම් ඉතිහාසය පිළිබඳ දර්ශන වාදයෙන් පන්නා දමා තිබුණි. මේ වන විට ද්‍රව්‍යවාදී ලෙස ඉතිහාසය විස්තර කිරීම ගෙනහැර දක්වන ලදී. එතෙක් කළ ලෙසට මිනිසාගේ පැවැත්ම ඔහුගේ විඥානය අනුව විස්තර කරනවා වෙනුවට ඔහුගේ විඥානය ඔහුගේ පැවැත්ම අනුව විස්තර කිරීමේ ක්‍රමයක් සොයා ගන්නා ලදී.

එතැන් පටන් ඉදිරියට, සමාජවාදය හෝ අනෙක් විදර්ශක මොලයෙහි නිමැවුමක් නොව, ඓතිහාසික වශයෙන් සංවර්ධිත පංති දෙකක් අතර, නිර්ධන පංතිය හා ධනපති පංතිය අතර, අරගලයේ අවශ්‍ය ප්‍රතිපලය විය. හැකි තරම් පරිපූර්ණ සමාජයක් ගොඩ නැගීම එහි කර්තව්‍ය වශයෙන් ඉන් පසු පිළිගැනිනි. එතැන් පටන් එහි කර්තව්‍ය වූයේ මෙම පංති සහ ඒවායේ විරුද්ධතාවය පැණනැගීමට හේතුවූ ඓතිහාසික - ආර්ථික සිද්ධි පරම්පරාව පරීක්ෂා කිරීම හා එමස් නිර්මාණය වූ ආර්ථික කොන්දේසි කොන්දේසි තුළින් ඝට්ටනය කෙලවර කිරීමේ මාර්ග සොයා ගැනීමය. නමුත් පසුගිය කාලයේ සමාජවාදය මෙම ද්‍රව්‍යවාදී සංකල්පය සමග නොගැලපුනේය. එය, ප්‍රංශ ද්‍රව්‍යවාදීන් දැරූ ස්වාභාව ධර්මය පිළිබඳව වූ සංකල්පය සමග දයලෙක්තික ක්‍රමය හා ස්වභාවික විද්‍යාව නොගැලපුණු සේම විය. ඉහත කාළයේ සමාජවාදය, පැවති ධනපති නිශ්පාදය සහ එහි ප්‍රතිපල ඇත්ත වශයෙන්ම විවේචනය කළේය. නමුත් ඒයට ඒවා විග්‍රහ කර දැක්විය නොහැකි වූ හෙයින්, ඒවා අභිබවා ජය ලැබීමට එය සමත් නොවීය. එයට කළ හැකි වූයේ ඒවා නරක බව කියා හුදෙක් ප්‍රතික්ෂප කිරීම පමණකි. ධනපති ක්‍රමය යටතේ නොවැලැක්විය හැකි දෙයක් වූ කම්කරු පංතිය සූරාකනු ලැබීම ගැන යටගිය සමාජවාදය කළ හෙලාදැකීම බලවත් වූ තරමටම, මෙම සූරාකෑම කුමකින් සමන්විතවීද, එය කුමකින් පැණනැංගේද යන්න පැහැදිළි ලෙස පෙන්වා දීමට එය අසමත් වූයේය. එහෙත් මෙය කිරීම සදහා (01.) ධනපති ක්‍රමයේ ඓතිහාසික සම්බන්ධය සමග හා විශේෂ ඓතිහාසික කාලපරිච්ඡේදයක් තුලදී එහි අනිවාරණීය භාවය දක්වමින් එය ඉදිරිපත් කිරීම ද, ඒ අනුවම එහි බිදවැටීමේ අනිවාර්ය භාවය ඉදිරිපත් කිරීම ද, එසේම, (02) ඒවන තෙක්ම රහසක්ව පැවති එහි ප්‍රධාන ස්වාභාව ලක්ෂණය හෙළිදරව් කිරීම ද අවශ්‍ය විය. <u>අතිරික්ත වටිනාකම</u> සොයා ගැනීමෙන් එය ඉටුකරන ලදී. ධනපති නිශ්පාදන ක්‍රමයේත්, එය යටතේ කම්කරුවා සූරාකනු ලැබීමේත්, පදනම වන්නේ ගෙවීමක් නොකර ශ්‍රමය අතකර ගැනීම වන බවත්, වෙළදපලේදී ධනපතියා ඔහුගේ ශ්‍රමිකයාගේ ශ්‍රම ශක්තිය සදහා එහි පූර්ණ මිල ගෙවා එය වෙළද භාණ්ඩයක් වශයෙන් මිළට ගත්තද, ඔහු ඒ සදහා ගෙවූ මිලට වඩා වටිනාකමක් එයින් උදුරා ගන්නා බවත්, එමෙන්ම, අවසාන විග්‍රහයේදී හිමිකාර පංති අතෙහි ගොඩගැසෙන නිරතුරු වැඩිවන ප්‍රාග්ධන ස්කන්ධයන් බවට පත්වන විටිනාකම් ප්‍රමාණයන් සෑදෙන්නේ මෙම අතිරික්ත වටිනාකමෙන් බවත් පෙන්වා දෙන ලදී. ධනපති නිෂ්පාදනය හා ප්‍රග්ධන නිශ්පාදනය යන දෙකෙහිම මූලාරම්භය මෙයින් පැහැදිළි විය.

ඉතිහාසය පිළිබඳ ද්‍රව්‍යවාදී සංකල්පය හා අතිරික්ත වටිනාකම මගින් ධනපති ක්‍රමයේ නිශ්පාදනයේ රහස හෙළිදරව් කිරීම යන මේ සොයා ගැනීම් දෙක අප හමුවේ තැබුවේ <u>මාක්ස්ය</u>. මෙම සොයාගැනීම් සමගම සමාජවාදය විද්‍යාවක් බවට පත්විය. ඊළගට කළ යුතු වූයේ එහි විස්තර හා සම්බන්ධකම් සියල්ල පැහැදිළි කිරීමය.

## තෙවන කොටස

ඉතිහාසය පිළිබඳ ද්‍රව්‍යවාදී සංකල්පය ආරම්භ වන්නේ, මිනිස් ජීවිත රැකීමේ මාධ්‍යයන් හා ඊළගට නිශ්පාදනයේ හා නිශ්පාදනය කළ ද්‍රව්‍ය හුවමාරුවේ මාධ්‍යයන්, මුළු සමාජයේම පදනම වන බවද, ඉතිහාසයේ දක්නා ලද සෑම සමාජයකම වස්තුව බෙදා හරින ආකාරය හා සමාජය පංති වලට හා ගණවලට බෙදී තිබෙන ආකාරය රැදී පවතින්නේ නිශ්පාදනය කරන දේත්, එය නිෂ්පාදනය කරන විධියත්, නිෂ්පාදිතයන් හුවමාරු කරගන්නා ආකාරයත් අනුව බවද, පිළිගැනීමෙනි. මෙම දෘෂ්ටි කෝණය අනුව, සමාජ වෙනස්කම් හා දේශපාලන විප්ලවයන් ඇතිවීමේ අවසාන හේතු සෙවිය යුත්තේ, මිනිසාගේ මොළය තුළ, නැතහොත්, සදාකාලික සත්‍ය හා යුක්තිය ගැන මිනිසා වඩාත් පැහැදිළි දැණුමක් ලබා ගැනීම තුළින් නොව, නිශ්පාදන හා හුවමාරු ක්‍රමවල ඇතිවන වෙනස්කම් තුළය. ඒවා සෙවිය යුත්තේ <u>දර්ශනය</u> තුළ නොව එක් එක් විශේෂ යුගයෙහි <u>ආර්ථිකය</u> තුළය. යටගිය ආර්ථික තත්වයන්ට ගැළපුණු සමාජ ක්‍රමය, නිෂ්පාදනයේ හා හුවමාරුවේ නිහඩලෙහ ඇතිවී තිබෙන වෙනස්කම් නිසා, දැන් තවදුරටත් එසේ නොගැලපෙන බව ඔප්පු කරන්නකි, පවත්නා සමාජ සංස්ථා අසාධාරණයයි සහ අයුක්ති සහගත යයිද, "සාධාරණය අසාධාරණය බවටත්, යහපත වේදනාව බවටත් හැරී තිබේ" * යයිද, යන සංජානනය. හෙළිදරව්වී තිබෙන අංග අසමතාවයන් ඉවත් කිරීමේ මාධ්‍යයන්, එම නිෂ්පාදන ක්‍රම තුළම, අඩු වැඩි ලෙස සංවර්ධනය වූ තත්වයෙන් පවතින බව ද මෙයින් නිශ්චය වන්නේය. මෙම මාධ්‍යයන් සොයාගත හැක්කේ පවත්නා ක්‍රමයට අදාළ සත්‍ය කරුණු තුළිනි. මූලික ප්‍රතිපත්ති කෙරෙන් නිගමනයන්ට එළඹ ගැනීම තුළින් ඒවා <u>නිර්මාණය කරගත හැකි නොවේ</u>. එසේනම් මේ හා සම්බන්ධයෙන් නූතන සමාජවාදය දරන්නේ කුමණ තත්වයක් ද?

වර්තමාන සමාජ ක්‍රමය අද පාලක පංතිය වන ධනපති පංතියේ නිර්මාණයකි. මෙය දැන් කවුරුත් පාහේ පිළිගන්නා කරුණකි. මාක්ස්ගෙන් පසුව, ධනපති නිශ්පාදන ක්‍රමය යනුවෙන් හදුවනු ලබන, ධනපති පංතියට විශේෂ වූ නිෂ්පාදන ක්‍රමය, වැඩවසම් ක්‍රමය, එනම්, පුද්ගලයන්ට, සමාජ පදවිධාරීන් රාශියකට හා ප්‍රාදේශීය සංස්ථාවලට එය ප්‍රධානය කළ වරප්‍රසාද සහිත වූ හා එමෙන්ම එහි සමාජ සංයුතිය වූ පරම්පරාගත යටත්කාරී බන්ධනයන් සහිත වූ හා එමෙන්ම එහි සමාජ සංයුතිය වූ පරම්පරාගත යටත්කාරී බන්ධනයන් සමග වූ වැඩවසම් ක්‍රමය සමග එකකට එකක් ගැලපුණේය.වැඩවසම් ක්‍රමය බිදදැමූ ධනපති පංතිය, එහි නෂ්ටාවශේෂයන් මත නිදහස් තරගයේ, පෞද්ගලික නිදහසේ, නීතිය හමුවේ වෙළද භාණ්ඩ හිමියන් සියළු දෙනාගේම සමානාත්මතාවයේ හා අනෙකුත් සියළුම ධනපති අශීර්වාදයන්ගේ රාජධානිය වූ ධනපති සමාජ ක්‍රමය ගොඩ නැගුවේය. එවක් පටන් ධනපති ක්‍රමයට නිදහසේ සංවර්ධනය වීමට හැකිවිය. වාෂ්ප, යන්ත්‍ර හා යන්ත්‍ර මාර්ගයෙන් යන්ත්‍ර සෑදීම විසින්, භාණ්ඩ සෑදීමේ කල්ගිය ක්‍රමය නවීන කර්මානතය බවට පරිවර්තනය කරන ලද පසු, ධනපති පංතියේ මෙහෙයවීම යටතේ පිළියෙල කරගත් නිශ්පාදනීය බලවේගයන් පෙර නෑසූවිරූ තරම් සීඝ්‍රතාවයකින් හා ප්‍රමාණයකින් සංවර්ධනය විය. නමුත් භාණ්ඩ තැනීමේ පැරණි ක්‍රමය හා එහි බලපෑම යටතේ සංවර්ධනය වූ හස්ත කර්මාන්තය, ඒ කාලයේ ශ්‍රේණි කෙරෙහි බලපෑ වැඩවසම් බාධකයන් හා සමග ඝට්ටනය වූ ලෙසම දැන් වඩාත් අංග සම්පූර්ණ සංවර්ධනයෙන් යුත් නවීන කර්මාන්තය, එය හිරකර තැබීමට ධනපති නිෂ්පාදන ක්‍රමය පැනවූ සීමාවන් සමග ගැටෙන්නේය. නව නිෂ්පාදනීය බලවේගයන් උපයෝගී කරගන්නා ධනපති ක්‍රමය ඉක්මවා දැනටමත් එම බලවේග වර්ධනය වී ඇත. මුල් පාපය සහ දේව යුක්තිය අතර වූ ගැටුම මෙන් නොව, මෙම නිෂ්පාදනීය බලවේග සහ නිෂ්පාදන ක්‍රම අතර ගැටුම මිනිසාගේ සිතෙන් උපදවා ගත් එකක් නොවේ. එය සත්‍ය වශයෙන්, වාස්තවිකව, අපගෙන් බාහිරව, එය ගෙන ආ මිනිසුන්ගේ කැමැත්තෙන් හා ක්‍රියාවලින් පවා ස්වාධීනව පවතින්නේය. සමාජවාදය යනු අන් කිසිවක් නොව, සත්‍යවශයෙන් පවතින මෙම ඝට්ටණය චින්තනය පිළිබිඹු වීමය, ප්‍රථමයෙන්ම කම්කරු

පංතියේ, එනම්, එය යටතේ එක එල්ලේම පීඩා විඳින පංතියේ සිත්තුල එය පරමාර්ථයක් වශයෙන් පිළිබිඹු වීමය.

මෙම ඝට්ටනය සමන්විත වන්නේ කුමකින් ද?

ධනපති ක්‍රමයේ නිෂ්පාදනයට පෙර, එනම්, මධ්‍යකාලීන යුගයේදී, ශ්‍රමිකයාගේ නිෂ්පාදනීය මාර්ගවල පෞද්ගලික අයිතිය ඔහුට තිබීමේ අයිතිය මත පොදු වශයෙන් සුළු කර්මාන්ත පැවතියේය. ගම්බද පෙදෙස්වල කුඩා ගොවියාගේ, නිදහස් වැසියාගේ සහ ප්‍රවේණි දාසයාගේ ගොවිතැනද, නගරවල ශ්‍රේණි තුළ සංවිධානය කරන ලද හස්ත කර්මානතය ද පැවතිනි. ශ්‍රම උපකරණ, එනම් ඉඩම්, කෘෂිකාර්මික උපකරණ, කම්හල, වැඩ, ආයුධ යන මේවා තනි පුද්ගලයන්ගේ ශ්‍රම උපකරණ විය. ඒවා එක කම්කරුවකුගේ උපයෝගීතාවයට සුදුසු වන සේ සකස්කර තිබුණු හෙයින් අවශ්‍යයෙන්ම කුඩා, අගුටුමිටි සහ සීමිත ස්වභාවයේ විය. නමුත්, මෙම හේතුව නිසාම, ඒවා සිරිත් වශයෙන් නිෂ්පාදකයාටම හිමිවිය. මෙම විසිරිගිය හා සීමිත නිෂ්පාදන මාර්ගයන් ඒකස්ත කිරීමට, විවර්ධන කිරීමට සහ ඒවා වර්තමානයට ගැලපෙන බලවත් නිෂ්පාදනීය ලීවරයන් බවට හරවා ගැනීමට අවශ්‍ය විය. ධනපති නිෂ්පාදනයේ සහ එහි රක්ෂිකයා වන ධනපති පංතියේ ඓතිහාසික කාර්ය කොටස එය විය. පහලොස්වන ශතවර්ශයේ පටන්, සරල සහයෝගීතාවය, භාණ්ඩ තැනීමේ කර්මාන්ත හා නවීන කර්මාන්තය, යන තුන් අධියරකින් මෙය ඓතිහාසීය වශයෙන් ඉටුකර තිබෙන ආකාරය මාක්ස්ගේ "ප්‍රාග්ධනය" හතරවන කොටසේදී විස්තර සහිතව පැහැදිළි කර තිබේ. නමුත්, එහිද පෙන්වා දී ඇති පරිදිම, මෙම අගුටුමිටි නිෂ්පාදන මාධ්‍යයන් තනි පුද්ගල නිෂ්පාදන මාධ්‍යයන්ගේ තත්වයේ සිට, මිනිසුන් සමූහගත වීමෙන් පමණක් මෙහෙය විය හැකි වන සමාජමය නිෂ්පාදන මාධ්‍යයන් බවට පරිවර්තනය නොකර ඒවා දැවැන්ත නිෂ්පාදනීය බලවේගයන් වන සේ පරිවර්තනය කර ගැනීම ධනපති පංතියට කළ නොහැකි විය. චරකය, අත්යන්ත්‍රය හා කම්මල්කරුවාගේ මිටිය වෙනුවට කටින යන්ත්‍රය, බලවේග යන්ත්‍රය හා වාෂ්ප මිටිය ආදේශ කරන ලදී. තනි පුද්ගල කර්මාන්ත ශාලාව වෙනුවට, සිය ගණන් හා දහස් ගණන් වැඩකරන මිනිසුන්ගේ සහයෝගීතාවය හගවන පැක්ටරි ආදේශ කරන ලදී. එමෙන්ම, නිෂ්පාදනය තනි පුද්ගල ක්‍රියාමාලාවක සිට සමාජමය ක්‍රියාමාලාවක් දක්වාද, නිෂ්පාදිතයන් තනි පුද්ගල නිෂ්පාදිතයන්ගේ සිට සමාජමය නිෂ්පාදිතයන් දක්වාද වෙනස් විය. දැන් පැක්ටරියෙන් නිකුත්වූ රෙදිවියන නූල්, රෙදි සහ ලෝහ භාණ්ඩ කම්කරුවන් රැසකගේ ඒකාබද්ධ නිෂ්පාදිතයක් විය. ඒවා නිමවීමට පෙර ඒවා අනුගාමී වශයෙන් කම්කරුවන්ගේ අත් මගින් යායුතු විය. "මෙය සෑදුවේ මාය, මෙය මාගේ නිෂ්පාදිතයයි" කිසිම තනි පුද්ගලයෙකුට කිව නොහැකි විය.

නමුත් නිශ්චිත සමාජයක මූලික නිෂ්පාදන රටාව, කිසියම් පූර්ව කල්පිත සැලැස්මකින් තොරව, ක්‍රමික ලෙස පැතිරගිය සංසිද්ධික ශ්‍රම විභජනයක් වන කළ, එහි නිෂ්පාදිතයන් වෙළඳ භාණ්ඩ ස්වරූපයක් ගන්නේය. ඒවා අනෙනෝන්‍ය වශයෙන් හුවමාරුකර ගැනීමෙන්, මිළට ගැනීමෙන් හා විකිණීමෙන් තම තමන්ගේ අනේක විධ අවශ්‍යතාවයන් ඉටුකර ගැනිමට තනි පුද්ගලයන්ට හැකිවේ. මධ්‍යකාලීන යුගයේ සිදුවූයේ මෙයයි. නිදර්ශණයක් වශයෙන් ගොවියා කෘෂිකාර්මික නිෂ්පාදිත කර්මාන්ත ශිල්පියාට විකුණා ඔහුගෙන් හස්ත කර්මාන්ත නිෂ්පාදිත මිලට ගත්තේය. මෙම තනි පුද්ගල නිෂ්පාදකයන්ගේ සමාජයට, වෙළඳ භාණ්ඩ නිෂ්පාදකයන්ගේ සමාජයට, නිෂ්පාදනයේ නව ක්‍රමයක් කඩා වැදුනේය. නිශ්චිත සැලැස්මකින් තොරව සංසිද්ධික වශයෙන් වැඩී ගිය හා සමාජය මුළුල්ලේම බලපැවැත්වූ පැරණි ශ්‍රම විභජන මාධ්‍යයේම, පැක්ටරියේ සංවිධානය කරන ලද පරිදි වූ නිශ්චිත සැලැස්මක් අනුව වන ශ්‍රම විභජනයක් දැන් පැනනැගේය. තනි පුද්ගල නිෂ්පාදනය සමග උරෙන් උර ගැටී සිටින සේ සමාජමය නිෂ්පාදනය පැනනැංගේය. මේ දෙආකාරයේම නිෂ්පාදිත, යටත් පිරිසෙන් සමාන වූ හෝ මිළකට, එකම වෙළඳපලේ අලෙවි කරන ලදී.

නමුත් නිශ්චිත සැලැස්මක් අනුව කළ සංවිධානය සංසිද්ධික ශ්‍රම විභජනයට වඩා ශක්තිමත් විය. පුද්ගලයන් සමූහයක ඒකාබද්ධ සමාජ බලවේගයන් යොදා වැඩකළ පැක්ටරි, තනි කුඩා නිෂ්පාදකයන්ට වඩා බොහෝ අඩු වියදමකින් ඒවායේ වෙළඳ භාණ්ඩ නිෂ්පාදනය කළහ. නිෂ්පාදනයේ අංශයෙන් අංශයට තනි පුද්ගල නිෂ්පාදන වැටී ගියේය. සමාජමය වූ නිෂ්පාදනය පැරණි නිෂ්පාදන විධි සියල්ලම විප්ලවයකට භාජනය කළේය. නමුත් සමාජමය නිෂ්පාදනයේ විප්ලවවාදී ස්වරූපය කොතරම් අඩුවෙන් පිළිගැනී තිබිණිද යත්, එය ආරම්භ කරන ලද්දේ ඊට ප්‍රතිකූල අරමුණක් වූ වෙළඳ භාණ්ඩ නිෂ්පාදනය හා හුවමාරුව සඳහා යන්ත්‍රයක් වූ වෙළෙන්දාගේ ප්‍රාග්ධනයත්, හස්ත කර්මාන්තයත්, වේතන ශ්‍රමයත් නිමි තත්වයෙන් එයට හමු වූයෙන් එය එම යන්ත්‍රය බහුල ලෙස උපයෝගී කර ගත්තේය. සමාජමය නිෂ්පාදනය වෙළඳ භාණ්ඩ නිෂ්පාදනයේ නව ආකෘතියක් වශයෙන් හැඳින්වෙමින් එසේ ඉදිරිපත් වූ අතර, බලාපොරොත්තු විය හැකි පරිද්දෙන්ම, එය යටතේද, අයිතිකර ගැනීමේ පැරණි ආකෘති සම්පූර්ණ බලයෙන් යුතුව පැවතුනේ එම නිෂ්පාදනයේ නිෂ්පාදිතයන් විෂයෙහි ද ක්‍රියාත්මක වෙමිනි.

වෙළඳ භාණ්ඩ නිෂ්පාදනයේ මධ්‍යකාලීන පරිනාමයේදී, ශ්‍රමයේ නිෂ්පාදිතයේ හිමිකරුවා කවරෙක් ද යන ප්‍රශ්නය පැනනැගීමට ඉඩක් නොවීය. සෑම විටකම පාහේ තනි නිෂ්පාදකයා, ඔහුටම හිමි හා සාමාන්‍යයෙන් ඔහු සියතින් නිමවාගත් අමුද්‍රව්‍ය වලින්ද, ඔහුගේම ආයුධ උපයෝගී කරගනිමින් ද, ඔහුගේ හෝ ඔහුගේ පවුලේ අයගේ හෝ අත්වලින් භාණ්ඩ නිෂ්පාදනය කළේය. අළුත් නිෂ්පාදිතය අත්පත් කර ගැනීමේ අවශ්‍යතාවයක් ඔහුට නොවීය. එය සිරිතක් වශයෙන්ම සම්පූර්ණයෙන්ම ඔහුට අයත් විය. එනිසා නිෂ්පාදිතය කෙරෙහි වූ ඔහුගේ හිමිකම ඔහුගේම ශ්‍රමය මත පදනම් වූ එකක් විය. බාහිර ආධාර ලබාගත් අවස්ථාවලදී වුව, සෑම විටම පාහේ එය නොවැදගත් තැනක් ගත් අතර, සාමාන්‍ය සිරිතක් වශයෙන්ම, ඊට ප්‍රත්‍යුපකාර කරන ලද්දේ වේතන ගෙවීමෙන් නොව, වෙනත් ක්‍රමයකිනි. ශ්‍රෙණිවල අධුනිකයන් සහ පුහුණු ශිල්පීන් වැඩ කළේ වැඩිපුරම තමන්ම ප්‍රධාන ශිල්පීන් වීමේ බලාපොරොත්තුවෙන් අධ්‍යාපනය ලැබීම සඳහා මිස, එතරම් දුරටම ආහාර හා වේතන සඳහා නොවේ. අනතුරුව නිෂ්පාදන මාධ්‍යයන් හා නිෂ්පාදකයන් විශාල කර්මානත ශාලා තුළ සහ භාණ්ඩ තැනීමේ කර්මාන්ත තුළ සංකේන්ද්‍රය වීමත්, ඔවුන් සැබැවින්ම සමාජමය වූ නිෂ්පාදන මාධ්‍යයන් හා සමාජමය නිෂ්පාදකයන් බවට පරිවර්තනය වීමත් සිදුවිය. නමුත් මේ වෙනස ඇති වීමෙන් පසුව වුවද, සමාජමය නිෂ්පාදකයන් බවට පරිවර්තන වීමත් සිදු විය. නමුත් මෙම වෙනස ඇතිවීමෙන් පසුව වුවද, සමාජමය නිෂ්පාදකයන් හා ඔවුන්ගේ නිෂ්පාදිතයන් සැලකුණේ පෙර පරිද්දෙන්මය. එනම්, පුද්ගලයන්ගේ නිෂ්පාදන මාධ්‍යයන් හා නිෂ්පාදිතයන් වශයෙන්මය. මේ දක්වාම ශ්‍රම උපකරණ හිමියාම නිෂ්පාදිතය අත්පත් කර ගත්තේය. එසේ වූයේ නිතරම පාහේ ඔය ඔවුන්ගේ නිෂ්පාදිතය වූ නිසා සහ අන් අයගෙන් ආධාර ලබා ගැනීම සාමාන්‍යයෙන් සිදු නොවූ නිසාය. දැන් දැන් නිතරම පාහේ ශ්‍රම උපකරණ හිමියා නිෂ්පාදිතය තමාට අයත් කරගත් නමුත්, එය තවදුරටත් ඔහුගේ නිෂ්පාදිතය නොවීය. එය අන්‍යයන්ගේ ශ්‍රමයේ නිෂ්පාදිතයක් විය. එනිසා මෙකළ සමාජමය වශයෙන් නිපදවන නිෂ්පාදිතයන් අත්පත් කරගන්නා ලද්දේ නිෂ්පාදන මාධ්‍යයන් ඇත්ත වශයෙන්ම ක්‍රයාත්මක කළ අය, නැතහොත්, ඇත්ත වශයෙන් ශාණ්ඩ නිපදවන්න වුන් විසින් නොව, ධනපතියන් විසිනි. නිෂ්පාදන මාධ්‍ය සහ නිෂ්පාදනය ද ප්‍රධාන වශයෙන් සමාජමය තත්වයට පත්වී තිබිණි. නමුත් ඒවා යටපත්කර තිබුණේ, තනි පුද්ගලයන්ගේ පෞද්ගලික නිෂ්පාදන අවශ්‍ය කෙරෙන, හිමිකම් ක්‍රමයකටය. එම හිමිකම් ක්‍රමය යටතේ හා එය නිසාම, සෑම දෙනාටම තම තමන්ගේ නිෂ්පාදිතය හිමිවන අතර ඔහු එය වෙළඳපලට ගෙන එන්නේය. මෙම හිමිකර ගැනීමේ ආකෘතියට රුකුල්දෙන කොන්දේසි නිෂ්පාදන ක්‍රමය විසින් අහෝසි කරනු ලබන නමුත්, එය එම ආකෘතියට යටත්කර තිබේ(හිමිකර ගැනීමේ ආකෘතිය එසේම පැවතුනත්, ඉහත විස්තර කරන ලද වෙනස්කම් නිසා නිෂ්පාදය තරමට හිමිකර ගැනීමේ ස්වභාවයද විප්ලවයට භාජනය වී තිබෙන බව මෙහිදී සඳහන් කිරීම අවශ්‍ය

නොවේ. මාම මගේ නිෂ්පාදිතය හිමිකර ගන්නවාද? වෙනත් අයෙක් එය හිමිකර ගන්නවාද? යන්න වෙනත් ප්‍රශ්නයක් වන්නේය. ධනපති නිෂ්පාදන ක්‍රමය මුළුමනින්ම කළල ස්වභාවයෙන් අන්තර්ගතවූ වේතන ශ්‍රමය, ඉතා පැරණි බව මෙහිලා සඳහන් කරගන්න. ශතවර්ෂ ගණනාවක් තිස්සේ එය වහල් ශ්‍රමයත් සමග පැවතුනේ වරින්වර මතුවන විසිරීගිය ආකාරයෙනි. නමුත් කළලයට සංවර්ධනය ධනපති නිෂ්පාදන ක්‍රමය වශයෙන් නිසි ලෙස වියහැකි වූයේ ඊට සුදුසු ඓතිහාසික පූර්ව කොන්දේසි ඉටුවීමෙන් පසුව පමණකි.) නව නිෂ්පාදන ක්‍රමයට, එහි ධනපති ස්ළුභාවය ගෙනදෙන, මෙම ප්‍රතිවිරෝධය තුළ, වර්තමාන සමාජමය සතුරුතාවයන් සමස්තයෙහිම බීජය අන්තරගතය. නිෂ්පාදන ක්‍රමය වැදගත් නිෂ්පාදන ක්ෂේත්‍ර සියල්ල හා කාර්මික රටවල් සියල්ලම විෂයෙහි ලබාගන්නා ආධිපත්‍යය වැඩි වූ තරමට, එයින් තනි පුද්ගල නිෂ්පාදනය තව තවත් නොවැදගත් අවශේෂ තත්වයට පත් වූයේය. සමාජමය වූ නිෂ්පාදනය හා ධනපති ක්‍රමයේ නිෂ්පාදනය අතර අසංගතභාවය වඩ වඩාත් පැහැදිලි විය.

අප කියා ඇති ලෙසට, ප්‍රථම ධනපතියනට හිමි ස්භාවයේ වේතන ශ්‍රමය, වෙනත් ආකාරයේ ශ්‍රම ආකෘතිද සමග, වෙළඳ පොළේදී හමු විය. නමුත් එය විශේෂයක් වූ ඌණ පුරුකයක් වූ සහායක තත්වයේ වූ තාවකාලික වේතන ශ්‍රමය විය. කෘෂිකාර්මික කම්කරුවා සමහර අවස්ථාවල දින අනුව කුළියට අන්‍යයන්ගේ වැඩ කිරීමට ඉදිරිපත් වුවත් ඔහුට ඔහුගේම ඉඩම් අක්කර කීපයක් තිබුණ හෙයින් කුමන තත්වයක් යටතේ වුව එයින් දුගී ජීවනෝපායක් ලබා ගැනීමට ඔහුට පුළුවන් විය. ශ්‍රේණි සංවිධානය කර තිබුණේ අද පුහුණු ශිල්පියා හෙට ප්‍රධාන ශිල්පියා බවට පත්වන ලෙසටය. නමුත් නිෂ්පාදන මාධ්‍යයන් සමාජමය වී, ධනපතියන් ස්වල්ප දෙනෙකුගේ අතට සංකේන්ද්‍රණය වූ වහාම මේ සියල්ල වෙනස් විය. තනි නිෂ්පාදකයාගේ නිෂ්පාදන මාධ්‍යයන් හා ඔහුගේ නිෂ්පාදිතයන් ද එන්න එන්නම අගයෙන් තොරවිය. ධනපතියා යටතේ වේතන කම්කරුවකු වනු හැර වෙනත් ඔහුට කළහැකි දෙයක් ඉතිරි නොවීය. පසුගිය කාලයේ විශේෂත්වයක් සහ සහායක කාර්යයක් වූ දෙය දැන් සෑම තැනකම පවත්නා දෙය සහ සියළු නිෂ්පාදනයේ පදනම බවට පත්විය. කලින් ඌණපූරකයක් වූ ය කම්කරුවාට ඉතිරිවූ එකම කාරය බවට පත් විය. ටික කළකට පමණක් වේතන කම්කරුවා ජීවිත කාලයටම වේතන කම්කරුවෙක් විය. එම කාලයේම වැඩවසම් ක්‍රමය කඩා විසිරවීමෙන් ද, ගොවීන් ඔවුන්ගේ වාසභූමි වලින් පන්නා දැමීමෙන් ද ආදියෙන් ස්ථිර වේතන කම්කරුවාගේ සංඛ්‍යාව තවත් විශාල ලෙස වැඩි විය. එක් අතකින් ධනපතියාගේ අතෙහි සංකේන්ද්‍රනය වුනු නිෂ්පාදන මාධ්‍යයන් හා අනික් අතින් තමන්ගේ තමන්ගේ ශ්‍රම ශක්තිය හැර අන් කිසිවක් අහිමි නිෂ්පාදනයන් ද එකකින් අනික වෙන් කිරීම සම්පූර්ණ විය. සමාජමය වූ නිෂ්පාදනය සහ ධනපති ක්‍රමයේ හිමිකර ගැනීම අතර ප්‍රතිවිරෝධය නිර්ධන පංතිය හා ධනපති පංතිය අතර සතුරුතාවයක් ලෙසට ප්‍රකට වූයේය.

ධනපති ක්‍රමයේ නිෂ්පාදනය, වෙළඳ භාණ්ඩ නිෂ්පාදකයන්ගේ සමාජයකට, තනි තනිව නිෂ්පාදනය කරන්නන්ගේ සමාජයකට කඩා වැදුනු බව අපි දුටුවෙමු. එම නිෂ්පාදකයන් එකට බඳින සමාජ සම්බන්ධය වූයේ ඔවුන්ගේ නිෂ්පාදිතයන් හුවමාරු කර ගැනීමය. නමුත්, වෙළඳ භාණ්ඩ නිෂ්පාදනය පදනකරගත් සෑම සමාජයකම මෙම අමුත්ත දක්නට ලැබේ. එනම්, නිෂ්පාදකයන් හට ඔවුන්ගේම අන්තර් - සම්බන්ධකම් පාලනය කරගත නොහැකි වී තිබීමයි. එක් එක් තැනැත්තා, තමා වෙත තිබෙන නිෂ්පාදන මාධ්‍යයන් උපයෝගී කර ගනිමින් තමන්ගේම අවශ්‍යතාවයන් සඳහාත්, ඔවුන්ගේ ඉතිරි අවශ්‍යතාවන් සපුරා ගැනීම පිණිස හුවමාරු සඳහාත්, ඔහුගේ ඉතිරි අවශ්‍යතාවයන් සපුරා ගැනීම පිණිස හුවමාරු සඳහාත් භාණ්ඩ නිෂ්පාදනය කරයි. ඔහු නිපදවන විශේෂ භාණ්ඩයෙන් කොතරම් ප්‍රමාණයක් වෙළඳපලට පිවිසේ ද, එයින් කොතරම් ප්‍රමාණයක් අවශ්‍යවේ ද, යන්න කිසිවෙක් දන්නේ නැත. ඔහුගේ තනි පුද්ගල නිෂ්පාදනයෙන් සැබැවින්ම කිසියම් ඉල්ලුමක් සපිරේද යන්නවත්, කිසිවෙක් නොදනී. සමාජමය නිෂ්පාදනයේ අරාජිකත්වය රජ කරයි. නමුත් අන්

සෑම නිෂ්පාදනයක මෙන්ම වෙළද භාණ්ඩ නිෂ්පාදනයෙහිද එයටම විශේෂ වූ, එයින් වෙන්කළ නොහැකි නෛසර්ගික නීති ඇත. අරාජිතක්වය තිබිය දීම, එය තුළම හා එය මගින්ම මෙම නීති, ක්‍රියාත්මක වෙයි. එවා අනාවර්ණය වන්නේ නිරන්තරව පවත්නා එකම සමාජ අන්තර්-සම්බන්ධතාවය වන හුවමාරුව මගිනි. එසේම, මෙහිදී එම නීති, තරගයේ අනිවාර්ය නීති වශයෙන් තනි පුද්ගල නිෂ්පාදකයන්ට බලපායි. ප්‍රමයෙන් ඒවා මෙම නිෂ්පාදකයන්ගේ දැනුමට හසු නොවී පවතින්නේය. ඒවා ක්‍රමික වශයෙන් අත්දැකීම් වල ප්‍රතිපලයක් වශයෙන් ඔවුන් විසින් අවබෝධ කර ගැනීමට යෙදේ. එනිසා, ඒවා නිෂ්පාදකයන්ගෙන් ස්වාධීනව, ඔවුන්ගේ විශේෂ නිෂ්පාදන ක්‍රමයේ ලිහිලක් නොදෙන ස්වාභාවික නීති ලෙසට, ඔවුන්ට සතුරුතාවයකින් යුතුව ක්‍රියාත්මක වෙයි. නිෂ්පාදිතයන් විසින් නිෂ්පාදකයන් පාලනය කරන ලැබේ.

මධ්‍යකාලීන යුගයේදී , විශේෂයෙන්ම එහි මුල් ශතවර්ෂවල, නිෂ්පාදනය ප්‍රධාන වශයෙන් ඉලක්කකර තිබුනේ තනි පුද්ගල උවමනාවන් ඉටුකිරීම වෙතය. ප්‍රධාන වහයෙන් ම එයින් ඉටු වූයේ නිෂ්පාදකයාගේ සහ ඔහුගේ පවුලේ උවමනාවන් ය. පිටිසර පෙදෙස්වල මෙන්ම පුද්ගලික ගැතිභාවයේ සම්බන්ධකම් පැවති තැන්හි, රදල ස්වාමියාගේ අවශ්‍යතාවයන් ද ඉටු කිරීමට එය ආධාරකාරී විය. එනිසා මේ සියල්ලේම හුවමාරුවක් නොවීය. ඒ හේතුකොටගෙන නිෂ්පාදිතයන් වෙළද භාණ්ඩ ස්වරූපයක් නොගත්තේය. ගොවියාගේ පවුල එයට අවශ්‍ය සියළු දේම පාහේ සපයා ගත්තේය. රෙදිපිළි හා දැව භාණ්ඩත්, එමෙන්ම ආහාර ද්‍රව්‍යයත් සපයා ගත්තේය. පවුල තමන්ගේම අවශ්‍යතාවයන් ද හා රදළ ස්වාමියාට ගෙවීම් කිරීම ද සදහා ප්‍රමාණවත් තරමට වඩා නිෂ්පාදනය කිරීමට පසුව පමණකි. ය වෙළද භාණ්ඩ නිෂ්පාදනය කිරීමට පටන් ගත්තේය. මෙම අතිරික්ත සමාජමය හුවමාරුවට ඇතුලත් කර වෙළදාම සදහා ඉදිරිපත් කරන ලද කළ එය වෙළද භාණ්ඩ බවට පත් විය. නගරවල කර්මාන්ත ශිල්පීන්ට, ආරම්භයේ සිටම හුවමාරුව සදහා භාණ්ඩ නිපදවන්නට සිදුවූ බව සැබෑය. නමුත් තමන්ගේම තනි පුද්ගල අවශ්‍යතාවයන්ගෙන් ඉතා විශාල කොටසක් ද ඔවුහුම සපයා ගත්හ. ඔවුනට වතු හා ඉඩම් කට්ටි තිබුණේය. ඔවුහු ඔවුන්ගේ ගවයන් පොදු කැලයට දැක්කූ අතර එම කැලයෙන් දැව හා දර ද ලබාගත්තේය. ස්ත්‍රීහු පැලැක්ස් හණ හා ලොම් විවීම යනාදිය කළහ. හුවමාරුව සදහා නිෂ්පාදනය කිරීම, නැතහොත, නැතහොත් වෙළද භාණ්ඩ නිෂ්පාදනය පැවතුනේ ළදරු වියට සමාන කළ හැකි තත්වයක පමණකි. එනිසා හුවමාරුව සීමාසහිත විය. වෙළදපොළ පටුවිය. නිෂ්පාදන විවිධ ස්ථර විය. ප්‍රාදේශීය වශයෙන් පිටතින් වෙන්වීමත්, අභ්‍යන්තර ප්‍රාදේශිය සමගියත් පැවතියේය. ගමෙහිදී මාර්ක්ක් සමාජයද (මෙහි 4 වැනි සටහන බලන්න.. එංගල්ස් මෙහි සදහන් කරන්නේ "දී මාර්ක්" නමින් ඔහු කළ කෘතියටය-සංස්කාරක) නගරයෙහි ශ්‍රේණිය ද විය.

නමුත් වෙළද භාණ්ඩ නිෂ්පාදනයේ ව්‍යාප්තියත් සමග, විශේෂයෙන්ම, ධනපති නිෂ්පාදන ක්‍රමයේ ආරම්භයක් සමග, ඒ දක්වා සැගවී තිබුණු වෙළද භාණ්ඩ නිෂ්පාදනයේ නීති වඩාත් විවෘත්ත ලෙස හා වඩාත් බලවත් ලෙස ක්‍රියාත්මක විය. පැරණි බැමි බුරුල් විය. පැරණි වෙන්කිරීමේ සීමාවන් බිද දමන ලදී. එන්න එන්නම නිෂ්පාදකයන් ස්වාධීන හා තනිවූ වෙළද භාණ්ඩ නිෂ්පාදකයන් බවට පත්විය. පොදු සමාජයේ නිෂ්පාදන සැලැස්මක් නොමැතිකම, අහඹුව හා අරාජිකත්වය විසින් පාලනය වන බව පෙනී ගියේය. මෙම අරාජිකත්වය වඩ වඩාත් ඉහළට වැඩින. නමුත්, සමාජමය නිෂ්පාදනයේ මෙම අරාජික භාවය උත්සන්න කිරීමට ධනපති නිෂ්පාදන ක්‍රමය ආධාර කොටගත් ප්‍රධාන මාධ්‍ය වූයේ අරාජිකත්වයට ප්‍රතිවිරුද්ධ දෙයයි. එය නම් නිෂ්පාදනය වැඩි වැඩියෙන් සංවිධානය කිරීමයි. එය සමාජමය පදනමක් මත සෑම තනි පුද්ගල නිෂ්පාදනීය ආයතනයකම ක්‍රියාත්මක කෙරිණ. මෙයනි, පැරණිකළ පැවති සාමකාමී, ස්ථායී තත්වයන් කෙළවර විය. නිෂ්පාදනයේ කිසියම් අංශයක

නිෂ්පාදන සංවිධානය ආරම්භ කරන ලද පසු, එය තමන් සමග එක ළඟින් තවත් කිසිම ආකාරයක නිෂ්පාදන විධියක පැවැත්ම නොඉවසුවේය. ශ්‍රමික ක්ෂේත්‍රය සටන් භූමියක් බවට හැරිණි. ශ්‍රේෂ්ඨ ශාස්ත්‍රීය සොයාගැනීම්[52] හා ඒ අනුගාමී වූ යටත් විජිතකරණය නිසා වෙළඳ පළවල් වැඩිවිය. එනිසාම හස්ත කර්මාන්තය භාණ්ඩ තැනීමේ කර්මාන්තය වශයෙන් පරිවර්ථනය වීම ඉක්මන් විය. යුද්ධය ඇතිවුණේ හුදෙක්ම විශේෂ ප්‍රදේශවල තනි නිෂ්පාදකයන් අතර නොවේ. ප්‍රාදේශීය අරගල නිසා කල් යාමේදී ජාතික ලැටුම් ඇතිවිය. - 17 වැනි සහ 18 වැනි ශත වර්ෂයේ වානිජ යුද්ධ ඇතිවිය. [53]අවසානයේ දී, නවීන මහා පරිමාණ කර්මාන්තය හා ලෝක වෙළඳපල ආරම්භ වීම නිසා අරගලය විශ්වීය ස්වභාවයක් ගත් අතරම, එම අරගලය පෙර නොඇසූ තරම් කර්කශස වූයේය. තනි ධනපතියන් මෙන්ම, මුළු කර්මාන්ත රටවල්ම පවතින්නේ ද නැද්ද යන්න තීරණය වූයේ නිෂ්පාදනයේ ස්වභාවික නැතහොත් කෘතීම තත්වයන් සලසන වාසි අනුවය. ඇදවැටෙන තැනැත්තා දයානු කම්පා විරහිතව ඉවත දමනු ලැබේ. එය නම් තනි පුද්ගලයා ඔහුගේ පැවැත්ම සඳහා කරන ඩාවින් න්‍යායානුකූළ අරගලයයි. එය වඩාත් උත්සන්න සැඩබවක් සහිතව ස්වභාව ධර්මයෙන් සමාජයට මාරුවී තිබේ. සත්වයන්ගේ පැවැත්මට ස්වභාවික වූ තත්වයන් මිනිස් සංවර්ධනයේ අවසාන කොන්දේසිය බවට පත්විය. සමාජමය වූ නිෂ්පාදනයත්, ධනපති ක්‍රමයට ආවේනික හිමිකර ගැනීමත් අතර ප්‍රතිවිරෝධතාවය මේ වන විට තනි කර්මාන්ත ශාලාවෙහි නිෂ්පාදනය සංවිධානය කිරීම සහ පොදු වශයෙන් සමාජයේ නිෂ්පාදනයෙහි අරාජික භාවය අතර වන සතුරුතාවයක් ලෙසට ඉදිරිපත් වන්නේය.

ධනපති නිෂ්පාදන ක්‍රමය, එහි ආරම්භයේ පටන්ම එයට අන්තර්භූත වූ මෙම සතුරුතා ආකෘති දෙක තුළ චලනය වෙයි. ෆූරියේ දැනටමත් සොයාගෙන තිබෙන එම "විශම කවයෙන්" ඉවත් වීමට එයට හැකියාවක් නැත. ෆූරියේ ඔහුගේ කාලයේදී දැකීමට නොහැකි වූ දෙයනම් ඇත්ත වශයෙන්ම මෙම කවය පටුවෙමින් පවතින බවයි. චලනය වඩ වඩාත් සර්පිල ස්වභාවයක් ගන්නා හෙයින්, ග්‍රහ තරුවල චලනය මෙන් එය මධ්‍ය සමග සංඝට්ඨනය වීමෙන් කෙළවර වියයුතු බවයි. මිනිසුන්ගෙන් අති බහුතරය තව තවත් නිර්ධනයන් බවට හරවන්නේ පොදු සමාජයේ නිෂ්පාදනයෙහි පවත්නා අරාජික භාවයේ බලකාරී සත්‍යයයි. එසේම, නැවතත් නිෂ්පාදනයේ අරාජික භාවය කෙළවර කරන්නේ ද නිර්ධන පංති පොදු ජනතාවමය. නවීන කර්මාන්ත යටතේ යන්ත්‍ර අසීමිත ලෙස දියුණු කිරීමේ හැකියාව අනිවාර්ය නීතියක් බවට හරවමින්, ඒ අනුව සෑම තනි පුද්ගල කාර්මික ධනපතියකුගේම යන්ත්‍ර දියුණු කිරීමට බලකන හා එසේ නොකළහොත් විනාශයේ දඬුවම දෙන බලකාරී ශක්තිය සමාජමය නිෂ්පාදනයේ අරාජික භාවයයි. නමුත් යන්ත්‍ර දියුණු කිරීම යනු මිනිස් ශ්‍රමය අනවශ්‍ය වන තත්වයක් ඇති කිරීමය. වැඩට යන්ත්‍ර යොදා ගැනීම සහ යන්ත්‍ර සංඛ්‍යාව වැඩි කිරීම යනු දශලක්ෂ සංඛ්‍යාත අතින් වැඩකරන කම්කරුවන් ඉවත්කර ඒ වෙනුවට යන්ත්‍ර මගින් වැඩකරන කම්කරුවන් සවල්ප දෙනෙක් ආදේශ කිරීම වේනම් යන්ත්‍ර දියනු කිරීම යනු යන්ත්‍ර මගින් වැඩකරන කම්කරුවන්ව වැඩි වැඩියෙන් ඉවත් කිරීම වන්නේය. අවසාන වශයෙන් එයින් ඉටු කරන්නේ ප්‍රාග්ධනයට සාමාන්‍යයෙන් අවශ්‍ය වන ප්‍රමාණයට වැඩි වැඩියෙන් උපයෝගී තාවය සඳහා සූධානම් වේතන කම්කරුවන් සංඛ්‍යාවක් ඇති කිරීමකි. කර්මාන්තයේ වැඩ ඉතා වේගවත් ලෙස කෙරෙන අවස්වලදී උපයෝගී කර ගැනීමත්, නොවැලැක්විය හැකි බිඳ වැටීම ආ කළ මහපාරට ඇද දැමීමත් සඳහා මා 1845 දී කී ("එංගලන්තයේ කම්කරු පංතියේ තත්වය" , පිටු 109 - සංස්කාරක) අංග සම්පූර්ණ කාර්මික හමුදාව ඇති කිරීමකි. කම්කරු පංතිය ස්වකීය පැවැත්ම සඳහා ධනපති පංතියට විරුද්ධව කරන අරගලයේදී එය කම්කරු පංතිය මත වැටුණු බරක් වන්නේය. එය ධනපති පංතියේ උවමනාවන්ට ගැලපෙන සේ වේතන පහල මට්ටමේ තබා ගැනීමට ආධාර වන නියමු අවයවයක් වන්නේය. ඒ අනුව මාක්ස්ගේ වචනවලින් කියතොත් කම්කරු පංතියට විරුද්ධව ධනපති පංතිය කරන යුද්ධයේ බලගතුම අයුධය යන්ත්‍ර වන්නේය. ශ්‍රම උපකරන නිරතුරුවම ශ්‍රමිකයාගේ අතින් ජීවනෝපාය මාධ්‍යයන් උදුරා දමයි. කම්කරුවාම නිපදවන නිෂ්පාදිතය ඔහු යටත් කිරීමේ උපකරණයක් බවට හරවා ගනු ලැබේ[54]. ඒ අනුව ශ්‍රම

උපකරණ මගින් කෙරෙන පිරිමැස්ම ඒ හා සමගම එය ආරම්භයේ පටන්ම ඉතාමත් නොසැලකිලිමත් ලෙස ශ්‍රම ශක්තිය අපතේ හැරීමක් ද වන්නේය. සාමාන්‍යයෙන් ශ්‍රමය ක්‍රියාත්මක වීමට අදාළ වන කොන්දේසි පදනම් කරගෙන කරන කොල්ල කෑමක් වන්නේය[55]. යන්ත්‍ර, එනම් ශ්‍රම කාලය කෙටි කරන ඉතාමත් බලවත් උපකරණයක් ධනපතියාගේ ප්‍රාග්ධනයෙහි අගය විවර්ධනය කිරීම පිණිස ශ්‍රමිකයාගේ කාලය සහ ඔහුගේ පවුලේ අයගේ කාලය සෑම මොහොතක්ම ධනපතියාගේ ප්‍රයෝජනය සඳහා ඔහුට ලබාදෙන ඉතාමත් සාර්ථක මාර්ගයක් වන්නේය. ඒ අනුව සමහරක් දෙනා අධික ලෙස වැඩ කිරීම, වෙනත් අය වැඩ නොකර සිටීමට අවශ්‍ය ප්‍රාථමික කොන්දේසිය වන්නේය. ලෝකය මුළුල්ලේම නව පාරිභෝගිකයන් ලුහු බඳිමින් දිවෙන නවීන කර්මාන්තය ස්වදේශයේ පොදු ජනතාවගේ පරිබෝජනය සාගතය හා සමාන අවමය දක්වා පහත හෙලන අතර එමගින් තමන්ගේ ස්වදේශීය වෙළඳ පොළ විනාශ කරයි. "සාපේක්ෂ වශයෙන් අතිරික්ත ජනගහනය නැතහොත් අතිරේක කාර්මික හමුදාව සමුච්ඡ ගතවීමේ ප්‍රමාණය හා ශක්තිය සමග නිතරම තුළනය කරන නීතිය විසින් කම්කරුවා ප්‍රාග්ධනයට සවිකෙරෙන්නේ ප්‍රොමිතියස් පර්වතයට සවිකල වල්කන් දෙවියාගේ කුඤ්ඤවළටත් වඩා ශක්තිමත් ලෙසටය. ප්‍රාග්ධන සමුච්ඡය හා සමගම එය දුක් දොම්නස් සමුච්ඡයක් ද ස්ථාපිත කරයි. එනිසා එක ධ්‍රැවයක වස්තුව සමුච්ඡගත වීම හා සමගම අනික් ධ්‍රැවයෙහි, එනම්, <u>තමන්ගේ නිෂ්පාදිතය ප්‍රාග්ධන ස්වරූපයෙන්</u> නිපදවන පංතියේ පැත්තෙහි දුක්-දොම්නස්ද, වෙහෙසවීමේ වේදනාවද, වහල් බවද, අවිද්‍යාවද, කෲරකමද, මානසික පිරිහීම ද වන්නේය"(මාක්ස්ගේ "ප්‍රාග්ධනය", සොනෙන්ෂයින් සහ සමාගම, පිටු 661) නිෂ්පාදන බෙදීමේ වෙනත් ආකාරයක් ධනපති නිෂ්පාදන ක්‍රමයෙන් අපේක්ෂා කිීම යනු බැටරියක විද්‍යුත් අග්‍ර අල්පාම්ලිත ජලය වියෝජනය නොකරනු ඇතැයි ද, බැටරියේ ධ්‍රැව සසම්බන්ධ වී තිබෙන තාක්කල් ධණ ධ්‍රැවයෙන් අම්ලකර සෘණ ධ්‍රැවයෙන් හයිඩ්‍රජනුත් මුදා නොහරිනු අතැයි අපේක්ෂා කිරීම වැන්න.

යන්ත්‍ර දියුණු කිරීම සඳහා ඇති සදා වැඩිවන හැකියාව, තනි පුද්ගල ධනපතියාගේ යන්ත්‍ර නිරතුරුවම වැඩි කිරීමටත් ඔහුට බලකරන අනිවාර්ය නීතියක් බවට, සමාජමය නිෂ්පාදිතයේ අරාජිකත්වය විසින් හරවනු ලැබීම අපි දැක ඇත්තෙමු. නිෂ්පාදන ක්ෂේත්‍රය ප්‍රසාරණය කිරීමේ හුදු හැකියාව ද, ඔහු විෂයෙහි එසේම ක්‍රයාත්මක වන අනිවාර්ය නීතියක් බවට පරිවර්තනය වී ඇත. නවීණ කර්මාන්තයේ ප්‍රසාරණීය බලය හා සමග සංසන්ධනය කරන කළ වායුවෙහි ප්‍රසාරණීය බලය ළමා ක්‍රීඩාවක් සේ පෙනේ. නවීන කර්මාන්තයෙහි එම බලය දැන් අපට පෙනෙන්නේ සියලු ප්‍රතිරෝධනයක්ම ගැන සිනාසෙන, සංඛ්‍යාත්මක සහ ගුණාත්මක යන දෙ ආකාරයෙන්ම ප්‍රසාරණය වීමේ <u>අවශ්‍යතාවයක්</u> ලෙසිනි. එවැනි ප්‍රතිරෝධනයන් ඉදිරිපත් කෙරෙන්නේ පරිභෝජනය අලෙවිය හා නවීන කර්මාන්තයේ භාන්ඩ සඳහා ඇති වෙළඳ පොළවල් මගිනි. නමුත් වෙළඳ පොළවල් විස්තීර්ණ හා පාලනය වන්නේ බොහෝ සෙයින් අඩු ශක්තියකින් ක්‍රියාත්මක වන සම්පූර්ණයෙන්ම අමුතු නීති මගිනි. නිෂ්පාදනය ව්‍යාප්ත වන තරම් වේගයකින් වෙළඳ පොළවලට ව්‍යාප්ත විය නොහැකිය. සංඝට්ටනය වැලැක්විය නොහැකි වන්නේය. මෙන්ම එයින් ධනපති නිෂ්පාදන ක්‍රමය කැබලිවලට බිඳී නොයන තාක් කල් එයින් විසඳීමක් ඉදිරිපත් වන්නේද නැත. සංඝට්ටනය වාරික සිදුවීමක් බවට පත්වේ. ධනපති නිෂ්පාදනය තවත් "විෂම කවයක්" උරුම කරගෙන ඇත.

ඇත්ත වශයෙන්ම 1825 වර්ෂයේදී ප්‍රථම පොදු අර්බුදය ඇති වීමෙන් පසුව, සමස්ත කාර්මික හා වාණිජ ලෝකයෙහිමද සියලුම ශිෂ්ටාචාර ජනතාවන් හා ඔවුන්ගේ තරමක් වනචාරී හෙන්චයියන් අතර නිස්පාදනයෙහි හා හුවමාරුවෙහිද හන්දි ඇඹරී යාමක් සෑම අවුරුදු දහයකට පමණ වරක් ඇති වන්නේය. වාණිජය ඇණහිට තිබේ. වෙළඳ පොළෙහි බඩු පිරී ඉතිරී ඇත. නිෂ්පාදිතයන් ගොඩ ගැසෙයි. ඒවා දැවැන්ත ප්‍රමාණයෙන් වැඩි වන සේම අලෙවි කිරීමටද නොහැකිය. මුදල් නැතිව යයි. ණයවර පහසුකම් අතුරුදහන් වෙයි.

පැක්ටරි වසා ඇත. කම්කරු පොදු ජනතාවට අවශ්‍ය යැපීම් මාධ්‍යයන් නොමැතිය. එසේවී තිබෙන්නේ පමණට වැඩියෙන් යැපීම් මධ්‍යයන් නිපදවූ හෙයිනි. එක පිට එක බංකොලොත් ලැබීමද, එකපිට එක විකුණා දැමීම ද සිදුවේ. එකතැන පල්වීම අවුරුදු ගණනක් පවතී. එකතුවූ වෙළඳ භාණ්ඩා රාශිය එක් එක් ක්ෂයතුළ ක්ෂය කළ වටිනාකම් අනුව දීමෙන් ඒවා අවසාන වශයෙන් ඉකුත්වී, නැවතත් නිෂ්පාදනය හා හුවමාරුව ක්‍රමික වශයෙන් ක්‍රියාත්මක වීමට පටන් ගන්නා තෙක් නිෂ්පාදනීය බලවේග සහ නිෂ්පාදිතයන් තොග ගණනින් ක්ෂය වන්නේය. නැතහොත්, විනාශ වන්නේය. මදින් මද වේගය ඉක්මන් වෙයි. එය ඉක්මන් ගමණක් බවට හැරෙයි. කාර්මික ඉක්මන් ගමණ හෙමින් දිවීමකට ද හැරී එය අනතුරුව කර්මාන්තය, වානිජ ණය දීම හා සමපේක්ෂය පිළිබඳ අංග සම්පූර්ණ ස්ටීපල් චෙස් තරගයකදී ඉව බවක් නොමැතිව ඉමහත් වේගයකින් කරන අසු පැන්නීමක් බව වර්ධනය වී අවසානයේ දී බෙල්ල බිදෙන පිමි පැන පටන්ගත් තැනින්ම එනම් අර්බුධයේ අගලෙහිම වැටී කෙළවර වේ. නැවත නැවතත් එසේම සිදුවන්නේය. 1825 වර්ෂයෙන් පසුව අපි පස් වරක් මෙය අත්දුටුවෙමු. දැනට (1877) අපි හයවෙනි වතාවටත් පීඩා විඳිමන් සිටින්නෙමු. මෙම අර්බුධවල ස්වභාවය කොතරම් පැහැදිලි ලෙස නිර්ණය වීද යත් ෆූරියේ පළමු වැන්නම Crise plethoribue බහුලත්වයේ අර්බුදයක් වශයෙන් විස්තර කළේය. එම විස්තරය එම අර්බුද සියල්ලටම ගැලපේ.

මෙම අර්බුද වලදී සමාජමය නිෂ්පාදනය සහ හිමිකර ගැනීමේ ධනපති ක්‍රමය අතර ප්‍රතිවිරෝධය කෙලවර වන්නේ වේගවත් පිපිරීමකිනි. වෙළඳ භාණ්ඩ සංසරණය තාවකාලිකව නැවතේ. හුවමාරු මාධ්‍ය වන මුදල හුවමාරුවට භාධකයක් වේ. වෙළඳ භාණ්ඩ නිෂ්පාදනය හා හුවමාරුව පිළිබඳ නීති සියල්ලම උඩුයටි හැරී ඇත. ආර්ථික සංඝට්ඨනය එහි අතිපතල අවස්ථාවට පැමිණ තිබේ. නිෂ්පාදන ක්‍රමය හුවමාරු ක්‍රමයට විරුද්ධව කැරළි ගසයි.

මෙහි සත්‍ය කරුණ වන්නේ, පැක්ටරිය තුළ සංවිධානය කරණ සමාජමය නිෂ්පාදනයක්, ඒ සමගම උරෙනුර ගැටී පවතින හා එය කෙරෙහි අධිපතිත්වය පාන, සමාජ නිෂ්පාදනයේ අරාජිකත්වයත්, අතර අසංගතියක් පැවතීමයි. අර්බුද අවස්තාවලදී වේගවත් ප්‍රාග්ධන සංකේන්ද්‍රණය මගින් හා ලොකු ධනපතියන් බොහෝමයක් හා කුඩා ධනපතියන් ඊට වඩා විශාල සංඛ්‍යාවක් විනාශ වීම තුළින් ධනපතියනටම එය අවබෝධ කරනු ලැබේ. ධනපති නිෂ්පාදන ක්‍රමයේම නිර්මාණයක් වූ නිෂ්පාදනීය බලවේගයන්ගේ බලපෑම යටතේ එම නිෂ්පාදන ක්‍රමයේ මුළු යන්ත්‍රයම බිඳ වැටේ. මෙම අතිවිශාල නිෂ්පාදන මාධ්‍යයන් රාශිය ප්‍රාග්ධනය බවට පරිවර්ථනය කිරීම එයට තව දුරටත් කළ නොහැකිය. ඒවා පුරන්වී පවතී. ඒ හේතුව නිසාම අතිරේඛ කාර්මික හමුදාවද පුරන් විය යුතුය. නිෂ්පාදන මාධ්‍යයන් ද, යැපීම් මාධ්‍යයන්ද, වැඩට සධානම් කම්කරුවන් ද, නිෂ්පාදනයේ හා පොදු වස්තුවේ සියළුම අංගෝපාංගන්ද බහුලව ඇත. නමුත් "බාහුල්‍යත්වය විපත හා අගහිගකම ගෙන එන උල්පතක් වේ." (ෆූරියේ) එසේවීමට හේතුව නිෂ්පාදන මාධ්‍යන් සහ යැපීම් මාධ්‍යයන් ප්‍රාග්ධනය බවට පරිවර්ථනය කිරීම වලක්වන දෙය එයම වීමයි. ධනපති සමාජයේ නිෂ්පාදන මාධ්‍යයන්ට ක්‍රියාත්මක විය හැක්කේ ප්‍රමයෙන් ප්‍රාග්ධනය බවට එනම් මිනිස් ශ්‍රම ශක්තිය සූරා කෑමේ මාධ්‍යන් වන සේ පරිවර්තනයකට භාජනය වීමෙන් පසුව පමණකි. නිෂ්පාදන හා යැපීම් මාධ්‍යයන් මෙසේ ප්‍රාග්ධනය බවට පරිවර්ථනය වීමේ අවශ්‍යතාවය ඒවා කම්කරුවනුත් අත්‍ර අවතාරයක් මෙන් නැගී සිටී. නිෂ්පාදනයේ ද්‍රව්‍යමය සහ පුද්ගලමය ලීවරයන් එක්තැන් වීම වලක්වන්නේ එයමය. නිෂ්පාදන මාධ්‍යයන් ක්‍රියාත්මක වීමත් කම්කරුවන්ගේ වැඩ කිරීම හා ජීවත් වීමත් තහනම් කරන්නේත්එයමය. එනිසා එක් අතකින් මෙම නිෂ්පාදනීය බලවේගයන් තවදුරටත් මෙහෙයවා ගැනීමට අසමත් වීම සම්බන්ධයෙන් ධනපති නිෂ්පාදන ක්‍රමය වරදකරුවී තිබේ. අනික් අතට මෙම නිෂ්පාදනීය බලවේගයන්ම පවත්නා ප්‍රතිරෝධතාවය ඉවත් කිරීමට ප්‍රාග්ධනය වීමේ එහි ඇති ගුණය ඉවත් කිරීමට සහ සමාජමය නිෂ්පාදනීය බලවේගයන් සේ ඒවායේ ස්වභාවය ප්‍රායෝගික

ලෙස පිළිගැන්වීමට වඩ වඩාත් බලවත්ව ඉදිරියට එයි.මෙම නිෂ්පදනීය බලවේගයන් ඒවායේ ප්‍රාග්ධන ස්වබාවයේ ගුණයට විරුද්ධව වූ ඒවායේ මෙම කැරැල්ල බලවත් වෙත්ම තමන්ගේ සමාජමය ස්වභාවය පිළිගන්නා ලෙස ඒවා දෙන නියෝග වඩවඩාත් බලවත් වෙත්ම ධනපති තත්වය යටත් හැකිතාක් දුරට ඒවා පංතියට බල කිරීමක් එයින් සිදුවේ. ආර්ථික බිද වැටීමේදී මහා ධනපති ආයතන ඇද හැලීමට නොදෙවෙනි ලෙසට ආර්ථික අධිවේග කාලපරිච්ඡේදය සමග එන එහි අසීමිත ණයවර උද්ධමනය ද විවිධ වර්ගයේ බද්ධ ව්‍යාපාර වස්ත්‍ර සමාගම් තුල අපට දක්නට ලැබෙන ලෙසට නිෂ්පාදන මාධ්‍ය ස්කන්ධ මහාරාශියක් සමාජමය වීමට පෙළඹවන්නකි. මෙම නිෂ්පාදන හා බෙදා හැරීමේ මාධ්‍යන් බොහෝමයක් අතිශයින් දැවැන්තය. දුම්රිය ව්‍යාපාරයෙහි නියැලුනු වෙනත් කිසිම ධනපති සූරා කෑමකට ඉඩ නොලැබෙන තරමට ඒවා දැවැන්තය. පරිණාමය තවදුර ඉදිරියට ගිය අවධියකදී මෙම අකෘතියද ප්‍රමාණවත් නොවන්නේය. නිෂ්පාදනය හැසිරවීම සඳහා විශේෂ රටක විශේෂ කර්මාන්ත අංශයක නිෂ්පාදකයන් "සංගත" නැමති ව්‍යාපාර සංගම් තුළට මහා පරිමාණයෙන් එක්සත් වෙති. නිෂ්පාදනය කරන මුළු ප්‍රමාණය ඔවුහු තීරණය කරති. එම ප්‍රමාණය තමන් අතරේ කොටස් වශයෙන් බෙදාගෙන එමගින් කළින් තීරණය කරගත් අලෙවි මිලක් ක්‍රියාත්මක කරති. නමුත් ව්‍යාපාරික කටයුතු අසාර්ථක වූ වහාම මෙම වර්ගයේ සංගත ව්‍යාපාරය සාමාන්‍ය වශයෙන් බිඳී යාමට තුඩුදෙයි. මේ හේතුව නිසාම ඊටත් වඩා විශාල සංගමික සංකේන්ද්‍රණයක් ඇති කිරීමට එයින් බල කිරීමක් ඇති වේ. එම විශේෂ කර්මාන්තය සම්පූර්ණයෙන්ම එකම බද්ධ ව්‍යාපාර වස්තු වෙළද සමාගමක් බවට පත්වෙයි. අභ්‍යන්තර තරගය මෙම වෙළද සමාගමේ අභ්‍යන්තර ඒකාධිකාරයට ඉඩදී ඉවත් වෙයි. 1890 දී ඉංග්‍රීසි රාසාර නිෂ්පාදනයේ මෙය සිදු විය. විශාල කර්මාන්ත ශාලා 48 ක් එකම සමාගමක් අතෙහි ඒකාබද්ධ කිරීමෙන් පසුව දැන් එහි කටයුතු එකම සැලැස්මක් අනුව සහ පවුම් 600,000 ක ප්‍රාග්ධනයක් ඇතිව කරගෙන යනු ලැබේ.

සංගත ව්‍යාපාර තුළ තරග කිරීමේ නිදහස එහි විරුද්ධාර්ථයට එනම් ඒකාධිකාරයට වෙනස් වේ. එමෙන්ම ධනපති ක්‍රමයේ සමාජයේ කිසිම නිශ්චිත සැලැස්මකින් තොරව කරන නිෂ්පාදනය ආක්‍රමණයේ යෙදී සිටින සමාජවාදී සමාජයේ නිශ්චිත සැලැස්මක් අනුව නිෂ්පාදනය කිරීම හමුවේ යටත් වේ. ඇත්තෙන්ම මෙය මෙතෙක්ම තවමත් සිදුවන්නේ ධනපතියන්ගේ යහපත සහ වාසිය සදහාය. නමුත් මෙම අවස්ථාවේදී සූරාකෑම ඉතාමත් පැහැදිළිව පෙණෙන නිසා එය බිද වැටෙනු ඇත. සංගත ව්‍යාපාර මගින් නිෂ්පාදනය පවත්වාගෙන යෑම ලාභාංශ ජාවරම් කාරයන්ගේ කුඩා කණ්ඩායමක් විසින් බියසැක නොමැති ලෙස ප්‍රජාව සූරාකනු ලැබීම කිසිම ජාතියක් ඉවසා නොසිටිනු ඇත.

කෙසේ හෝ වේවා සංගත ව්‍යාපාර ඇතිව හෝ නැතිව ධනපති සමාජයේ නිළනියෝජිතයා වන රාජ්‍යයට අවසානයේ දී නිෂ්පාදන කටයුතු මෙහෙයවීම බාරදීමට සිදුවනු ඇත.* (මම "සිදුවනු ඇත" යයි කියමි. නිෂ්පාදනය හා බෙදාහැරීමේ මධ්‍යයන් රජයට පවරා ගැනීම ක්‍රියාත්මක කරන්නේ අද පවත්නා රජය වුවත්, එය ආර්ථික ඉදිරි පියවරක් හා නිෂ්පාදනය සමාජය විසින්ම පවරා ගැනීමට ප්‍රාථමික වූ තවත් පියවරක් වන්නේ එම මාධ්‍යයන් බද්ධ ව්‍යාපාර වස්තු සමාගම්වල කළමණාකරණ ආකෘතිය අභිබවා ඇත්ත වශයෙන්ම වර්ධනය වී ඇතොත් හා එනිසාම ඒවා රජයට ගැනීම ආර්ථික වශයෙන් අනිවාර්යනීය වී ඇතොත් පමණි. නමුත් මෑතක පටන් බීස් මාර්ක් විසින් රජය සන්තක කාර්මික ආයතන ඇතිකළ පසු වරින්වර නිවට බැලයන්ගේ වැනි තත්වයට ඇද වැටෙන ව්‍යාජ වර්ගයකසමාජවාදයක් මතුවී තිබේ. එය වැඩි කළබලයක් නොමැතිව සියළුම ආකාරයේ බිස්මාර්ක් වර්ගයේ පවා රාජ්‍ය හිමිකම සමාජවාදී යැයි ප්‍රකාශ කරයි. ඇත්ත වශයෙන්ම දුම්කල කර්මාන්තය රජයට ගැනීම සමාජවාදී නම් එවිට නැපෝලියන් සහ මැටර්නික් සමාජවාදයේ නිර්මාතෘවරුන් අතරට එකතු කළ යුතුය. ඉතාමත් සාමාන්‍ය දේශපාලන හා මූල්‍ය හේතුකරණකොට ගෙන බෙල්ජියම් ආණ්ඩුව තම ප්‍රධාන දුම්රිය මාර්ග තමන්ම ඉදිකර ගත්තේනම් කිසියම් ආර්ථික බලකිරීමකින් තොරව හුදෙක්ම යුද්ධයක් ඇති වුවහොත් ඒ සඳහා සධානමින් තබා

ගැනීමටත්, දුම්රිය සේවකයන් ආණ්ඩුවට ඡන්දය දීමට රංචු වශයෙන් ගෙන ඒමටත් විශේෂයෙන්ම පාර්ලිමේන්තු පනත් වලින් නිදහස් නව ආධායම් මාර්ගයක් තමන්ටම ඇතිකර ගැනීම සඳහාත් බිස්මාක් විසින් ප්‍රධාන ප්රුසියන් දුම්රිය මාර්ග රජයට ගන්නා ලද්දේ නම් මෙය මොනම අර්ථයකින් වත් සෘජුව හෝ වක්‍ර නැතහොත් විඥ්ඥාත හෝ අවිඥ්ඥාත සමාජවාදී පියවරක් නොවීය. නෙච්සේනම් රාජකීය Seehandlung[56] සමාගම රාජකීය පිගන්භාණ්ඩ කර්මාන්තයත් යුද්ධ හමුදාවේ සන්නාලි සේවය වුවත්, එපමණක් නොව 111 වැනි පෙඩ්රික් විලියම් රජ කාලයේ කපටි බල්ලෙක් යෝජනා කළ පරිදි ගණිකා මඩම් රජයට ගතහොත් එය පවා වුවත් සමාජවාදී ආයතන වනු ඇත.) රාජ්‍ය දේපල බවට හැරීමේ මෙම අවශ්‍යතාවය ප්‍රථමයෙන්ම දැනෙන්නේ පණිවුඩ හුවමාරුව සඳහා අදාළවන තැපැල් කාර්යාල විදුලි පණිවුඩ සේවය හා දුම්රිය සේවය යනාදියෙහිය. නවීන නිෂ්පාදනීය බලවේගයන් කළමණාකරණය තවදුරටත් ධනපති පංතියට කළ නොහැකි බව අර්බුද වලින් ප්‍රදර්ශනය වේ. නිෂ්පාදනය සහ බෙදා හැරීම සඳහා ඇති මහා ආයතනයන් බද්ධ ව්‍යාපාර වස්ත්‍ර සමාගම්, සංගත ව්‍යාපාර හා රජයේ දේපල බවට පරිවර්ථනය වීමෙන් එම කටයුතු සඳහා ධනපතියන් කොතරම් අනවශ්‍යද යන්න පෙනී යේ. ධනපතියාගේ සියළුම සමාජ කාර්යයන් දැන් වැටුප් ලබන සේවකයන් විසින් ඉටුකරනු ලැබේ. ලාභාංශ මඩියේ ලා ගැනීම කූපන් ඉරීම හා ධනපතියන් එකිනෙකා කොල්ලකා ගැනීමෙහි යෙදෙන ව්‍යාපර පොළෙහි ධූකෙලියෙහිදීම හැර ධනපතියාට ඉටු කිරීමට තවත් සමාජමය කාර්යයක් නැත්තේය. ධනපති නිෂ්පාදන ක්‍රමය පළමුව කම්කරුවන් එළියට ඇද දමයි. දැන් එය ධනපතියන් ද එළියට ඇද දමයි. එය වහාම ඔවුන් අතිරේක කාර්මික හමුදාවට එකතු නොකළත් කම්කරුවන්ට කළ පරිද්දෙන්ම ධනපතියන් ද ජනගහනයේ අතිරේක පිරිස් අතරට ඇද දමයි. නමුත් නිෂ්පාදනීය බලවේගයන් බද්ධ ව්‍යාපාර වස්තු සමාගම් හා සංගත ව්‍යාපාර බවට නැතහොත් රාජයේ හිමිකමට පරිවර්තනය වීම නිසා ඒවායේ ධනපති ස්වභාවය මැකී නොයේ. බද්ධ ව්‍යාපාර වස්තු සමාගම් සහ සංගත ව්‍යාපාර තුළ මෙය මනාව පැහැදිළි සේ පෙනේ. තවද නවීන රාජ්‍ය යනු කම්කරුවන්ගේ සහ එමෙන්ම තනි පුද්ගල ධනපතියන්ගේ ද ඇඟිලි ගැසීම් වලට විරුද්ධව ධනපති නිෂ්පාදන ක්‍රමයේ බාහිර තත්වයන්ට සහයෝගය දීම පිණිස ධනපති සමාජය පැදල ගන්නා සංවිධාන ආකෘතියක් පමණක් වේ. නවීන රාජ්‍යය, එහි ආකෘතිය කුමක්වුවත්, එය ප්‍රධාන වශයෙන්ම ධනපති යන්ත්‍රයකි. ධනපතියන්ගේ රාජ්‍යයේ එය සමස්ත ජාතික ප්‍රාග්ධනයේ ජීවමාන සංඛේතයයි. එය නිශ්පාදනීය බලවේගයන් වැඩි වැඩියෙන් අත්පත් කරගන්නා තරමට එය වඩ වඩාත් ජාතික ධනපති තත්වයට පත් වෙයි. එය සූරාකන පුරවැසියන් සංඛ්‍යාව වැඩි කරයි, කම්කරුවෝ වේතන කම්කරුවන් වශයෙන් නිර්ධන පංතිකයන්ම වශයෙන් පසුවෙති. එය එමගින් එක්තරා දුරකට උච්ඡස්ථානයකට පත් වෙයි. නමුත් උච්ඡස්ථානයට පැමිණි තැන එය ඇද වැටෙන්නේය. නිෂ්පාදන මාධ්‍යයන් රජයට හිමි වීමෙන් ඝට්ටනය විසදෙන්නේ නැත. නමුත් එය විසදීමේ මූලිකාංගයන් ඇති කරන ප්‍රායෝගික කොන්දේසි එය තුල ඇතිවී තිබේ.

මෙම විසදීම සමන්විත වනු හැක්කේ නවීන නිෂ්පාදනීය බලවේගයන්ගේ සමාජමය ස්වභාවය පිළිගැනීමෙන්ද එනිසාම සමාජමය කරන ලද නිෂ්පාදනීය මාධ්‍යයන් හා නිෂ්පාදනය හිමිකර ගැනීම සහ හුවමාරුව පිළිබඳ ක්‍රම අතර සංගතියක් ඇති කිරීමෙන් ද පමණකි. එමෙන්ම මෙය සිදුවිය හැක්කේ ද මුළු සමාජයම සමස්තයක් වශයෙන් කරන පාලනයක් හැර වෙනත් හැම පාලනයක්ම ඉක්මවා වර්ධනයවී තිබෙන නිෂ්පාදනීය බලවේගයන් විවෘත්ත ලෙසම හා එකඑල්ලේම සමාජය විසින් අත්පත් කර ගනු ලැබීමෙන් පමණකි. අද නිෂ්පාදනීය මාධ්‍යයන්ගේ හා නිෂ්පාදිතයන්ගේ සමාජමය ස්වභාවය නිෂ්පාදකයන්ට විරුද්ධව ප්‍රතික්‍රියාකාරී වේ. වාරික වශයෙන් සියළු නිෂ්පාදන හා හුවමාරු කටයුතු කඩාකප්පල් කර දමයි. අන්ධ ලෙස බලහත්කාර ලෙස හා විනාශකාරී ලෙස කටයතු කරන නීතියක් වශයෙන් පමණක් ක්‍රියාත්මක වෙයි. නමුත් නිෂ්පාදනීය බලවේගයන් සමාජය විසින් පවරා ගැනීමත් සමග නිෂ්පාදන මාධ්‍යයන්ගේ සහ නිෂ්පාදිත වල සමාජමය ස්වභාවය නිෂ්පාදකයන් විසින් සම්පූර්ණ වැටහීමෙන් යුතුව උපයෝජනය කර ගනු ලැබෙන

නිසා, එය අවුල්කාරී ස වාරික බිඳ වැටීම් ඇති කරන බලවේගයක් වශයෙන් පෙනී සිටිනු වෙනුවට නිෂ්පාදනයේම ඉතාමත් බලවත් ලිවරය බවට පත්වන්නේය.

ක්‍රියාශීලිසමාජ බලවේගයන්ද හරියටම ස්වාභාවික බලවේගයන් මෙන්ම ක්‍රියාත්මක වෙති. අප ඒවා ගැන වැටහීමක් ඇති කර නොගන්නා තාක් කල් ඒවා ගැන සැලකිල්ලක් නොදක්වන තාක් කල් ඒවා අන්ධ බලහත්කාරී ලෙස සහ විනාශකාරී ලෙස ක්‍රියාත්මක වෙති. නමුත් අපට ඒවා ගැන වැටහීමක් ඇති කල අප ඒවායේ ක්‍රියාකාරීත්වය දිශානිතය හා ප්‍රතිඵල ගැන අවබෝධයක් ඇති කරගත් කල ඒවා අප නොතකා අපට විරුද්ධව ක්‍රියාත්මක වෙති. ඒතාක් ්වා යක්ෂ ස්වාමිවරුන්ගේ තත්වයෙන් එක්ව ක්‍රියා කරන නිෂ්පාදකයන්ගේ අතෙහි වන සුවච සේවකයින් බවට පරිවර්තනය කළ හැකි වේ. එහි ඇති වෙනස කුණාටුවෙහිදී වදින හෙණ සැර යෙහි ඇති විදුලි බලයේ විනාශකාරීත්වයක් විදුලි පණිවුඩ ස වෝල්ටීය චාපයෙහි ඇති පාලනයට යටත් විදුලි බලයත් අතර වෙනස බඳුය,. එම වෙනස ලැව්ගින්නක් සහ මිනිසාගේ සේවයේ යෙදුනු ගින්දර අතර වෙනස බඳුය. අද පවත්නා නිෂ්පනීය බලවේගයනගේ යථා ස්භාවය මෙසේ අවසානයේදී පිලිගැනීමත් හා සමග, ප්‍රජාවේ හා එක් එක් පුද්ගලයාගේ අවශ්‍යතාවයන්ට අනුකූල වූ නිශ්චිත සැලැස්මක් අනුව නිෂ්පාදනය සමාජමය වශයෙන් හසුරනු ලැබීමට ඉඩදෙමින් නිෂ්පාදනය අරාජිකත්වය ඉවත්වෙයි. එවිට, නිෂ්පාදනය විසින් ප්‍රථමයෙන් නිෂ්පාදකයාද, ඊළගට හිමිකරගන්නාද වහලට ගනු ලබන ධනපති ක්‍රමය වෙනුවට, නවීන නිෂ්පාදන මාධ්‍යයන්ගේ ස්භාවය පදනම් කොටගත් නිෂ්පාදන හිමිකම් ක්‍රමයක් ආදේශ වේ. එක් අතකින් නිෂ්පාදනය පවත්වා ගැනීම සහ ව්‍යාප්ත කිරීමේ මාධ්‍ය වශයෙන් සෘජු සමාමය හිමිකර ගැනීමද, අනිත් අතට යැපීම් සහ බුක්ති විදීම් සදහා මාධ්‍ය වශයෙන් තනි පුද්ගල හිමිකර ගැනීමද ආදේශ වේ.

ධනපති නිෂ්පාදන ක්‍රමය ජනගහනයෙන් අති බහුතරය වඩ වඩාත්ම නිර්ධන තත්වයට පරිවර්ථනය කරන කල්හි එය කරන්නේ, ආත්ම විනාශයේ දඩුවම් පිලිබඳව බල කිරීම යටතේ මෙම විප්ලවය සිදු කිරීමට බැදී සිටින ඒ බලවේග නිර්මාණය කිරීමය. දැනටමත් සමාජමය කර තිබෙන අති මහත් නිෂ්පාදනීය මාධ්‍යන් රාජ්‍ය දේපල බවට පරිවර්ථනය කිරීමට වැඩි වැඩියෙන් බලකරන එම බලවේගය ඒසේ කිරීමේදී එම විප්ලවය ඉටුකිරීමේ තම කාර්ය සොයා ගනී. <u>නිර්ධන පංතිය දේශපාලන බලය අල්ලාගෙන නිෂ්පාදන මාධ්‍යයන් රාජ්‍ය දේපල බවට හරවයි</u>. නමුත් එසේ කිරීමේදී එය නිර්ධන පංතිය වශයෙන් තමන්ම අහෝසි කර ගනී. සියළුම පංති වෙනස්කම් සහ පංති සතුරුතාවය අහෝසි කරයි. රජයක් හැටියට රජය ද අහෝසි කරයි. මේ දක්වා පංති සතුරුතාවයන් මත පදනම්ව පිහිටි සමාජයට රාජ්‍ය අවශ්‍ය විය. එහි අර්ථය නම් අදාළ වන අවස්ථාවේදී සූරාකෑමේ යෙදී සිටින විශේෂ පංතියේ සංවිධානයක්, නැතහොත් පවත්නා නිෂ්පාදන තත්වයන්ට බැහැරින් කෙරෙන ඇගිලි ගැසීම් වැලැක්වීම හා අදාළ නිෂ්පාදන ක්‍රමයට (වහල් ක්‍රමයට, ප්‍රවීන දාස ක්‍රමයට, වේතන කම්කරු ක්‍රමයට) ගැලපෙන පීඩාකාරී තත්වයන් යටතේ සූරාකනු ලබන පංතිය රදවා ගැනීම පිණිස සංවිධානයක් අවශ්‍ය වූ බවයි. රාජ්‍යය සමස්තයක් වශයෙන් මුළු සමාජයේම නියෝජිතයා විය. එය සමස්ත සමාජමය දෘෂ්‍යමාණ සංඛේතයක් ලෙසට ඒකස්ත කිරීමකි. නමුත් එය එසේ වූයේ එය අදාළ අවස්ථාවේ මුළු සමාජයම නියෝජනය කළ එම පංතියේ රාජ්‍යය වූ තාක්කල් පමණකි. පෞරානික කාලයේ වහල් හිමි පුරවැසියන්ගේ රාජ්‍යයද මධ්‍යකාලීන යුගයේ රදළ ප්‍රධානීන්ගේ රජයද, අපගේම කාලයේ ධනපති පංතියේ රජයද එබදු රාජ්‍යයන් වෙති. අන්තිමේදී එය සමස්ත සමාජයේම සැබෑ නියෝජිතයා බවට පත්වූ කළ එය පැවතීමේ අවශ්‍යතාවය ද අහෝසි වන්නේය. යටත් කර තබා ගතයුතු සමාජ පංති නැතිව ගිය විට පංති පාලනයක් අපගේ නිෂ්පාදනයේ වර්ථමාන අරාජිකත්වය පදනම් කරගෙන පැවැත්ම සදහා තනි පද්ගල අරගලය සමගම එයින් පැණනගින සංඝට්ඨනයන් හා සීමාන්තික වාරයන් ඉවත් කළ විට මර්ධනය කිරීමට අවශ්‍ය වන යමක් ඉතිරි නොවන හෙයින් විශේෂ මර්ධනකාරී බලයක් එනම් රාජ්‍ය තිබීම තවදුරටත් අවශ්‍ය නොවේ. රාජ්‍ය සමාජයේ නියෝජිතයා වශයෙන් සංයුක්ත වීමට වන ප්‍රථම කාර්යය

වන සමාජයේ නාමයෙන් නිෂ්පාදන මාධ්‍යයන් අත්පත් කර ගැනීම වනාහී එය රජය හැටියට ස්වාධීන වශයෙන් කරන අවසාන කටයුත්තද වන්නේය සමාජ සම්බන්ධකම් පිළිබද ක්ෂේත්‍රයන් එකක් පාසා රාජ්‍යයේ ඇඟිලි ගැසීම අනවශ්‍ය දෙයක් බවට පත්වීමෙන් එය තමන්ම හැකිලී යන්නේය. පුද්ගලයන් ආණ්ඩු කිරීම වෙනුවට ද්‍රව්‍යයන් පාලනය කිරීමක්ද, නිෂ්පාදනීය ක්‍රියාදාමයන් හැසිරවීමක් ද ආදේශ වන්නේය. රාජ්‍ය අහෝසි කරනු නොලැබේ. එය හැකිලී යන්නේය. "නිදහස් ජනතා රාජ්‍යයක්"[57] යන පාඨය සමහරක් විට උද්ඝෝෂකයින් විසින් භාවිතා කරනු ලැබීමේ සාධාරණත්වය ද එය සම්පූර්ණයෙම විද්‍යාත්මකව බලන කළ එහි ඇති අඩුපාඩු සහිත භාවයද හිටිවනම රාජ්‍ය අහෝසි කරන ලෙසට ඊනියා අරාජික වාදීන් කරන ඉල්ලීම් ද කොතරම් දුරට අගය කළ හැකි ද යන්න මෙයින් පැහැදිළි වේ. ධනපති නිෂ්පාදන ක්‍රමය අයිතිහාසික වශයෙන් පහළ වූ තැන් පටන් එක් එක් පුද්ගලයන් හා නිකායයන් ද විසින් ද අනාගත පරමාදර්ශයක් වශයෙන් සියළුම නිෂ්පාදන මාධ්‍යන් සමාජ සන්තක කර ගැනීම ගැන අඩු වැඩි වශයෙන් අපහැදිලි ලෙස සිහින මවා තිබේ. නමුත් එය ඉටුවිය හැකියාවක් බවට පත් වන්නේ එය ඓතිහාසික අවශ්‍යතාවයක් බවට පත්වන්නේ එය ඉටු වීම සදහා අවශ්‍ය තත්වයන් පහළ වී තිබෙතොත් පමණකි. අන් සෑම සමාජ ඉදිරි ගමණක් මෙන්ම එයද ක්‍රියාත්මක කළ හැක්කක් බවට පත් වන්නේ පංති තිබීම යනු යුක්තිය, සමාණාත්මතාවය ආදියට ප්‍රතිවිරෝධී බව මිනිසුන් වටහා ගැනීම නිසා හෝ පංති අහෝසි කිරීමට ඇති සෑජු කැමැත්ත නිසා හෝ යම් යම් ආර්ථික කොන්දේසි තිබීම හේතු කොටගෙනය. සමාජය සූරාකන පංතියකට හා සූරාකනු ලබන පංතියකට පාලක පංතියකට හා පීඩිත පංතියකට බෙදී වෙන්වීම ඉහත කාලයේ නිෂ්පාදනයෙහි ඇති වූ අඩු සහ සීමිත සංවර්ධයෙහි අවශ්‍ය ප්‍රතිපලයක් විය. සමාජයේ මුළු ශ්‍රමයෙන් ලබා ගත හැකි නිෂ්පාදනය සියළු දෙනාගේ පැවැත්ම සදහා අවශ්‍ය ප්‍රමාණය ඉක්වන්නේ ඉතාමත් සුළු වශයෙන් පමණක් වන තාක්ම එනිසාම, සමාජයේ සාමාජිකයන් අති බහුතරයෙහි මුළු කාලයම හෝ ඊට ඉතා ආසන්න කාලයක් ශ්‍රම කටයුතු යෙදෙන තාක්ම, ඒ තාක්කල්ම මෙම සමාජය අවශ්‍යයෙන්ම පංති වලට බෙදී පවතී. තනිකරම ශ්‍රම දාසයන් මත අතිවිශාල බහුතරය සමග එක පෙළට සිටින්නාවූ සෘජු නිෂ්පාදනීය ශ්‍රම කටයුතු වලින් නිදහස්වූ සහ සමාජයේ පොදු කටයුතු ගැන රැකුම් බැලම් කරන, කම්කරු පාලනය, රාජ්‍ය කටයුතු, නීති කටයුතු, විද්‍යා කටයුතු, කලා කටයතු ආදිය මෙහෙය වන්නා වූ පංතියක් පැන නගින්නේය. එනිසා මෙම පංති වලට බෙදී යාමේ අඩිතාලම වී ඇත්තේ ශ්‍රම විභජනය පිළිබද නීතියයි. එනමුත්, මෙම පංති වලට බෙදීම හිංසනය හා මංකොල්ලයද, කපටිකම හා රැවටිල්ලද මගින් ක්‍රියාත්මක කරනු ලැබීම එයින් වලකින්නේ නැත. පාලක පංතිය අධිපති බලතල ලබාගත් වහාම කම්කරු පංතියට හානිදායක ආකාරයෙන් එහි බලය තහවුරු කර ගැනීමත්, එහි සමාජ නායකත්වය උත්සන්න ලෙස ජනතාව සූරාකෑමත් බවට හරවා ගැනීමත් එයින් වැලකෙන්නේ නැත. මෙයින් පෙනෙන ලෙසට, පංති වලට බෙදීමට යම් සාධාරණ ඓතිහාසික හේතුවක් තිබෙනම් එය එසේ පවතින්නේ නිශ්චිත කාල පරිච්ඡේදයක් තුළ හා නිශ්චිත කාල පරිච්ඡේදයක් තුල හා නිශ්චිත සමාජ තත්වයන් යටතේ පමණෙකි. නවීන නිශ්පාදන බලවේගයන්ගේ පූර්ණ සංවර්ධනයෙන් එය අතුගෑවී යනු ඇත. එසේම, සමාජය පංති අහෝසි කිරීම සදහා, ඇත්ත වශයෙන්ම මෙම හෝ අනික් පාලක පංතියේ පැවැත්ම පමණක් නොව මොනම පාලක පංති්යක පැවැත්ම, එනම්, පංති ප්‍රභේදයේම පැවැත්ම යල් පීනු පරණ පරණ ඇබ්බැහි කමක් බවට පත් කළ ඓතිහාසික පරිනාම මට්ටමක් තිබීම අවශ්‍ය වේ. එසේම ඒ සදහා නිෂ්පාදන මාධයන් හා නිෂ්පාදිතයන් හිමිකර ගැනීමත්, ඒ සමගම දේශපාලන ආධිපත්තයත්, සංස්කෘතියේ ප්‍රධානත්වයත්, බුද්ධිමය නායකත්වයත්, සමාජයේ එක් විශේෂ පංතියක් විසින් අයත්කරගෙන තිබීම අනවිශ්‍ය වන තරම් ද එපමනක් නොව, එසේ වීම ආර්ථික දේශපාලන සහ බුද්ධිමය වහයෙන් ද සංවර්ධනයට බාදකයක් වන තරම් ද මට්ටමකට නිෂ්පාදනයේ සංවර්ධනය ඉදිරියට ගෙන ගොස් තිබීම අවශ්‍ය වේ. මෙම අවස්ථාව දැන් උදාවී තිබේ. ධනපති පංතියේ දේශපාලන සහ බුද්ධිමය නායකත්වය දැන් තවදුරටත් ඔවුන්ටම පමණක් සීමාව රහසක් නොවෙ. සෑම දහ අවුරද්ධක් පාසාම ඔවුන්ගේ ආර්ථික බංකොලොත් බාවය නිති පතාම යලි යලිත් මතුවේ. සෑම අර්බුදයකදීම සමාජය ස්වකීය නීෂ්පාදනීය බලවේගයන්ගේ බරින්

මිරිකී හුස්මගත නොහැකිව අසරණව පරිභෝජකයන් නොමැතිකම නිසා නිෂ්පාදකයිනට පාරිභෝජනය සඳහා කිසිවක් නොමැති වීමේ විකාර ප්‍රවිරෝධයකට මුහුණ ලා සිටී. නිෂ්පාදන මාධ්‍යයන්ගේ ප්‍රසාරනීය බලවේගයන් එම මාධ්‍යන් හිරකර තබන ධනපති නිෂ්පාදන ක්‍රමයේ බන්ධනයන් පුපුරුවා දමයි. නිෂ්පාදනීය බලවේගයන් අඛන්ඩ හා නිරන්තරව වැඩිවන වේගයකින් සංවර්ධනය වීමත් ඒ හා සමගම නිෂ්පාදයේම සීමානොකළ තත්වයේ වැඩි වීමකුත් සඳහා ඉටුවිය යුතුම පූර්ව කොන්දේසිය මෙම බන්ධනයන්ගෙන් නිදහස් වීමය. දැනට නිෂ්පාදනය අවහිර කර තබන කෘතිම සීමාවන් පමණක් නොව, දැනට නිෂ්පාදනය හා සමග අනිවාරණීය ලෙස අනුයාත වන හා අර්බුදයේදී උච්ඡස්ථානයට පත්වන නිෂ්පාදනීය බලවේග නියත ලෙසම නාස්ති කිරීම සහ විනාශ කර දැමීමද නිෂ්පාදන මාධ්‍යන් සමාජමය වශයෙන් සන්තක කරගැනීමෙන් කෙළවර වන්නේය. තවද අද පාලක පංතිවල හා ඒවායේ දේශපාලන නියෝජිතයන්ගේ අර්ථ විරහිත නස්තිකාර වියදම් නවත්වා දැමීමෙන්ද එය පොදු ජනකායගේ ප්‍රයෝජනය උදෙසා නිෂ්පාදන මාධ්‍යයන් හා නිෂ්පාදිතයන් මහා රැසක් මුදා හරියි. සමාජය කරන ලද නිස්පාදනයේ මාර්ගයෙන් සමාජයේ සෑම සාමාජිකයෙකු සඳහාම, ද්‍රව්‍යමය වශයෙන් ප්‍රමාණවත් වන හා දිනෙන් දිනම වඩාත් පරිපූර්ණ වන පැවැත්මක් පමණක් නොව, ඔවුන්ගේ කායික හා මානසික සමත්කම් සියල්ලෙහිම නිදහස් සංවර්ධනය සහ ක්‍රියාකාරීත්වයද සහතික කන්නාවූ පැවැත්මක් ලබා ගැනීමේ හැකියාව දැන් ප්‍රථම වතාවට මෙහි ඇත* (කෙසේ හෝ එය මෙහි ඇත. ධනපති බලපෑම යටතේ වුව, නවීන නිස්පාදන මාධ්‍යන්ගේ දැවැන්ත ප්‍රසාරණ බලවේගය ගැන දළ අවබෝධයක් දීමට සංඛ්‍යා කීපයක් ප්‍රයෝජනවත් වනු ඇත. ජිෆන් මහතා කියන අන්දමට මහා බ්‍රිතාන්‍යයේ සහ අයර්ලන්තයේ සම්පූර්ණ ධනය පූර්ණ සංඛ්‍යා අනුව අදාළ වර්ශ වලදී මෙසේ විය.

| | | | |
|---|---|---|---|
| 1814 | - | පවුම් | 220,00,00,000 |
| 1865 | - | පවුම් | 610,00,00,000 |
| 1875 | - | පවුම් | 850,00,00,000 |

අර්බුදයේදී නිෂ්පාදන මාධ්‍යන් හා නිෂ්පාදිතයන් නාස්ති කිරීම පිළිබඳ නිදර්ශනයක් වශයෙන් 1873, 1878 අර්බදයේදී ජර්මන් යකඩ කර්මාන්තයේ පමණක් සම්පූර්ණ අලාභය (1878 පෙබරවාරි 21 බර්ලින්) දෙවැනි ජර්මන් කාර්මික සම්මේලනයට දන්වන ලද පරිදි පවුම් 2,27,50,000 ක් විය.)

සමාජය විසින් නිෂ්පාදන මාධ්‍යන් අල්ලා ගනු ලැබීමත් හා සමගම වෙළඳ භාණ්ඩ නිෂ්පාදනය කෙළවර වේ. ඒ හා සමගම එක්වරම නිෂ්පාදකයා කෙරෙහි පාන ලද නිෂ්පාදිතයේ ආධිපත්‍යයද කෙළවර වේ. සමාජමය නිෂ්පාදනයේ ආරාජිකත්වය වෙනුවට ක්‍රමානුකූල නිශ්චිත සංවිධානය ආදේශ කෙරේ. තනි පුද්ගල පැවැත්ම සඳහා කරන අරගලය අහෝසි වන්නේය. එවිට, ප්‍රථම වතාවට, මිනිසා, එක් අර්ථයකින්, අන්තිම වශයෙන් සත්ව රාජ්‍යයෙන් වෙන් කෙරෙන අතර ඔහු හුදු තිරිසන් තත්වයේ පැවැත්මෙන් සැබෑ මිනිස් තත්වයේ පැවැත්මට එළඹෙන්නේය. මිනිසා අවට ගැවසීගත් හා මේ දක්වා මිනිසා පාලනය කළ, ජීවන තත්වයන් පිළිබඳ මුළු ක්ෂේත්‍රයම දැන් මිනිසාගේ ආධිපත්‍යය හා පාලනයට එන්නේය. ඔහු ප්‍රථම වතාවට ස්වභාව ධර්මයේ සැබෑ විඥ්ඥාත ස්වාමියා වන්නේය. මෙතෙක් ස්වභාව ධර්මයේ නීති වශයෙන් මිනිසාට අන්‍යතර හා අධිපතිකම් පාන ආකාරයෙන් ඔහු හා මුහුණට මුහුණ ලා සිටි, ඔහුගේම සමාජ ක්‍රියාකාරීත්වයේ නීති එවිට සම්පූර්ණ අවබෝධයකින් උපයෝජනය කරගනු ලැබෙනු ඇත. ඔහු ඒවා ගැන සම්පූර්ණ දැණුමක් ලබාගනු ඇත. මේ දක්වා ස්වභාව ධර්මය හා ඉතිහාසය විසින් මිනිසා මත පටවන ලද අවශ්‍යතාවයක් වශයෙන් ඔහු ඉිදිරියේ නැගී සිටින ඔහුගේම සමාජ සංවිධානය දැන් ඔහුගේ නිදහස් කි්‍රයාකාරීත්වයේ ප්‍රතිපලයක් බවට පත් වේ. මෙතෙක් ඉතිහාසය පාළනය කල බාහිර වාස්තවික බලවේගයන් දැන් මිනිසාගේම පාලනය යටතේම ක්‍රියාත්මක වේ. ඔහු විසින් ක්‍රියාත්මක කරන ලද සමාජ සාධකයන් ප්‍රධාන වශයෙන් හා නිරතුරුවම වැඩෙන සාර්ථකත්වයෙන් යුතුව ඔහු බලාපොරොත්තුවන ප්‍රතිපල ගෙන එනු ඇත්තේ එතැන් සිට

පමණකි. එය වනාහී අවශ්‍යතාවයේ රාජධානියේ සිට නිදහසේ රාජධානිය දක්වා මිනිසාගේ නැගීමයි.

ඓතිහාසීය පරිනාමය පිළිබඳ වූ අපගේ දළ සටහන කෙටියෙන් සම්පිණ්ඩනය කරමු.

**I මධ්‍යකාලීන සමාජය**- කුඩා පරිමාණ තනි පුද්ගල නිෂ්පාදනය නිෂ්පාදන මාධ්‍යන් තනි පුද්ගල උපයෝජන සඳහා සකස් කර ඇත. එනිසා ක්‍රියාකාරීත්වය පෞරාණික, ආධායම් අඩු, සුළු හා අගුටුම්ටි තත්වයේ පැවතුනි. නිෂ්පාදනය කෙරුනේ එක්කෝ නිෂ්පාදකයාගේම නැතහොත් ඔහුගේ රදළ ස්වාමියාගේ අප්‍රමාද පරිභෝජනය සඳහාය. මෙම පාරිභෝජනයට වැඩි නිෂ්පාදනයක් වුවහොත් පමණක්, එම අතිරික්තය අලෙවිය සඳහා ඉදිරිපත් කරනු ලැබීමෙන් එය හුවමාරුවට ප්‍රවිශ්ට වෙයි. එනිසා වෙළඳ භාණ්ඩ නිෂ්පාදනය ළදරු අවස්ථාවේ පැවතුනි. නමුත් ඒ වන විටම, පොදු වශයෙන් සමාජය නිෂ්පාදනයෙහි අරාජික භාවය එය තුළම කළල අවස්තා ස්වරූපයෙන් පැවතුනි.

**II ධනපති විප්ලවය** - ප්‍රථමයෙන් සරළ සහයෝගීතාවය හා භාණ්ඩ තැනීමේ කර්මාන්තය මගින් කර්මාන්තයේ පරිවර්ථනයක් මේ දක්වා විසිරී තිබුණු නිෂ්පාදන මාර්ග අතිවිශාල කර්මාන්ත ශාලා තුළට සංකේද්‍රණය වීම එහි ප්‍රථිපලයක් වශයෙන් ඒවා තනි පුද්ගල නිෂ්පාදන මාර්ග වල සිට සමාජමය නිෂ්පාදන මාර්ග බවට පරිවර්තනය වීම - මෙම පරිවර්ථනය, සමස්ත හුවමාරු ක්‍රමය කෙරෙහි වෙනසක් ඇති නොකරයි. පැරණි හිමිකම් ක්‍රම දිගටම බලපවත්වයි. ධනපතියා එළිදකී: නිෂ්පාදන මාර්ගයන්ගේ හිමිකරුවා වශයෙන් පෙනී සිටින ඔහු, නිෂ්පාදිතයන් ද හිමිකරගෙන ඒවා වෙළඳ භාණ්ඩ වලට හරවයි. නිෂ්පාදනය සමාජ කටයුත්තක් බවට පත්වී තිබේ. හුවමාරුව හා හිමිකර ගැනීම තනි පුද්ගල ක්‍රියාවන්, එනම් තනි පුද්ගලයන්ගේ ක්‍රියාවන් බවට පත්වී තිබේ. ධනපතියා සමාජමය නිෂ්පාදිතය හිමිකර ගනී. අපගේ වර්තමාන සමාජයේ ජලන ක්ෂේත්‍රය වූ සියළුම ප්‍රතිවිරෝධතාවයන් ජනිත කරන සහ නවීන කර්මාන්තය එළිදක්වන මූලික ප්‍රතිවිරෝධතාවය හට ගනී.

අ) නිෂ්පාදකයා නිෂ්පාදන මාධ්‍යන්ගෙන් වෙන් කිරීම. කම්කරුවාට ජීවිත කාලයටම වේතන ශ්‍රමයෙ දඬුවම නියම වේ. නිර්ධන පංතිය හා ධනපති පංතිය අතර සතුරුතාවය

ආ) වෙළඳ භාණ්ඩ නිෂ්පාදනය පාලනය කරන නීති බහුලත්වය වැඩියාම සහ ඒවායේ ප්‍රභලත්වය වැඩි වීම. පාලනයෙන් තොර තරගය. තනි පැක්ටරිය තුළ සමාජමය සංවිධනය සහ සමස්තයක් වහයෙන් නිෂ්පාදනය සමාජමය රාජිකත්වය අතර ප්‍රථිවිරෝධතාවය.

ඇ) එක් අතකින්, එක් එක් තනි කර්මාන්ත කරුවාට අනිවාර්ය නීය වූ තරගය විසින් යන්ත්‍ර සූත්‍ර දියුණු කිරීම සහ ඊට අනුපූරකව ශ්‍රමිකයන් ඉවත් කිරීම නිරතුරුවම වර්ධනය වීම. අතිරේක කාර්මික හමුදාව. අනික් අතින් නිෂ්පාදනය සීමාවක් නැතිව ව්‍යාප්ත වීම. මෙය ද, තරගය යටතේ සෑම කර්මාන්ත කරුවෙක් සඳහාම අනිවාර්ය වේ. දෙපැත්තෙන්ම පෙර නොඇසූවිරූ සේ නිෂ්පාදීනය බලවේගයන් සංවර්ධනය වීම, ඉල්ලුම අභිබවා යන සැපයුම, අධි නිෂ්පාදනය, වෙළඳ පොලවල් භාණ්ඩවලින් පිරී ඉතිරියාම, සෑම දහ අවුරුද්ධකටම වරක් අර්බුදය විශම කවය: මෙහි නිෂ්පාදන මාධ්‍යයන්ගේ හා නිෂ්පාදිතයන්ගේ ආතිරික්තයක් - අනිත් තැන රැකියාව නැති හා යැපීම් මාර්ගයක් නොමැති ශ්‍රමිකයන් අතිරික්තයක් නමුත් සමාජ නිෂ්පාදනයේ සහ සමාජ යහ පැවැත්මේ මෙම ලීවරයන් දෙකට එක්ව කටයුතු කළ නොහැකිය. එයට හේතුව නිෂ්පාදන මාධ්‍යන් හා නිෂ්පාදිතයන් ප්‍රථමයෙන් ප්‍රාග්ධනය බවට පත්වුවහොත් මිස නිෂ්පාදන මාධ්‍යන්ගේ ක්‍රියාත්මක වීම හා නිෂ්පාදිතයන්ගේ සංසරණය ධනපති නිෂ්පාදන ක්‍රමය විසින් වලක්වන බැවිනි. තවද

ඒවායේ අති බහුලත්වය නිසා ඒවා ප්‍රාග්ධනය බවට පරිවර්ථනය වීමද වැලකේ. මෙම ප්‍රතිවිරෝධතාවය අර්ථ විරහිත වන තරමට වර්ධනය වී තිබේ. හුවමාරු ආකෘතියට විරුද්ධව කැරළි ගසමින් නිෂ්පාදන ක්‍රමය නැගී සිටී. ධනපති පංතියට ඔවුන්ගේම සමාජ නිෂ්පාදනීය බලවේගයන් හසුරුවාගත නොහැකි වීම සම්බන්ධයෙන් ඔවුහු වැරදිකරුවන් වෙති.

ඈ) නිෂ්පාදනීය බලවේගයන්ගේ සමාජමය සවභාවය අර්ධ වශයෙන් පිළිගැනීම ධනපති පංතිය මත බලෙන්ම පැටවීම නිෂ්පාදනය හා පණිවිඩ හුවමාරුව සඳහා වූ මහා ආයතන පළමුව බද්ධ ව්‍යාපාර වස්තු සමාගම ද, පසුව සංගත ව්‍යාපාරද ඊළඟට රජයද මගින් අත්පත් කර ගැනීම ධනපති පංතිය අනවශ්‍ය පංතියක් බව පැහැදිළි වේ. දැන් ඔවුන්ගේ සියළුම සමාජමය කාර්යයන් ඉටුකරනු ලබන්නේ වේතන ලබන සේවකයන් විසිනි.

**III නිර්ධන පංති විප්ලවය** - ප්‍රතිවිරෝධතාවය විසඳීම නිර්ධන පංතිය දේශපාලන බලය අල්වා ගනිමින් මේ මාර්ගයෙන් ධනපති පංති අතින් ලිස්සායන සමාජමය වූ නිෂ්පාදන මාර්ග මහජන දේපල බවට පත් වෙයි. නිර්ධන පංතියේ මෙම ක්‍රියාව මගින් නිෂ්පාදන මාර්ග මෙතෙක් දැරූ ප්‍රාග්ධන ස්වභාවයෙන් ඒවා නිදහස්කර ඒවායේ සමාජමය ස්වරූපයට අංගසම්පූර්ණ වශයෙන් ක්‍රියාත්මක වීමේ සම්පූර්ණ නිදහස සලසා දෙනු ලැබේ. එතැන් පටන් කළින් සකස් කරගත් සැකැස්මක් අනුව සමාජමය ලෙස නිෂ්පාදනය කළ හැකි වේ. නිෂ්පාදනයේ සංවර්ධනය නිසා සමාජයේ විවිධ පංති පැවතීම මෙතැන්පටන් කල්ගිය ඇබ්බැහි කමක් බවට පත්වේ. සමාජමය නිෂ්පාදනයේ අරාජිකත්වය පහව යන අනුපාතය අනුව රාජ්‍යයේ දේශපාලන අධිකාරයද හැකිලී යන්නේය. අන්තිමේදී තමන්ගේම සමාජ සංවිධානයේ ස්වාමීත්වයට එළඹෙන මිනිසා ඒ අතරම ස්වභාව ධර්මයට ද අධිපති වෙයි. ඔහු ඔහුගේම ස්වාමියා වෙයි. - නිදහස් වෙයි. නවීන නිර්ධන පංතියේ ඓතිහාසීය කාර්ය භාරය වී තිබෙන්නේ මෙම විශ්වීය විමුක්තිය පිළිබඳ කාර්ය ඉටු කිරීමයි. නිර්ධන පංති ව්‍යාපාරයේ න්‍යායික ප්‍රකාශනය වූ විද්‍යාත්මක සමාජවාදයේ කර්තව්‍යය නම් මෙම කාර්යයට අදාළ ඓතිහාසික කොන්දේසි අංග සම්පූර්ණ ලෙස වටහා ගැනීම හා ඒ අනුව එහි ස්වභාවයම වටහා ගැනීම ද දැනට පීඩිතව සිටින නිර්ධන පංතියට ඉටු කිරීමට පැවරුණු මෙම බාරධූර කාර්ය පිළිබඳ කොන්දේසි හා අරථය ගැන එයට සම්පූර්ණ දැණුමක් දීමද වන්නේය.

## සටහන්

[1]"සමාජවාදය - මනොරජ්‍යයෙන් විද්‍යාවට" යන කෘතියේ ඉංග්‍රීසි සංස්කරණය සදහා මෙම පෙරවදන ලියන ලද්දේ පෙඩ්රික් එංගල්ස් විසිනි. එම කෘතිය එඩ්වර්ඩ් ඇවලින් විසින් පරිවර්තනය කරන ලදුව "මනෝරාජික සමාජවාදය සහ විද්‍යාත්මක සමාජවාදය" යන නම ඇතිව 1892 වර්ෂයේ ලන්ඩනයේ දී පළකෙරිණි.

[2] ලසාල් වාදීන් සහ ඊසානාක්වාදීන් - 19 වැනි ශතවර්සයේ හැට ගණන්වල සහ මුල් හැත්තෑ ගණන්වල ජර්මන් වැඩ කරන පංති ව්‍යාපාරයේ පක්ෂ දෙකක්.

a. ලසාල්වාදීන් - ජර්මන් සුළු ධනේෂ්වර සමාජවාදියෙක් වූ ෆර්දිනන්ද් ලසාල්ගේ අනුගාමිකයන් සහ ආධාරකාරීන් ඔවුහු 1863 දී ආරම්භ කරන ලද ජර්මන් කම්කරුවාගේ පොදු සංගමයේ සාමාජිකයන් වූහ. ලසාල්වාදය ජර්මන් කම්කරු පංති ව්‍යාපාරයේ අවස්ථාවාදී උපනිතියක් වශයෙන් දුටු මාක්ස් හා එංගල්ස් එහි න්‍යාය, උපක්‍රම හා සංවිධාන ප්‍රතිපත්ති කීපවරක්ම තියුණු විවේචනයට ලක් කළහ.

b. ඊසනාක්වාදීන් - 1869 දී ඊසනක් හි පවත්වන ලද ආරම්භක සම්මේලනයේදී පිහිටුවන ලද ජර්මනියේ සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී කම්කරු පක්ෂයේ සාමාජිකයින්. ඔවුන්ගේ නායකයන් වූයේ මාක්ස් හා එංගල්ස්ගේ දෘෂ්ටිමය බලපෑම ලැබ සිටි අව්ගුස්ට් බේබෙල් සහ විල්හෙල්ම් ලීබ්ක්නෙහ්ට් ය.

1875 දී ගෝතාහි පැවති සම්මේලනයේදී පක්ෂ දෙක ජර්මනියේ එක්සත් සමාජවාදී කම්කරු පක්ෂය නමින් ඒකාබද්ධ විය. ලසාල්වාදීහු මෙය තළ අවස්ථාවාදී පිළ නියෝජනය කළහ.

[3] ද්විලෝහ මුදල් මිම්ම - රත්‍රන් හා රිදී මිම්ම ලෙසට යොදාගන්නා මුදල් ක්‍රමයකි.

[4] දි මාර්ක් - පෞරාණික ජර්මන් ග්‍රාමීය මෙම මාතෘකාව යටතේ "සමාජවාදය - මනෝරාජ්‍යයෙන් විද්‍යාවට" යන පොතට උපග්‍රන්තයක් ඇතුළු කළ එංගල්ස් පුරාණ කාලයේ පටන් ජර්මන් ගොවි ජනතාවගේ ඉතිහාසයේ කෙටි දළ සටහනක් ගෙනහැර පෑවේය.

[5] අඥෙයවාදය - ලෝකය අවබෝධකරගත නොහැකි යැයිද, මිනිස් විදාර ශක්තියට මිනිස් සංවේදනයෙන් ඔබ්බට යා නොහැක්කේ යැයිද කියන විඥානවාදී ධර්මයකි. අඥෙයවාදය විවිධාකාරයෙන් ප්‍රකට වන්නේය: සමහරු ද්‍රව්‍යමය ලෝකය වාස්තවික වශයෙන් පවතින බව පිළිගන්නා නමුත් ඒ පිළිබද ප්‍රජානන හැකියාව පිළි නොගනිති. ඒ අතර අනික් පිරිසක් කියන්නේ මිනිසාට ඔහුගේ සංජානනයෙන් බාහිර කිසිම දෙයක් පවතී ද යන්න දැනගත නොහැකි නිසා ද්‍රව්‍යමය ලෝකයේ පැවැත්ම පිළිගත නොහැකි බවයි.

[6] ස්කූල්මන් - මධ්‍යකාලීන යුගයේ පුළුල් ලෙස පැතිරී තිබුණු ආගමික දර්ශනයක් වූ ස්කෝලාස්ටිසිසම් නැමැති පණ්ඩිත විචාරය ගෙනහැර දැක්වූවෙකි. ඉතාමත් වියුක්ත හා සම්පූර්ණ යථාර්ථයෙන් බාහිරවූ එය, විවිධාකාර තර්ක දගර මගින් ක්‍රිස්තියානි පල්ලියේ අන්ධ විශ්වාසයන් සනාථ කිරීමට උත්සාහ කළේය.

[7] දේව ධර්මය (දෙවියන්ගේ විද්‍යාව) - ආගමික ධර්මයන්, අන්ධ විශ්වාස සහ ඇදහිලි ක්‍රමානුකූල කිරීමට සහ "විද්‍යානුකූල ලෙස සනාත කිරීමට උත්සාහ කරන ආගමික දහමක්."

[8] නාමමාත්‍රවාදීන් - මධ්‍යකාලීන දර්ශනවාදී ප්‍රවනතාවයක් නියෝජනය කළේය. විශ්වීය විකල්ප යනු යථාර්ථ ලෙස පවත්නා එක් එක් දේවල් නම් ලෙසට එය සැලකුවේය. මධ්‍යකාලීන යථාර්ථවාදීන් මෙන් නොව, මොවුහු කීවේ වස්තූන්ගේ මූල රූප හා ප්‍රභව මූලයන් වශයෙන් සංකල්ප නොපැවති බවයි. වස්තූන් ප්‍රධානවන බවත්, සංකල්පයන් අප්‍රධාන වන බවත්, ඔවුහු කීහ. මේ අර්ථය අනුව මධ්‍යකාලීන යුගයේදී ද්‍රව්‍යවාදය ප්‍රථමයෙන් ප්‍රකාශ වූයේ නාමමාත්‍රවාදයෙනි.

[9] හෝමියෝමෙරියායි - පුරාණ ග්‍රීක දාර්ශනික ඇනක්සගෝරස්ගේ මතය පරිදි අනන්ත භාජ්‍යතාවයට යටත් ක්ෂුද්‍ර, ගුණාත්මක වශයෙන් ස්ථිර ද්‍රව්‍ය අංශුය. පවත්නා සියල්ලෙහි මූලික පදනම හෝමියෝමෙරියායි බවත් ඒවායේ සංයෝජනයෙන් ද්‍රව්‍ය අනේකතාවය සෑදෙන බවත් ඇනක්සගෝරස් කීවේය.

[10] ඊශ්වරවාදී - පුද්ගලයෙක් වශයෙන් දෙවියන් පවතිනැයිද, ස්වභාවධර්මයෙන් බාහිර සත්තාවක් වන ඔහු ලෝකය මැවී යයිද කියන ආගමික දර්ශනයක් වන ඊශ්වරවාදයට අදාළය. දෙවියෝ ක්‍රියාශීලී ලෙස ස්වභාව ධර්මයේ සහ සමාජයේ ජීවිතයට මැදිහත් වන බව ඊශ්වරවාදයෙන් කියවේ.

[11] දේවවාදය - දෙවියන් විශ්වයෙහි අපෞද්ගල, බුද්ධිමත් හා ප්‍රධාන හේතුකාරක වශයෙන් පිළිගන්නා නමුත්, මෙය ස්වභාව ධර්මයේ හා සමාජයේ ජීවිතයට දෙවියන් මැදිහත් වන්නේය යන්න නිෂේධ කරයි.

[12] මාක්ස් සහ එංගල්ස් - “Die Heilige Familie, Oder Kritik der Kritischen. Gegen Bruno Bauer Und Konsorten”

[13] මෙහි සඳහන් කර තිබෙන්නේ 1851 මැයි හා ඔක්තෝම්බර් අතර ලන්ඩනයේ පවත්වන ලද ලෝක වෙළඳ හා කාර්මික ප්‍රදර්ශනය ගැනය.

[14] බැප්ටිස්වරු - කිතුන දහමේ පැතිරගිය එක් නිකායක අනුගාමිකයෝය.

[15] "ගැලවීමේ හමුදාව" - ඉවැන්ජලිස්ට්වාදී විලියම් බූත් විසින් 1865 දී එංගලන්තයේ ආරම්භ කරන ලද ප්‍රතිගාමී සහ පරාර්ථකාමී සංවිධානයකි. අනතුරුව එය එහි කටයුතු වෙනත් රටවලටද ව්‍යාප්ත කළේය. (1880 දී එයට ගැලවීමේ හමුදාව යන නම තබා යුද්ධමය ආකාරයෙන් සංවිධානය කරන ලදී) බොහෝදුරට ධනපති පංතිය විසින් ආධාර කරන ලද මෙම සංවිධානය පුළුල් ලෙස ආගමික ප්‍රචාරයක් කරගෙන ගියේත්, අසරණසරණ ආයතන ජාලයක් පිහිටවූයේත්, වැඩකරන ජනතාව සූරාකන්නට විරුද්ධව කරන අරගලයෙන් වෙනතකට යොමු කිරීමටය. මෙහි සමහර දේශකයෝ කෛරාටික සමාජශීලී භාවයක් දැක්වීමෙහිද, පොහොසතුන්ගේ ආත්මාර්ථකාමීත්වය හෙලා දැකීමෙහිද යෙදුනහ.

[16] අධ්‍යාත්මවාදය - ස්වාධීන වූත් මිනිසාගේ මොළයට පරිබාහිර වූත් ඊනියා ජීවිතයේ සදාකාලික පැවැත්ම ගැන ද, ලෝකයේ අධ්‍යාත්මික සම්භවය ගැන ද කියන විඥ්ඥානවාදී දහමකි.

[17] “කීර්තිමත් විප්ලවය” යනුවෙන් ඉංග්‍රිසි ධනපති ඉතිහාස ලියවිලිවල සඳහන්ව ඇත්තේ 1688 කුමන්ත්‍රණය ය. එමගින් ස්ටුවර්ට්වරු බලයෙන් පහකරන ලද අතර, විලියම් ඔෆ් ඔරෙන්ජ් ගේ නායකත්වයෙන් (1689 දී) ව්‍යවස්ථානුකූල රාජාන්ඩුවක් ඇතිකරන ලදී. එම

ආණ්ඩුව ඉඩම් හිමි වංශවතුන් හා ධනපතියන් අතරවූ බේරුම් කර ගැනීමක් මත පදනම් වූ එකක් විය.

[18] රෝසමල් යුද්ධය - (1455-1485) රදල වලව් දෙකක් අතර සිංහාසනය සඳහා කරන ලද යුද්ධය විය. සුදු රෝසමල ලකුණ දැරූ යෝක්වරුද, රතු රෝසමල ලකුණ දැරූ ලැන්කැස්ටර් වරුද එම දෙපාර්ශවය විය. යෝක්වරු රටේ දකුණුදිග, වඩාත් ආර්ථික වශයෙන් දියුණු වූ ප්‍රදේශයේ රදල ස්වාමිවරු සමහර දෙනෙක් ද, එමෙන්ම නයිට්වරු සහ නාගරික ජනයාද ඔවුන් පැත්තට එකතු කරගත්හ. උතුරු කවුන්ටි ප්‍රදේශවල රදළ වංශවතුන් ලැන්කැස්ටර් වරුන්ට ආධාර කළහ. මෙම යුද්ධවල ප්‍රතිපලයක් වශයෙන් පැරණි රදල පවුල් සම්පූර්ණයෙන්ම පාහේ විනාශ වී අවසානයේදී අළුත් රාජවංශයක් ස්ථාපිත විය. ටියුඩර්වරු වූ ඔවුහු එංගලන්තයේ ඒකාධිපති රාජාණ්ඩුවක් පිහිටවූහ.

[19] කාර්ටෙසියන්වාදය - දෙකාර්ට්ගේ ධර්මය සහ එය 17 සහ 18 වැනි ශතවර්ෂයේ දර්ශනවාදී ප්‍රවනතාවයක් විය. ඔහුගේ අදහස් වර්ධනය කළ ස්වාභාවික විද්‍යාව ද ඊට ඇතුලත් විය.එයට නම් තබන ලද්දේ ලතින් උරුවට Cartesius (කාර්ටෙසියස්) යනුවෙන් හරවාගත් දෙකාර්ට්ගේ නම අනුවය.

[20] විශ්ව කොෂිකයෝ - “Encyclopedie, ou Dictionnaire Saisonnedes Sciences, Des Arts Et Des Metiers” (1751-1780) විශ්ව කොශය පළකිරීම සඳහා දාර්ශනිකයන්ගෙන්ද සවභාවධර්ම විද්‍යඥයින්ගේද, රචනා කරුවන්ගෙන්ද සැදුම්ලත් 18 වැනි ශතවර්ශයේ වූ ප්‍රංශ මාර්ග දේශකයින්ගේ කණ්ඩායම මේ නමින් හැඳින්විනි. එහි සංවිධායකයා හා ප්‍රධානියා වූයේ දෙනීදිතේරෝය. විශ්ව කොෂය ළකිරීම සඳහා පෝල් අන්රි ගෝල්බාහ්, ක්ලෝද් අද්රියාන් හෙල්වෙටිසි, වොල්තේර් ආදීහු මහත් උද්යෝගයකින් සහභාගී වූහ.

විශ්ව කොෂිකයින් අතරින් විඥානවාදී දර්ශනයට විරුද්ධවූ ද්‍රව්‍යවාදීහු එහිදී විශාල කාර්ය කොටසක් ඉටු කළහ.

“විශ්ව කෝශය” සම්පාදක මණ්ඩලය විද්‍යාත්මක ක්ෂේත්‍රයේ මෙන්ම දේශපාලන ක්ෂේත්‍රයේ දීද විවිධ අදහස් දැරුවේ වූ නමුත් වැඩවසම් ක්‍රමයට හා පල්ලියෙ අයුතුකම් වලට ඇති විරුද්ධත්වයද මධ්‍යකාලීන පණ්ඩිත විචාරයට ඇති රයද නිසා ඔවුන් ඒකාබද්ධ විය.

18 වැනි ශතවර්ශයේ අගදී ප්‍රංශයේ සිදුවූ ධනපති විප්ලවය සඳහා දෘෂ්ටිමය ලෙස සූදානම් වීමේදී විශ්ව කෝෂිකයෝ තීරණාත්මක ක්‍රියාවලියක් ඉටු කළහ.

[21] එංගල්ස් අදහස් කරන්නේ 1789 ආණ්ඩුක්‍රම සම්පාදක මණ්ඩලය විසින් පිළිගන්නා ලද "මිනිසාගේ හා පුරවැසියාගේ අයිතිවාසිකම් ප්‍රකාශනය" ගැනය. එය නව ධනපති ක්‍රමයක් සඳහා දේශපාලන ප්‍රතිපත්ති ඉදිරිපත් කළේය. ය 1791 දී ප්‍රංශ ව්‍යවස්ථාවට ඇතුලත් කරන ලදී. එහි පදනම මත 1793 දී ජකොවින් වාදී "මිනිසාගේ හා පුරවැසියාගේ අයිතිවාසිකම් ප්‍රකාශනය" පිළියෙල කරන ලදී.

[22] Code Civil (සිවිල් නීති සංග්‍රහය) – 1804 -1810 කාලය තුළ ප්‍රංශයේ පළමුවැනි නැපෝලියන් යටතේ සකස් කරන ලද (එනිසා නැපෝලියන්ගේ නීති සංග්‍රහය යනුවෙන් නම් කරන ලද නීති සංග්‍රහ පහෙන් එකකි. ධනපති නීතිය පොදු වහයෙන් අනු සන්ධානය කිරීමක් එයින් නියෝජනය විය. 1804 දී අනුමත කරන ලද සිවිල් නීති සංග්‍රහය ධනපති සමාජයේ සම්භාවනීය නීති සංග්‍රහයක් ලෙසට එංගල්ස් විසින් විස්තර කරන ලදී.

[23] මෙහි සඳහන් කෙරෙන්නේ 1831 දී නියෝජිත මන්ත්‍රී මණ්ඩලය විසින් සම්මත කරන ලද ඡන්ද බලය පිළිබඳ ප්‍රථි සංස්කරයේ පනත ගැනය. එය සාමි මන්ත්‍රී මණ්ඩල විසින් අවසාන වශයෙන් සම්මත කරන ලද්දේ 1832 දීය. ඉඩම් හිමි සහ මූල්‍ය වංශාධිපතියන් සතුව තිබුණු දේශපාලන ඒකාධිකාරයට විරුද්ධව එල්ල වුණු ප්‍රතිසංස්කරණ නිසා කාර්මික ධනපති පංතියේ නියෝජිතයින්ට පාර්ලිමේන්තුවට ඇතුළුවීම සඳහා දොර විවෘත විය. ප්‍රතිසංස්කරණය සඳහා වූ අරගලයේ ප්‍රධාන බලවේගය වූ නිර්ධන පංතිය හා සුළු ධනපති පංතිය ලිබරල් ධනපති පංතිය විසින් රවටන ලදින් මැතිවරණ වෙතිවාසිකම් නොලදහ.

[24] ධාන්‍ය නීති - ඉඩම් හිමියන්ගේ යහපත පිණිස ධාන්‍ය ආනයනය සම්බන්ධයෙන් පාර්ලිමේන්තුව විසින් 1815 දී පනවන ලද බරපතල අය බදු ජනගහනයේ දුප්පත් කොටස් වලට එය හානිදායක ලෙස තදින් බලපෑ අතර එනිසා ශ්‍රම මිල වැඩිවූ නිසාද දේශීය වෙළඳපලේ දරිද්‍රතාවය අඩුවූ නිසාද, විදේශ වෙලදාමට බාධා ඇතිවුණු නිසාද, කාර්මික ධනපතියටද එයින් අවාසි සිදු විය. ඉංග්‍රීසි ධනපති පංතිය තිස් ගණන් අගදී කෝබ්ඩන් හා බයිට්ගේ නායකත්වය යටතේ ධාන්‍ය නීති විරෝධී සංගමයක් සංවිධානය කළේය. ධන්‍ය නීති වලට විරුද්ධව කරන ලද උද්ඝෝෂණ නිසා 1846 දී ඒවා අවලංගු කිරීමට හේතු විය.

[25] වෘත්තිය සමිති පිහිටුවීමට වරුද්ධව තිබුණු තහනම ඉවත් කරන පණතක් පොදු ජන ව්‍යාපාරයේ බලපෑම යටතේ 1824 දී සම්මත කිරීමට පාර්ලිමේන්තුවට සිදු විය. කම්කරුවන්ගේ සමාගම් ගැන පණතක් සම්මත කළ පාර්ලිමේන්තුව වෘත්තිය සමිති පිහිටුවීමට විරුද්ධ තහනම ඉවත් කළ බව ස්ථිර කරන අතරම ඒවායේ කටයුතු සම්බන්ධයෙන් තදබල සීමාවන් පැනෙව්වේය. විශේෂයෙන්ම කම්කරුවන් වෘත්තිය සමිතියට බැඳීමට පක්ෂව සහ වුන් වැඩවර්ජනවලට සහභාගී වීමට පක්ෂව කරන හුදු උද්ඝෝෂණයක් පවා "හිංසනය" සහ "හිරිහැර කිරීම" වශයෙන් සලකන ලද අතර අපරාධයක් සේ සලකා එයට දඩුවම් කළ හැකිය.

[26] මහජන ප්‍රඥප්තිය - චාටිස්ට් වරුන්ගේ ඉල්ලීම ඇතුලත් මෙය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ පෙත්සමක ස්වරූපයෙන් 1838 මැයි මස 8 දින පළ කරන ලදී. එහි වගන්ති හයක් ඇතුලත් විය. ඒවා නම් සර්වජන වැඩි හිටි පුරුෂ චන්දය, පාර්ලිමේන්තුවට තෝරා පත් කිරීමේ වාර්ෂික මැතිවරණ, රහස් ලෙස ඡන්දය දීම සමාන මැතිවරණ කොට්ඨාශ, පාර්ලිමේන්තු අපේක්ෂකයන් සඳහා දේපළ සුදුසුකම් අවලංගු කිරීම සහ මන්ත්‍රීවරුන්ට දීමනා ගෙවීම යනුයි. මහජන ප්‍රඥප්තිය අනුමත කරන ලෙස ඉල්ලා චාටිස්ට් වරු ඉදිරිපත් කළ පෙත්සම් තුනක් පාර්ලිමේන්තුව විසින් 1839, 1842 හා 1849 වර්ෂවලදී ප්‍රතික්ෂේප කරන ලදී.

[27] ධාන්‍ය නීති විරෝධි සංගමය - මෑන් වෙස්ටර් හි කර්මාන්තකරුවන් වූ කොබ්ඩන් සහ බයිට් විසින් 1838 දී ආරම්භ කරන ලද ඉංග්‍රීසි කාර්මික ධනපති පංතියේ සංවිධානයකි. කම්කරුවන්ගේ වේතන අඩු කිරීමේ සහ ඉඩම් හිමි වංශාධිපතියන්ගේ ආර්ථික සහ දේශපාලන තත්වයන් දුර්වල කිරීමේ මාර්ගයක් වශයෙන් සීමා නොකළ නිදහස් වෙළඳාමත්, ධාන්‍ය නීති අවලංගු කිරීමත් සඳහා (24 වැනි සටහන බලන්න) සංගමය ඉල්ලීම් ඉදිරිපත් කළේය. සංගමය ඉඩම් හිමියන්ට විරුද්ධව කළ එහි අරගලයේ දී එය ඔවුන්ට විරුද්ධව වැඩ කරන ජනතාව උපයෝගී කරන ගැනීමට උත්සාහ කළේය. එහෙත් ඒ වන විට දියුණු බ්‍රිතාන්‍ය කම්කරුවන් දේශපාලන (චාටිස්වාදය) හැඩයක් ගෙන තිබුණු ස්වාධීන කම්කරු ව්‍යාපාරයේ මගට පිවිස සිටියහ. ධාන්‍ය නීති අවලංගු කිරීමෙන් පසුව සංගමය අහෝසි විය.

[28] "බ්‍රදර් ජොනතන්" - එංගලන්තයේ උතුරු ඇමරිකානු යටත් විජිත නිදහස සඳහා කළ යුද්ධය කාලයේදී (1775-1783) ඉංග්‍රීසීන් උතුරු ඇමරිකානුන්ට දුන් උපහාසාත්මක විකට නමකි.

[29] පොතෙස්තන්ත්‍රවාදයේ ප්‍රවනතාවයකි. එය 18 වැනි ශත වර්ෂයේ ප්‍රථම භාගයේ එංගලන්තයේ පැණනැගී උතුරු ඇමරිකාවේ පුළුල් ලෙස පැතිර ගියහ. ආගමික දේශනා කිරීම සහ ආගම අදහන්නන්ගේ අළුත් ප්‍රජා සංවිධාන ඇති කිරීම මගින් ක්‍රිස්තියානි ආගම ශක්තිමත් කිරීමට හා ව්‍යාප්ත කිරීමට ඔවුහු උත්සාහ කළහ.

[30] මෙහි සඳහන් කර තිබෙන්නේ ඩාබි-ඩිසේර්ලි ටෝරි පාක්ෂික ආන්ඩුව 1867 වර්ෂයේ ක්‍රියාත්මක කළ පාර්ලිමේන්තු ප්‍රතිසංකරණ ගැනය. මෙම ප්‍රතිසංස්කරණය විසින් ඡන්ද දායකයන් සංඛ්‍යාව දෙගුණ වන තරමටත් වැඩි කරන ලද අතර, පුහුණු කම්කරුවන්ගෙන් කොටසකටද ඡන්ද බලය ලැබුණෝය.

[31] මෙහි සදහන් කර ඇත්තේ 17 වැනි ශතවර්ෂයේ 70-80 ගණන්වල එංගලන්තයේ පිහිටුවන ලද දේශපාලන පක්ෂ දෙකකි.

විග් පක්ෂය මුල්‍ය සහ වාණිජ ධනපති පංතියේත්, ධනපති වංශාධිපතියන්ගේත් උවමනාවන් ප්‍රකාශ. පසුව විග්වරු අළුත් දේශපාලන පක්ෂයක්, එනම් ලිබරල් පක්ෂය පිහිටවූහ.

ටෝරි පක්ෂය ලොකු ඉඩම් හිමියන්ගේ සහ එංගලන්ත සභා පල්ලියේ උසස් පූජකවරුන්ගේ පක්ෂය විය. පසුව එය කොන්සෙව්ටිව් පක්ෂය බවට පරිවර්තනය විය.

[32] රහස් ඡන්දය ආරම්භ කරන ලද්දේ 1772 දීය.

[33] කතේද්‍ර් - සමාජවාදය -1870 -1890 ගණන්වල ධනපති දෘෂ්ටියේ පැවති ප්‍රවණතාවයකි. එහි ප්‍රචාරකයන් බොහෝ දෙනෙක්ම ජර්මන් විශ්වවිද්‍යාලවල මහාචාරය වරුන් වූ අතර ඔවුන් සමාජවාදය මෙන් වෙස්ගැන්වූ ධනපති ප්‍රතිසංස්කරණ වාදය විශ්ව විද්‍යාල පීඨ වලින් (ජර්මන් බසින් Katheder) දේශනා කළහ. කතේද්‍ර් සමාජවාදයේ ප්‍රචාරකයින් කීවේ, රාජ්‍ය පංතිවල වඩා ඉහළ සංවිධානයක් බවත්, එයට සතුරු පංති අතර සමතයක් ඇතිකළ හැකි බවත් හා ධනපතියන්ගේ උවමනාවන්ට හානියක් නොකරන අනුක්‍රමික ලෙස සමාජවාදය ඇති කළ හැකි බවත්ය. කතේද්‍ර් සමාජවාදයේ වැඩ පිළිවෙලෙහි හරය වශයෙන් තිබුනේ අසනීප හා හදිසි අනතුරු අවස්ථාවලදී සහන දීම සඳහා කම්කරුවන් රක්ෂණය කිරීම සහ පැක්ටරි නීති ක්ෂේත්‍රයෙහි පියවරයන් ගණනාවක් සම්මත කිරීමය. එහි අරමුණ වූයේ කම්කරුවන් පංති අරගලයෙන් වෙනතකට යොමු කිරීමය. කතේද්‍ර් සමාජවාදය සංශෝධන වාදයේ එක දෘෂ්ටිමය මූලාශ්‍රයක් විය.

[34] ආගමික පිළිවෙත් වාදය - (ශුද්ධවාදය-වාඩාත් ප්‍රසිද්ධ හැඳින්වීම) 19 වැනි ශතවර්ශයේ 30 ගණන් වලදී එංගලන්ත සභාව තුළ පැණනැගී නිකාය බේදයකි. මෙහි අනුගාමිකයෝ කතෝලික යම් යම් ආගමික පිළිවෙත්ද (හැඳින්වීම ඒ අනුව ලැබුනකි.) එහි සමහර සිද්ධාන්තද එංගලන්ත සභාවට ඇතුලත් කළ යුතු යැයි කියා සිටියහ. "ගැලවීමේ හමුදාව"- 15 වැනි සටහන බලන්න

[35] එංගල්ස් සඳහන් කරන්නේ ඉංග්‍රීසි වෘත්තීය සමිතිය ගැන වූ ලියෝ බෙන්ටානෝගේ ලියවිලි හා කතා ගැනය. කම්කරුවන්ගේ තත්වය මූලික වශයෙන් වැඩිදියණු කර ගැනීමට සහ ධනපති සූරා කෑමෙන් ඔවුනට නිදහස් වීමට හැකියාව ලබාදෙන කම්කරු පංති

සංවිධානයක ආදර්ශයක් ලෙසට ඔහු ඉංග්‍රීසි වෘත්තීය සමිති වාදය හුවා දැක්වීය. බෙන්ටානෝ සහ අනෙකුත් කතේදර් සමාජවාදීන් කියන ලෙසට හොදින් සංවිධානය වුණු වෘත්තීය සමිති ඇතොත් කම්කරු පංතියේ දේශපාලන අරගලය සහ දේශපාලන පක්ෂ අවශය නොවේ. එවැනි කියමන් වල ව්‍යාජත්වය සහ පංති සවභාවය එංගල්ස්ගේ "බෙන්ටානෝ Contra මාක්ස්" යන ලියවිල්ලෙන් හෙළිදරව් කරන ලදි.

[36] ඊස්ට් එන්ඩ් - මෙය ලන්ඩන් නගරයේ නැගෙනහිර ප්‍රාන්තයයි. මෙහි වැසියෝ කම්කරුවෝය.

[37] මෙහි සදහන් වන්නේ ජර්මනියේ 1878 ඔක්තෝම්බර් 21 වැනි දින නිකුත් කරන ලද සමාජවාදීන්ට විරුද්ධ අති විශේෂ නීතිය පිළිබදවය. කම්කරු ව්‍යාපාරයේ බලපෑම යටතේ 1890 ඔක්තෝම්බර් පළවැනි දින එම නීතිය ඉවත් කරන ලදී.

[38] රූසෝගේ න්‍යාය අනුව මුළින්ම මිනිසන් ස්වභාවික රාජ්‍යයක ජීවත්වූ අතර සියල්ලෝම සමාන වූහ. පෞද්ගලික ධනය ඇතිවීම සහ අසමානාත්මතාවය වර්ධනය වීම සමග ජනතාව ස්වභාවික රාජ්‍යයක සිට සමාජ ගිවිසුම් පදනම් කරගත් ප්‍රජා රාජ්‍යයකට සංක්‍රමණය වූහ. අනතුරුව දේශපාලන අසමානතාවය සංවර්ධනය වී සමාජ ගිවිසුම උල්ලංගණය කරන ලදුව අත්තනෝමතික පාලනය ඇති අළුත් රජයක් පෙරට ආවේය. නව සමාජ ගිවිසුමක් පදනම් කරගත් සාදාරණ රාජ්‍යයක් පිහිටුවා ගතහොත් මෙය නිවැරදි කළ හැකිය.

[39] ඇනා බැප්ටිස්ට්වරු (නැවත බෞතිස්ම කරන්නෝ) 16 වැනි ශතවර්ෂයේ දී ජර්මනියේ සහ ස්විස්ටර් ලන්තයේ ඇතිවූ ආගමික නිකායක සාමාජිකයෝ 1524-25 ගොවි යුද්ධයේදී, බොහෝ කොටම ගොවීන්ගෙන්, ශිල්පීන්ගෙන් හා කුඩා කාර්මිකයන්ගෙන් සමන්විත වූ ඇනා බැප්ටිස්ට්වරු, තෝමස් මුන්සර් විසින් මෙහෙයවන ලද ව්‍යාපාරයේ ඉතාමත් විප්ලවවාදී අංශයට සම්බන්ධව සිටියහ.

[40] එංගල්ස් සදහන් කරන්නේ 17 වැනි ශතවර්ෂයේ ඉංග්‍රීසි ධනපති විප්ලවයේ අන්ත වාමාංශය නියෝජනය කළ සහ නගරයේ සහ ගම්බද දුප්පත් කොටස් වල අවශ්‍යතාවයන් ප්‍රකාශ කළ "ට්‍රෑලෙවලර්ස්" නැතහොත් "ඩිගර්ස්" ගැනය. ඉඩම් පිළිබද පෞද්ගලීක දේපල අහෝසි කරන ලෙස ඉල්ලූ සහ පෞරාණික සමාණකාරී කොමියුනිස්ට් වාදය පිළිබද අදහස් දේශනා කළ ඔවුහු පොදු ඉඩම් වල පොදුවේ සී සෑමෙන් ඒවා ව්‍යවහාරික වශයෙන් ක්‍රියාත්මක කරන්නට උත්සාහ කළහ.

[41] එංගල්ස් මෙහි සදහන් කරන්නේ මනෝරාජී කොමියුනිස්ට් වාදී ලේඛකයන්ගේ කෘති ගැනය - තොමස් මෝර්ගේ “උතෝපිය” (1516 දී පළකරන ලදී.) යන කෘති ගැනය.

[42] ත්‍රස්තයේ රජය - ජැකෝබින් වරුන්ගේ විප්ලවවාදී ප්‍රජාතන්ත්‍රවාදී ආඥාදායකත්වයේ කාලයකි. (ජුනි 1793 -ජූලි 1794) එම කාලය තුළ ජිරෝන්ඩවාදීන්ගේ සහ රාජපාක්ෂිකයන්ගේ ප්‍රති විප්ලව වාදී ත්‍රස්තයට විරුද්ධව ඔවුහු ප්‍රති ප්‍රහාර දුන්නහ.

අධ්‍යක්ෂ මණ්ඩලය නැතහොත් අධ්‍යක්ෂවරු -අධ්‍යක්ෂවරැ පස් දෙනෙකුගෙන් යුත් සභාවකි. ඉන් එක් අය බැගින් වාර්ෂිකව පත්කරන ලදී. ජැකෝබින්වරුන් ක්‍රියාත්මක කළ විප්ලවවාදී ආඥාදායකත්වය 1794 දී බිද වැටීමෙන් පසු අනුමත කරන ලද 1795

ව්‍යවස්ථාව යටතේ ප්‍රංශයේ විධායක බලය එයට පැවරී තිබුණි. 1799 වර්ෂයේ බොනපාට්වාදී කුමන්ත්‍රණය තෙක් පැවති එය ප්‍රජාතන්ත්‍රවාදී බලවේගයන්ට විරුද්ධව ත්‍රස්තයේ රජයට ආධාර දුන් අතර ලොකු ධනපතියන්ගේ අවශ්‍යතාවයන් ආරක්ෂා කළේය.

[43] මෙහි සඳහන් කෙරෙන්නේ 18 වැනි ශතවර්ෂය අගදී ඇති වුණු ප්‍රංශ ධනපති විප්ලවයේ සටන්පාඨ වූ "නිදහස, සමානාත්මතාවය, සහෝදරත්වය" ගැනය.

[44] නිව්ලනාක් (New Lanark) 1784 දී ගොඩනගන ලද ලනාර්ක් නැමති ස්කෝට් නගරය අසල කපු මෝලක සහ ගමක්

[45] ප්‍රංශ විරෝධී හය වැනි සභාගයේ (රුසියාව, ඔස්ට්‍රියාව, එංගලන්තය, ජ්රුසියාව සහ වෙනත් රාජ්‍යයන්) සමාජිකයන්ගේ මිත්‍ර හමුදා 1814 මාර්තු 31 දින පැරීසියට ඇතුල් වූහ. නැපෝලියන්ගේ අධිරාජ්‍ය බිඳවැටුනේය. නැපෝලියන් සියසුන හැරදමා ගිය අතර ඔහු එල්බා දිවයිනට පිටුවහල් කරන ලදී. බුර්බෝන් රාජාණ්ඩුව ප්‍රථම වතාවට පුනරුත්තාපනය වනු ප්‍රංශය දිටීය.

<u>සිය දවසේ යුද්ධය</u> - නැපෝලියන්ගේ අධිරාජ්‍යයේ කෙටි පුනරුත්තාපන කාලයයි. ඔහු පිටුවහල් කර සිටි එල්බා දිවයිනේ සිට ආපසු ප්‍රංශයට පැමිණි 1815 මාර්තු 20 දින පටන් ඔහු වෝටර්ලූ සංග්‍රාමයෙන් පරාජය වීමෙන් පසු දෙවැනි වරට සිහසුන අත්හල එම වර්ෂයේම ජුනි 22 දක්වා කාලයයි.

[46] වෙලින්ටන් විසින් මෙහෙයවන ලද ඒකාබද්ධ ඉංග්‍රීසි ලන්දේසි හමුදා සහ බ්ලුහර් විසින් මෙහෙයවන ලද ජ්රුසියන් හමුදා 1815 ජුනි 18 දින වොටර්ලූ (බෙල්ජියම) හිදී නැපෝලියන්ගේ හමුදා පැරදවූහ. 1815 යුද්ධ ප්‍රහාරයේ තීරණාත්මක කාර්ය කොටසක් ඉටුකළ මෙම සංග්‍රාමය නිසා 07 වැනි ප්‍රංශ විරෝධී සංග්‍රාමයේ (එංගලන්තය, රැසියාව, ඔස්ට්‍රියාව, ජ්රුසියාව, ස්වීඩනය, ස්පාඤ්ඤය සහ වෙනත් රාජ්‍යයන්) කෙළවර ජයග්‍රහණය සහ නැපෝලියන්ගේ අධිරාජ්‍ය බිඳවැටීම කල් තබාම ස්ථිර විය.

[47] 1815 ජනවාරි මාසයේදී ග්ලාස්ගෝහිදී ප්‍රසිද්ධ රැස්වීමක් ඇමතූ ඕවන් මෝල්වල වැඩකරන ළමයින්ගේ හා වැඩිහිටි කම්කරුවන්ගේ තත්වය වැඩිදියුණු කිරීමට පියවර ගණනාවක් යෝජනා කළේය. ඔහුගේ ක්‍රියාරම්භකත්වය අනුව 1815 ජුනි මාසයේදී පණතක් පාර්ලිමේන්තුවට යෝජනා කරන ලද නමුත්, 1819 ජූලි මස වන තෙක් එය සම්මත නොකිරිණ. එම අවස්ථාවේදීද එය නීතියක් වශයෙන් සම්මත කෙරුනේ අඩුලුහුඩු කළ ආකාරයෙනි. කපු මෝල්වල ශ්‍රම කටයුත හැරවීම සඳහා සම්මත කළ නීතිය අනුව අවුරුදු 09 ට අඩු ළමයින් සේවයෙහි යෙදවීම තහනම් විය. අවුරුදු 18 ට අඩු අයගේ වැඩ දිනය පැය 12 ට සීමා විය. උදය සහ සවස ආහාරය සඳහා පැයක හා පැය බාගයක විවේක කාල දෙකක් ඇති කෙරින.

[48] <u>මහාබ්‍රිතාන්‍යයේ සහ අයර්ලන්තයේ මහා ජාතික ඒකාබද්ධ වෘත්තීය සංගමය</u> විධිමත් ලෙස පිහිටුවන ලද්දේ 1833 ඔක්තෝම්බරයේදී ලන්ඩන්හි පවත්වන ලද සම්පකාර සමිති සහ වෘත්තීය සමිතිවල සම්මේලනයකදීය. එම සම්මේලනයේ සභාපතිත්වය දැරුවේ ඕවන්ය. මෙම සංගමයේ ව්‍යවස්ථා 1834 පෙබරවාරියේදී අනුමත කරන ලදී.ඕවන්ගේ යෝජනා ක්‍රමය අනුව නිෂ්පාදනයේ කළමණාකාරීත්වය සංගමයට බාරගෙන සාමකාමී මාර්ගයෙන් ප්‍රජාවෙහි සම්පූර්ණ පරිවර්ථනය කිරීමට අපේක්ෂා කරන ලදී. මෙම මනෝරාජික සැලැස්ම සම්පූර්ණයෙන්ම අසාථක විය. එමෙන්ම ධනපති සමාජයේ සහ රාජ්‍යයේ බලවත් ප්‍රතිරෝධනය හමුවේ 1834 අගෝස්තු මස සංගමය බිඳී ගියේය.

[49] මෙහි සදහන් වන්නේ එංගලන්තයේ නගර කිපයක් තුළ කම්කරු සමූපකාර සමිති විසින් ආරම්භ කරන ලද සාධාරණ ශ්‍රම හුවමාරු කඩමණ්ඩි (Epuitab Lelabour Exchange Bazaars) ගැනය. එවැනි ප්‍රථම කඩමන්ඩිය රොබට් ඕවන් විසින් 1832 සැත්තැම්බරයේදී ලන්ඩනයේදී ඇති කරන ලදී. එය 1834 වර්ෂයේ මැදක් වන තුරු පැවතියේය.

[50] 1848-1849 විප්ලව සමයේදී ප්රැදොන් විනිමය බැංකු සංවිධානය කිරීමට උත්සාහ කළේය. ඔහුගේ Banque du Peuple (මහජන බැංකුව) 1849 ජනවාරි 31 දින පැරීසියේදී පිහිටුවන ලදී. එය මාස දෙකක් පමණ පැවතියේය. එයද කඩදාසියට සීමාවූ පැවැත්මක් විය. එය නිතිපතා කටයුතු කිරීමට ඇරඹීමට පෙර අසාර්ථක වූයෙන් අප්‍රෙල් මස ආරම්භයේදී වසා දමන ලදී.

[51] විද්‍යා සංවර්ධනය පිළිබද ඇලෙක්සන්ද්‍රියානු කාලය ක්‍රිස්තුපූර්ව තුන්වන ශතවර්ෂයේ පටන් ක්‍රිස්තුවර්ෂ හත්වැනි ශතවර්ෂය දක්වා පැතිරෙයි. එයට නම ලැබුනේ ඇලෙක්සන්ද්‍රියාව යන ඊජිප්තු නගරයෙනි. එවකට එය ජාත්‍යන්තර ආර්ථික ගනුදෙනු පිළිබද මධ්‍යස්ථානයක් විය. ඇලෙක්සන්ද්‍රියානු කාලයේදී විද්‍යාවන් ගණනාවකට ප්‍රමුඛත්වය දෙන ලදී. ගණිතය, යාන්ත්‍රික විද්‍යාව (යුක්ලිදෙස් හා ආර්හිමේදෙස්) භූගෝල විද්‍යාව, තාරකා ශාස්ත්‍රය, ව්‍යුහ විද්‍යාව, කායික විද්‍යාව හා වෙනත් විද්‍යා ඒ අතර විය.

[52] මෙයින් වැදගත් සොයාගැනිම වූයේ ක්‍රිස්ටෝෆර් කොලොම්බස් 1492 දී ඇමරිකාව සොයා ගැනීම සහ පෘතුගීසි නාවික වස්කො ද ගාමා 1498 දී ඉන්දියාවට මුහුදු මාර්ගය සොයා ගැනීමය.

[53] මෙහි සදහන් කර ඇත්තේ, ඉන්දියාව සහ ඇමරිකාව සමග වෙළදාමේ මුල්තැන සදහාද, යටත් විජිත වෙළද පළවල් අල්ලා ගැනීම සදහාද, ප්‍රධාන යුරෝපීය බලවතුන් අතර 17 වැනි සහ 18 වැනි ශතවර්ශයේ කෙරුණු යුද්ධ ගැනය. ප්‍රථමයෙන් ප්‍රති පාක්ෂිකයන් වූයේ එංගලන්තය හා ඕලන්දයයි. (ඒවා අතර නියම වෙළද යුද්ධ වූයේ 1652-1654, 1664-1667 හා 1672-1674 වර්ෂවල කෙරුණු ඒවාය) පසුව තීරණාත්මක අරගල සිදු වූයේ බ්‍රිතාන්‍යය හා ප්‍රංශය අතරය. මේ යුද්ධ සියල්ලෙන්ම බ්‍රිතාන්‍ය ජයග්‍රාහී විය. ඒ අනුව 18 වැනි ශතවර්ෂය අවසාන වන විට මුළු ලෝකයේ මෙන්ම වෙළදාම එය අතට සංකේන්ද්‍රණය කරගෙන තිබුනේය.

[54] එංගල්ස් මෙය උපුටා දක්වන්නේ "ප්‍රාග්ධනය", 1 වැනි වෙළුමෙනි.

[55] කාල් මාක්ස් "ප්‍රාග්ධනය", 1 වැනි වෙළුම, 13 වැනි පරිච්ඡේදය, "යන්ත්‍ර සහ මහා පරිමාණ කර්මාන්ත".

[56] Seehandlung (මුහුදු මාර්ග වෙළද සමාගම) – 1772 දී ප්‍රශියාවේ පිහිටුවන ලද වානිජ - ණයදෙන සමිතියකි. රජයේ විශේෂ සැලකිල්ල හිමිව තිබූ මෙම සමිතිය එය ප්‍රයෝජනයට ගනිමින් රජයට විශාල ණය මුදල් සැපයුවේය. ඒ අනුව එම සමිතිය රජයට මුදල් සපයන බැංකුව හා බ්‍රොකර්වරයා බවට පත්විය. 1904 දී එය ප්‍රශියන් රාජ්‍ය බැංකුව බවට පරිවර්ථනය කරන ලදි.

[57] "නිදහස් ජනතා රාජ්‍යය" - යනු 1870 ගණන්වල ජර්මන් සමාජ - ප්‍රජාතන්ත්‍රවාදීන්ගේ වැඩපිළිවෙලට ඇතුලත් හා ඔවුන් එකළ භාවිතා කළ උද්යෝග පාඨයක් විය.

## නාමාවලිය

ආක්රයිට් (Arkwright) රිචඩ් (1732-1792) ඉංග්‍රීසි ව්‍යාපාරිකයෙක් විය. එංගලන්තයේ කෙරුනු සොයාගැනීම් ගණනාවක් පිළිබඳ පේටන්ට් බලය වංචාවෙන් අත්පත් කරගත්තේය.

ඈනක්සගෝරස් (ක්‍රි.පූ 500 පමණ -428) පුරාණ ග්‍රීක ද්‍රව්‍යවාදී දාර්ශනිකයෙක් විය.

ඇරිස්ටෝටල් (ක්‍රි:පූ: 384-322) - පුරාණ ශ්‍රේෂ්ඨ චින්තකයෙකි. ඔහුගේ කාලයේ ලබාගත හැකි දැණුම සම්පූර්ණ වශයෙන්ම ඔහුගේ කෘතිවල අන්තර්ගත විය. දර්ශනයේදී ද්‍රව්‍යවාදය හා විඥ්ඥානවාදය අතර වැනුනේය.

ඕවන් (Owen) රොබට් (1771-1858) ඉංග්‍රීසි මනෝරාජික සමාජවාදියෙක් විය.

කවර්ඩ් (Coward), විලියම් (1656 පමණ - 1725) ඉංග්‍රිසි ද්‍රව්‍යවාදී දාර්ශනිකයෙක් හා වෛද්‍යවරයෙක් විය.

කවලෙව්ස්කි, මක්සිම් මක්සිමවිච් (1851-1916) රුසියානු සමාජ විද්‍යාඥයෙක්, ඉතිහාසඥයෙක් මානව වංශ විද්‍යාඥයෙක් හා නීතිඥයෙක් විය. පෞරාණික ප්‍රජා ක්‍රමය ගැන කෘති කිපයක කතෘ විය.

කාට්රයිට් (Cartwrighi) එඩ්මන්ඩ් (1743-1823) - සුප්‍රසිද්ධ ඉංග්‍රිසි නවනිර්මාණකයා.

කාන්ට් (Kant) ඉම්මෑනුවෙල් (1724-1804) ජර්මන් මුල් දර්ශනවාදයේ ප්‍රාරම්භකයා විය. විඥානවාදියෙක් වු ඔහු ස්වාභාවික විද්‍යාව ගැන ලියු ඔහුගේ කෘති සම්බන්ධයෙන් සුප්‍රසිද්ධය

කාලයින් (cariyie) තෝමස් (1795-1881) ඉංග්‍රිසි කතෘවරයෙක් හා ඉතිහාසඥයෙක්ද විඥානවාදී දාර්ශනිකයෙක්ද විය.

කාල්වින් (Calvin) රිචඩ් (1509-1564) ප්‍රතිසංස්කරණයේ දෘෂ්ටිවාදියෙක් හා කාල්වින්වාදයේ නිර්මාතෘවරයාද විය. කාල්වින්වාදය, ප්‍රොතෙස්තන්ත්‍රවාදයේ ප්‍රවණතාවයක් වූ අතර ප්‍රාතමික වහයෙන් ප්‍රාග්ධනය සමුච්ඡගත වීමේ අවධායේ ධනපති අවශ්‍යතාවයන් ප්‍රකාශ කළේය.

කොබ්ඩන් (Cobden) රිචඩ් (1804-1865) ඉංග්‍රීසි කර්මාන්තකරුවෙක්ද, දේශපාලඥයෙක්ද විය. නිදහස් වෙළදාමේ පක්ෂවාදියෙක් හා ධාන්‍ය නීති විරෝධී සංගමයේ ආරම්භකයෙක් ද විය.

කොලින්ස් (Collins) ඇන්තනී (1676-1729) ඉංග්‍රීසි ද්‍රව්‍යවාදී දාර්ශනිකයෙක් විය. ඔහු ලොක්ගේ අනුගාමිකයෙක් විය.

ක්‍රොම්වෙල් (Cromwell) ඔලිවර් (1599-1658) 17 වැනි ශතවර්ෂයේ ඉංග්‍රීසි ධනපති විප්ලවයේ ධනපති පංතියේ සහ ධනපති වංශවතුන්ගේ නායකයෙක් විය. 1953 එංගලන්තයේ, ස්කෝට්ලන්තයේ සහ අයර්ලන්තයේ ලෝර්ඩ් ප්‍රොටෙක්ටර් තනතුරට පත්විය.

ජිෆන් (Giffen) රොබර්ට් (1837-1910) ඉංග්‍රීසි අර්ථශාස්ත්‍රඥයෙක් සහ සංඛ්‍යා විද්‍යාඥයෙක් විය. වෙළඳ මණ්ඩලයේ සංඛ්‍යාලේඛන අංශයේ ප්‍රධානියා විය.

<u>ගෙයිතේ (Goethe), යොහාන් වොල්ෆ්ගාං</u> (1749-1832) ශ්‍රේෂ්ඨ ජර්මන් ලේඛකයෙක් හා චින්තකයෙක් විය.

<u>චාල්ස් 1</u> (1600-1649) එංගලන්තයේ (1625-1649) රජ 17 වැනි ශතවර්ෂයේ ඉංග්‍රීසි ධනපති විප්ලවයේදී මරණයට පත්කරන ලදී.

<u>ඩාවින් (Darwin) චාල්ස් රොබට්</u> (1809-1882) ඉංග්‍රීසි ස්වභාවවාදියෙක් සහ විද්‍යාත්මක පරිනාමවාදී ජීව විද්‍යාව සොයාගත් තැනැත්තා විය.

<u>ඩිමොක්‍රිටස්</u> (ක්‍රි:පූ: 460 පමණ - 370 පමණ) පුරාණ ග්‍රීක ද්‍රව්‍යවාදී දාර්ශනිකයෙක් හා අනුවාදී ක්‍රමය සොයාගත් තැනැත්තා විය.

<u>ඩිසේර්ලි (Distaeli) බෙන්ජමින් (බීකන්ස්fපීල්ඩ් ස්වාමිවරයා)</u> (1804-1881) මධ්‍යකාලීන ස්කෝලාස්ටික්වාදී දර්ශනවාදියෙක් හා මධ්‍යකාලීන ද්‍රව්‍යවාදයේ ප්‍රථම ස්වරූපය වූ නාමමාත්‍රවාදය ගෙනහැර දැක්වූවෙක් විය.

<u>ඩූරිං (Duhring) යුජින් කාල්</u> (1833-1921)ජර්මන් දර්ශනවාදියෙක් විය. ඔහු ඔහුගේ දර්ශනයෙන් විඥ්ඥානවාදයත්, පිරිහෙළු ද්‍රව්‍යවාදයත්, ඉන්ද්‍රියානුභූත වාදයත් ඒකාබද්ධ කර ගත්තේය. ඔහු සුළු ධනපති සමාජවාදය ගෙනහැර පෑවේය.

<u>ඩොඩ්වෙල් (Dodwell) හෙන්රි</u> (අභාවය - 1784) ඉංග්‍රීසි ද්‍රව්‍යවාදී දාර්ශනිකයෙක් විය.

<u>දිදේරෝ (Diderot) දෙනී</u> (1713-1784) ප්‍රංශ දර්ශනවාදියෙක් සහ ප්‍රබුද්ධ බුද්ධිමතෙක් විය. යාන්ත්‍රික ස්වභාවයේ ද්‍රව්‍යවාදය ගෙනහැර දැක්වූ අදේවවාදියෙක් හා ප්‍රංශ විප්ලවවාදි ධනපති පංතියේ දෘෂ්ටිවාදියෙක් විය.

<u>දෙකාර්ට් (Descartes) රෙනේ</u> (1596-1650) ප්‍රංශ ද්විත්වවාදී දාර්ශනිකයෙක්, ගණිත විද්‍යාඥයෙක් සහ ස්වභාවවාදියෙක් විය.

<u>නැපෝලියන් 1 බොනපාට්</u> (1769-1821) ප්‍රංශයේ (1804-1814 හා 1815) අධිරාජ්‍යයා විය.

<u>නැපෝලියන් III (ලුවී බොනපාට්)</u> (1808-1873) නැපෝලියන්ගේ බෑනා හා (1852-1870) ප්‍රංශ අධිරාජ්‍යයා විය.

<u>නිව්ටන් (Newton) අයිසැක්</u> (642-1727) ඉංග්‍රීසි භෞතික විද්‍යාඥයෙක්, තාරකා ශාස්ත්‍රඥයෙක්, ගණිත විද්‍යාඥයෙක් විය. ඔහු මුල් යාන්ත්‍රික විද්‍යාවේ ආරම්භකයා විය.

<u>ෆූරියේ (Fourier) ෂාර්ල්</u> (1772-1837) ප්‍රංශ මනෝරාජික සමාජවාදියෙක් විය.

<u>ෆොස්ටර් (Foster) විලියම් එඩ්වඩ්</u> (1818-1886) බ්‍රිතාන්‍ය කර්මාන්තකරුවෙක් සහ ලිබරල් දේශපාලඥයෙක් විය. පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් සහ අයර්ලන්තයේ (1880-1882) මහ ලේකම් විය. ඔහු ජාතික විමුක්ති ව්‍යාපාරය අනුකම්පා විරහිතව මර්ධනය කිරීමේ ප්‍රතිපත්තියක් අනුගමනය කළේය.

ප්‍රීස්ට්ලි (Priestly) ජෝසප් (1733-1804) සුප්‍රසිද්ධ ඉංග්‍රීසි රසායන විද්‍යාඥයෙකි. ද්‍රව්‍යවාදී දාර්ශනිකයෙක් හා ප්‍රගතිගාමී සමාජ සේවකයෙකි.

ප්රුදෝන් (Proudhon), පියෙර් ජෝසප් (1809-1865) ප්‍රංශ අර්ථ සාස්ත්‍රඥයෙක්, සමාජ විද්‍යාඥයෙක් හා සුළු ධනපති පංතියේ දෘෂ්ඨිවාදියෙක් විය. අරාජිකවාදයේ ආරම්භකයෙක් විය.

ප්‍රෙඩ්රික් විලියම් III (1770-1840) ප්රෑසියාවේ (1797-1840) රජ

බක්ලන්ඩ් (Buckland) විලියම් (1784-1856) ඉංග්‍රීසි භූගර්භ විද්‍යාඥයෙක් සහ පාදිලිවරයෙක් විය. ඔහු භූගර්භ විද්‍යාවේ සොයාගැනීම් බයිබල් කතා සමග ගැලපීමට උත්සාහ කළේය.

බාබේෆ් (Babeuf), ග්‍රාක්හුස් සැබෑ නම - ප්‍රොන්ස්වා නොයෙල් (1760-1797) ප්‍රංශ විප්ලවවාදියෙක්, සමානත්මතාවාදී මනෝරාජික කොමියුනිස්ට් වාදයේ ප්‍රමුඛ ප්‍රචාරකයා විය.

බිස්මාක් (Bismarack) ඕතෝ (1815-1898) ප්රෑසියාන් රාජ්‍ය ආණ්ඩුවාදී පාලකයෙක් විය. 1871-1890 කාලයේ ජර්මන් අධිරාජ්‍යයේ චින්සලර් වරයා ද (1878) සමාජවාදයට විරුද්ධ නීතියේ කතෘවරයාද විය.

බේකන් (Bacon) ප්‍රැන්සිස් (1561-1626) ඉංග්‍රීසි දර්ශනවාදියෙක්, ස්වභාව විද්‍යාඥයෙක් හා ඉතිහාසඥයෙක්ද, ඉංග්‍රීසි ද්‍රව්‍යවාදයේ නිර්මාතෘවරයාද විය.

බේමෙ (Bohme) යාකෝබ් (1575-1624) ජර්මන් කර්මාන්ත ශිල්පියෙක් සහ ගුඩ දර්ශනවාදියෙක් විය.

බොලිංබ්‍රෝක් (Bolingbroke) හෙන්රි (1678-1751) ඉංග්‍රීසි රාජ්‍ය පාලකයෙක්, ටෝරි නියකයෙක් සහ දේවවාදී දර්ශනවාදියෙක් විය.

බ්‍රයිට් (Bright) ජෝන් (1811-1899) ඉංග්‍රීසි කර්මාන්තකරුවෙක් විය. ඔහු ධනපති දේශපාලඥයෙක්, නිදහස් වෙළදාම් පක්ෂවාදියෙක් වූ අතර, කොබ්ඩන් හා සමග ධාන්‍ය නීතිවිරෝධී සංගමයට නායකත්වය දුන්නේය.

බ්‍රෙන්ටානෝ (Brentano) ලුයෝ (1844-1931) සාමාන්‍ය ජර්මන් අරථ ශාස්ත්‍රඥයෙක් සහ කතේදර් - සමාජවාදයේ (පුටුවේ සමාජවාදයේ) ප්‍රමුඛ ප්‍රචාරකයා විය.

මාක්ස් (Marx) කාල් (1818-1883)

මාබ්ලි (Mably), ගේබ්‍රියෙල් (1709-1785) ප්‍රංශ සමාජ විද්‍යාඥයෙක් විය. ඔහු සමානාත්මතා මනෝරාජික කොමියුනිස්ට් වාදය ගෙනහැර පෑවේය.

මැටර්නික් (Metternich), ක්ලේමන්ස් (1773-1859) ඔස්ත්‍රියානු රාජ්‍ය පාලකයෙක් සහ රාජ්‍යතාන්ත්‍රඥයෙක් විය. (1809-1821) විදේශ ඇමතිවරයාද (1821-1848) චාන්සලර්වරයාද විය.

මැනර්ස් (manners) ජෝන් (1818-1906) ඉංග්‍රීසි කොන්සර්වටිව් රාජ්‍ය පාලකයෙක් විය. කොන්සර්වටිව් ආණ්ඩුවල ඇමතිකම් කීපයක් දැරුවේය.

මෑන්ටල් (Mantell), ජිඩියෙන් ඔල්ජර්නන් (1790-1852) ඉංග්‍රීසි භූගර්භ විද්‍යාඥයෙක් සහ පාෂාණීධාතු විද්‍යාඥයෙක් විය. ඔහු ස්වකීය විද්‍යාත්මක සොයාගැනීම් සමග බයිබල් කතා ගැලැප්පීමට උත්සාහ කළේය.

මූඩි (Moody), ඩ්වයිට් (1837-1899) ඇමරිකානු ප්‍රොතෙස්තන්ත්‍ර පල්ලියේ අයෙක් හා දේශකයෙක් විය. ඔහු "පුනර්ජීවන ව්‍යාපාරයේ" සංවිධායකයෙක් විය.

මුන්සර් (Munzer), තොමස් (1490 පමණ - 1525) ප්‍රොතෙස්තන්ත ප්‍රතිසංස්කරණය හා 1522 ගොවි යුද්ධය සමයේ සාමාන්‍ය ගොවිජන කදවුරේ නායකයෙක් සහ දෘෂ්ටිවාදියෙක් විය. ඔහු සමානාත්මතා මනෝරාජික කොමියුනිස්ට් අදහස් දේශනා කළේය.

මොරෙල්ලි (Morelly), (18 වැනි ශතවර්ෂය) ප්‍රංශයේ සමානාත්මතා මනෝරාජික කොමියුනිස්ට් වාදයේ ප්‍රධාන ප්‍රචාරකයෙක් විය.

රූසෝ (Rousseau), ජාන්-ජක් (1712-1778) ප්‍රංශ ප්‍රබුද්ධ බුද්ධිමතෙක් සහ ප්‍රජාතන්ත්‍රවාදියෙක් ද, ප්‍රංශ විප්ලවවාදී සුළු ධනේශ්වර පංතියේ දෘෂ්ටිවාදියෙක් විය.

ලාෆාර්ග් (Lafargue), පෝල් (1842-1911) ප්‍රංශ සහ ජාත්‍යන්තර කම්කරු ව්‍යාපාරයේ ප්‍රමුඛ නායකයෙක් විය. ඔහු ප්‍රංශ කම්කරු පක්ෂයේ ආරම්භකයෙක්ද, මාක්ස්වාදයේ විශිෂ්ට ප්‍රචාරකයෙක්ද, මක්ස් සහ එංගල්ස් සහචරයෙක් හා අනුගාමිකයෙක්ද විය.

ලාප්ලාස් (Laplace), පියෙර් සිමොන් (1749-1827) ප්‍රංශ තාරකා ශාස්ත්‍රඥයෙක්, ගණිත විද්‍යාඥයෙක් සහ භෞතික විද්‍යාඥයෙක් විය. කාන්ට් හා සම්බන්ධයක් නොමැතිව ස්වාධීන ලෙස, සූර්ය මණ්ඩලයේ ආරම්භය පිළිබඳ න්‍යාය වර්ධනය කර එයට ගණිතමය පදනමක් දැම්මේය.

ලින්නේ (Linne), කාල් (1707-1778) ස්වීඩන් ස්වභාවවාදියෙක් විය. ඔහු පැලෑටි සහ සත්වයන් වර්ග කිරීමේ ක්‍රමයක් සොයා ගත්තේය.

ලුවී පිලිප් (1773-1850) ප්‍රංශයේ (1830-1848) රජ

ලුවී බොනපාට් - නිපෝලියන් III බලන්න

ලූතර් (Lutter), මාටින් (1483-1546) රෙපරමාදු ප්‍රටිසංස්කරණයේ සම්භාවනීය නායකයා සහ ජර්මනියේ ප්‍රොතෙස්තන්ත ව්‍යාපාරයේ (ලූතර්වාදයේ) ආරම්භකයා විය. ඔහු ජර්මන් නාගරිකයන්ගේ දෘෂ්ටිවාදියා වූ අතර 1525 ගොවිජන යුද්ධයේදී කැරලිකාර ගොවීන්ට හා දුප්පත් නගර වැසියන්ට විරුද්ධව නයිට්වරුන්ගේ පැත්ත ගෙන ඉදිරිපත් විය.

ලොක් (Locke), ජෝන් (1632-1704) ඉංග්‍රීසි ද්විත්වවාදී දාර්ශනිකයෙක් විය. ඔහු ප්‍රජානනය පිළිබඳ සංවේදනාවාදී න්‍යාය ඉදිරිපත් කළේය.

වට් (Watt), ජේම්ස් (1736-1819) වාෂ්ප යන්ත්‍රය සොයාගත් ඉංග්‍රීසි නිර්මාණකයා.

වයිට්ලිං (Weitling) විල්හෙල්ම් (1808-1871) ජර්මන් කම්කරු පංති ව්‍යාපාරයේ සමාරම්භයේදී එහි ප්‍රමුඛ නායකයෙක් විය. මනෝරාජිකවාදී සමානාත්මතා කොමියුනිස්ට් වාදයේ න්‍යායාචාරියෙක් විය. වෘත්තියෙන් සන්නාලියෙක් විය.

වික්ටෝරියා (1819-1901) එංගලන්තයේ රැජින

ශාෆ්ටස්බරි (Shaftesbury), ඇන්තනී (1671-1713) ඉංග්‍රීසි දේවවාදී දාර්ශනිකයෙක් විය.

සැන්කි (Sankey), අයිරා ඩේවිඩ් (1840-1908) ඇමරිකානු ප්‍රොතෙස්තන්ත දාර්ශනිකයෙක් සහ "පුනර්ජනන ව්‍යාපාරයේ" සංවිධායකයෙක් විය.

සිකින්ගන් (Sickingen), ෆ්‍රොන්ස් ෆෝන් (1481-1523) ජර්මන් නයිට්වරයෙක් සහ මහාරාජ කුමාරවරුන්ට විරුද්ධව පහළ වංශවතුන් (1522-1523) ගෙනගිය කැරැල්ලේ නායකයා විය.

සෙන්-සිමෝන් (Saint-Simon), අන්රි (1760-1825) ප්‍රංශ මනෝරාජික සමාජවාදියෙක් විය.

ස්ටුවාට්ස් - ස්කෝට්ලන්තය (1371 පටන් හා එංගලන්තය) (1603-1649, 1660-1714) පාලනය කළ රජ පවුල

ස්පිනෝසා (Spinosa), බාරූහ් (බෙනඩික්ට්) (1632-1677) ලන්දේසි ද්‍රව්‍යවාදී දාර්ශනිකයෙක් සහ අදේවවාදියෙක් විය.

හාට්ලි (Hartley), ඩේවිඩ් (1705-1757) ඉංග්‍රීසි වෛද්‍යවරයෙක් සහ ද්‍රව්‍යවාදී දාර්ශනිකයෙක් විය.

හෙන්රි VII (1457-1509) එංගලන්තයේ (1485-1509) රජු

හෙන්රි VIII (1491-1547) එංගලන්තයේ (1509-1547) රජු

හේගල් (Hegel), විල්හෙල්ම් ෆ්‍රෙඩ්රික් (1770-1831) ජර්මන් දාර්ශනිකයෙක් හා වාස්තවික විඥ්ඥානවාදියෙක් විය. ඔහු විඥ්ඥානවාදී දයලෙක්තික ක්‍රමය පැහැදිළි කිරීමෙන් දර්ශනවාදයට සේවයක් කළේය. එය දයලෙක්තික ද්‍රව්‍යවාදයේ න්‍යායික මූලාශ්‍රය විය.

හෙරක්ලීටස්, ඉපීසියස්හි (ක්‍රි:පූ: 540 පමණ - 480 පමණ) පුරාණ ග්‍රීක දාර්ශනිකයෙක් සහ දයලෙක්තික වාදියෙක් විය.

හෝබ්ස් (Hobbes), තොමස් (1588-1679) ඉංග්‍රීසි දර්ශනවාදියෙක් විය. ඔහු යාන්ත්‍රික දර්ශනවාදය ගෙනහැර පෑවේය. ඔහුගේ සමාජ දේශපාලන අදහස් තුළ බලවත් ප්‍රජාතන්ත්‍ර විරෝධී ප්‍රවනතාවයන් දක්නා ලදී.